# ධරණීය සංවර්ධනය

## රියෝ සිට ජොහැන්නස්බර්ග් දක්වා

පාරිසරික සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

ප්‍රථම පාරිසරික ක්‍රියාත්මක ව්‍යාපෘතියේ (EA-1-P) අනුග්‍රහයෙනි

# ධරණීය සංවර්ධනය

## රියෝ සිට ජොහැන්නස්බර්ග් දක්වා

පාරිසරික සහ ස්වභාවික සම්පත් අමාත්‍යංශය

ප්‍රථම පාරිසරික ක්‍රියාත්මක ව්‍යාපෘතියේ (EA-1-P) අනුග්‍රහයෙනි

# පටුන


| | | |
|---|---|---|
| වරම් දෙවමු මිහිතලයේ පැවැත්මට | - | |
| **ගරු රුක්මන් සේනානායක**<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා<br>ජොහැන්නස්බර්ග් සමුළුව අමතා කළ දේශනය | | |
| පෙරවදන | - | **කොසපාල හේවගේ**<br>ලේකම්, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| පිවිසුම | - | **මහාචාර්ය විමල් දිසානායක**<br>හවායි විශ්ව විද්‍යාලය. |
| ● **ධරණීය සංවර්ධනය** | - | **සුනිල් සරත් පෙරේරා**<br>අතිරේක ලේකම්<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| ● **රියෝ සමුළුව.** | - | |
| පියවරෙන් පියවර. | - | |
| රියෝ ප්‍රකාශනය | - | |
| 21 න්‍යාය පත්‍රය ආයාචනයක් | - | **මහාචාර්ය සී. බී. දිසානායක**<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය. |
| ● **ජොහැන්නස්බර්ග් සමුළුව - පූර්විකාව** | - | |
| ජොහැන්නස්බර්ග් - සම්පිණ්ඩිත වාර්තාවක් | - | **ආචාර්ය ඩබ්ලිව්. එල්. සුමතිපාල**<br>සම්බන්ධීකාරක මොන්ට්‍රියල් සන්ධාන ඒකකය |
| ජොහැන්නස්බර්ග් - සමාලෝචනය | - | **ආචාර්ය බී. එම්. එස්. බටගොඩ**<br>අධ්‍යක්ෂ - ගෝලීයක්‍රම හා පරිසර ආර්ථික කටයුතු |
| ජොහැන්නස්බර්ග් සමුළුවෙන් ශ්‍රී ලංකාවට සලසා ගතහැකි සෙත | - | **කොසපාල හේවගේ**<br>ලේකම්, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| ජොහැන්නස්බර්ග් සමුළුව ප්‍රකාශනය | - | |
| ජොහැන්නස්බර්ග් දේශපාලනමය ප්‍රකාශනය | - | |
| ● **ජොහැන්නස්බර්ග් සමුළු වනවිට පැවති පරිසර තත්ත්වයන් කිපයක විමර්ශණයක්** | - | |
| ගෝලීය කරණය (දියතුරාව) | - | **සුනිල් සරත් පෙරේරා**<br>අතිරේක ලේකම්,<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| ජලය | - | |
| කෘෂිකාර්මික ඵලදායිතාව | - | |
| ගෝලීය ජෛව විවිධත්වය 1992 - 2002 | - | **ගාමිණී ගමගේ**<br>අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව) |

# ධරණීය සංවර්ධනය

## රියෝ සිට ජොහැන්නස්බර්ග් දක්වා

| | | |
|---|---|---|
| උපදේශක සභාව | : | **රුක්මන් සේනානායක මැතිතුමා,**<br>ගරු පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍ය |
| | | **ඉන්දික බණ්ඩාරනායක මැතිතුමා,**<br>ගරු පරිසර හා ස්වභාවික සම්පත් නියෝජ්‍ය අමාත්‍ය |
| | | **තොසපාල හේවගේ**<br>ලේකම්, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| | | **ඩබ්. ආර්. එම්. එස්. වික්‍රමසිංහ**<br>අතිරේක ලේකම්, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| | | **ආචාර්ය බී. එම්. එස්. බටගොඩ**<br>අධ්‍යක්ෂ - ගෝලීය කටයුතු හා පරිසර ආර්ථික කටයුතු<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| | | **ගාමිණී ගමගේ**<br>අධ්‍යක්ෂ - ජෛව විවිධත්ව<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| | | **ආචාර්ය ඩබ්ලිව්. එල්. සුමතිපාල**<br>සම්බන්ධීකාරක, මොන්ට්‍රියල් සන්ධාන ඒකකය<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| සංස්කාරක | : | **සුනිල් සරත් පෙරේරා**<br>අතිරේක ලේකම්<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| සංස්කරණ සහය | : | **සැනෝපි රුවිනිකා පෙරේරා**<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| අනුග්‍රහය | : | **ප්‍රථම පාරිසරික ක්‍රියාත්මක ව්‍යාපෘතිය** |


| | | |
|---|---|---|
| ප්‍රකාශනය | : | **පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය** |
| මුද්‍රණය | : | **සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ** |
| ISBN අංකය | : | 955 - 9120 - 15 - X |

# වරම් දෙවමු මිහිතලයේ පැවැත්මට

**2002 අගෝස්තු 25 වන දා සිට සැප්තැම්බර් 4 වනදා දක්වා දකුණු අප්‍රිකාවේ පැවැති ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවෙහි දී, ශ්‍රී ලංකාවේ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ඇමති ගරු රුක්මන් සේනානායක මහතා කළ ප්‍රකාශය**



***උතුමාණන්වරුනි, සම්භාවනීය නියෝජිතවරුනි, නෝනාවරුනි, මහත්වරුනි***

සභාපතිතුමනි, ධරණීය සංවර්ධනය පිළිබඳ මේ අසමසම ලෝක සමුළුවේ සාකච්ඡාවල සාර්ථකත්වය පතා ශ්‍රී ලංකාවේ ජනාධිපති, අගමැති සහ ජනතාව එවන සුභ පැතුම් සහ ආශිංසන ඔබට සහ මේ සම්භාවනීය සභාවට පිදීමට මට පළමුකොට අවසර දෙන්න.

සභාපතිතුමනි, මගේ රටට උදාර ඉතිහාසයක් සහ පැරැණි ශිෂ්ඨාචාරයක් ඇත. අපේ පැරණි ගොවි සමාජයෙහි, අපේ මුතුන් මිත්තෝ ස්වභාවධර්මය සමග එකඟතාවෙන් ජීවත්වූහ. වසර දෙදහස් පන්සියයකට වැඩි කාලයක් සඑලවූ අසාහාය දෘඩ ශිෂ්ඨාචාරයක් අපේ මුතුන්මිත්තන් ස්වාභාවික සම්පත් පරිහරණයේදී පරිසර සමතුලනය පැවැත්වූ බවට මැනවින් සාක්ෂි දරයි.

ධරණීය සංවර්ධනය ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවේ. එය අපේ සංස්කෘතියේ, සම්ප්‍රදායයන් සහ සාරධර්මවල ගැඹුරට මුල්බැස තිබේ. සංවර්ධනය උදෙසා අපේ ප්‍රයත්නයේදී මගේ රට හැම විටම

සීමාන්තිකවීමෙන් වැළකී ඇත. ශ්‍රී ලංකාවට හිමි මැද පිළිවෙත ඔස්සේ දියුණු, සමෘද්ධිමත්, සාධාරණ සහ පාරිසරිකව ස්ථාවර ජාතියක් වීම දැරිය හැකි සංවර්ධනය පිළිබඳ අපේ දෘෂ්ටියයි.

රියෝ මිහිතල සමුළුව අප තවදුරටත් ක්‍රියාත්මකවීම සඳහා ප්‍රබෝධමත් කළා පමණක් නොව, ධරණීය සංවර්ධනය පිළිබඳ කාලය විසින් ස්ථිර කරන ලද ප්‍රතිපත්ති යොදා ගැනීමට අපේ අධිෂ්ඨානය තවත් ශක්තිමත් කර සුරක්ෂිත ද කැරිණ. රියෝ සමුළුවට බොහෝ කලකට ඉහත අපේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිසරය සුරැකීමේ සංකල්පයට නීතිමය වලංගුතාව සැපැයී ය. රටේ සියලු පාරිසරික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයට ආයතනික සහ නීතිමය උපකාරක බිහිකළ ජාතික පාරිසරික පනතක් සම්මත කරගතිමු. ඊට වසර කීපයකට පසු ජාතික සංරක්ෂණ උපාමාර්ගයක් සැකැසිණ. කෙසේ වෙතත් රියෝ සමුළුවෙන් පසු 21 වන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිණිස මගේ රට වැදගත් පියවර කීපයක් ගෙන ඇත. මෙය අපේ ජාතික වගකීම ඉටු කිරීමට ය. රියෝ ප්‍රතිපත්ති මත පිහිටා අන්තර්ජාතික ප්‍රජාව කෙරෙහි අපේ ජාතික බැඳීම තහවුරු කිරීමට අපි උත්සාහ දරා ඇත්තෙමු.

දේශගුණ විපර්යාස, ජෛව විවිධත්වය, බේසල් සහ කාන්තාරබවට පත්වීම ඇතුළු සියලු ප්‍රධාන අන්තර් ජාතික සම්මුති සහ කෙටුම්පත් ශ්‍රී ලංකාව ස්ථිරකර තිබේ. කියොතෝ කෙටුම්පත ද නුදුරු අනාගතයේදී අනුමත කරනු ඇත. රියෝ සිද්ධාන්ත මත පිහිටා අපි නව ජාතික පරිසර ප්‍රතිපත්තියක් සකස් කෙළෙමු. නීති සැලැස්ම ශක්තිමත් කිරීමට දැන් පවත්නා පරිසර නීතිය වෙනුවට නව නීතියක් සැකසෙමින් පවතී. මේ වකවානුව තුළ පරිසරය සුරැකීමට සම්පාදනය වූ ප්‍රතිපත්ති සහ වැඩසටහන්, නිසි දැකීමක් ඇති දේශපාලන නායකත්වය නිසා බිහි වීම ගැන අපි ආඩම්බර වෙමු. එය සමාහිතික සහ ද්විපාක්ෂික ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාදාමයක් විය. මේ ප්‍රතිපත්ති වලින් වැඩි කොටසක් සම්මත කලේ රට සංවර්ධන මාවතේ බැරෑරුම් හරියක් ඥමින්, බරපතල සමාජ සහ ආර්ථික දුෂ්කරතා විඳිමින් සිටියදී ය. කෙසේ වෙතත් මේ ගැටලුවලට දිරිමත් ව සහ අදිටනින් යුතුව මුහුණ දීමට අපට හැකි විය. මේ අවස්ථා සම්බන්ධය තුළ සිටය ජාතික න්‍යාය පත්‍රය, ජාතික සමගිය, දිළිඳුකම අඩුකිරීම්, ආර්ථික සංවර්ධනය සහ පරිසරය සුරැකීම ප්‍රමුඛතා ලෙස හඳුනාගත්තේ.

මේ ක්‍රියාදාමයට සම්බන්ධ සිවිල් සමාජය, රජය සහ පෞද්ගලික අංශය ප්‍රධාන ක්‍රියාකාරීන් ලෙස ක්‍රියාකාරීව සහභාගි කරවා ගැනීමෙන් දැරියහැකි සංවර්ධනය ඉටුකරගත හැකි ලෙස අපි දකිමු. දැරියහැකි සංවර්ධනය පිළිබඳ ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාත්මත කිරීමට අතීතයෙන් ආනුභාවය උකහා ගෙන ප්‍රශ්න සහ ක්‍රමෝපායයන් ගැන දැනුවත් කිරීමට මූලික මට්ටමේ සම්බන්ධතා යොදාගතිමු. එබඳු ක්‍රියාදාමයක වඩා පුළුල් සහභාගිත්වයක් ඇති කොටස්කරුවන් ලෙස ජනතාවගේ සම්බන්ධ වීම ඉටුවනු ඇත යනු අපේ දැඩි විශ්වාසයයි. මූලික මට්ටමේ ජන සමූහවලට දැරියහැකි සංවර්ධනයේ නියම කොටස්කරුවන් වී කාර්ය සාධකව සංවර්ධනයට රුකුල් දිය හැකි වනු ඇත.

ශ්‍රී ලංකාව දකුණු ආසියා පෙදෙසේ පිහිටි දූපතක් බව දනිමු. එය ලොවේ ජනගහණයෙන් සියේට දාසයකගේ මව්බිමයි. ප්‍රාදේශීය සහයෝගතා මාර්ගය අනුගමනය කිරීම අපේ යුතුකම බව අපි දැනුවත්ව සිටිමු. අප ගෝලීය වගකීමෙන් බැඳුණු ගෝලීය ජන සමූහයක සාමාජිකයන් ලෙස මෙහි පැමිණ සිටින්නේ මේ ලොව නියත විනාශය කරා යන ගමන වැළැක්වීමට මාර්ග සහ ක්‍රම සොයා ගැනීමට ය. ගෝලීය වගකීමට දායකවීමේ දී අප කාටත් ජාතික කලාපීය සහ ගෝලීය වශයෙන් ප්‍රධාන කාර්යයක් ඉටුකිරීමට තිබේ. පරිසරය රැකගැනීමේ අරගලයේ දී අපට තරඟකාරීන් මෙන් ක්‍රියාකළ නොහැකිය. මේ උත්සාහයේ දී අපට උපකාර වන්නේ මිතුරුකම පමණයි. මහ බලවතාටත් ඉතා දුබලයාටත් එක ලෙසම තනිවම ජීවත්විය නොහැක.

# පෙරවදන

පරිසරය සහ පරිසරය ආශ්‍රිතව පැන නගින ප්‍රශ්න පිළිබඳව මුළු ලොවම අද දැඩි උනන්දුවක් දක්වයි. මෙම උනන්දුව නිසාම ඇතිවූ දැනුම් සම්භාරයක්ද ලොව පුරා ව්‍යාප්ත වෙමින් පවතී.

මෙම විශ්ව දැනුම ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ගුරුවරුන්ට මෙන්ම පාසල් සිසුන්ටද එකසේ වැදගත්වෙයි.

'ධරණීය සංවර්ධනය' යන්න සංවර්ධනයේදී අද බහුලව යෙදෙන වදනකි. 'ධරණීය සංවර්ධනය සංකල්පයට අනුව මතුවී ඇති සංවර්ධන ක්‍රියාවලිය මෙන්ම මානව ඉතිහාසයේ ඉතා වැදගත් අවස්ථා දෙකක් වන රියෝ සමුළුව මෙන්ම (පරිසරය හා සංවර්ධනය පිළිබඳ මිහිතල සමුළුව - 1992) 2002 දකුණු අප්‍රිකාවේ පැවති ධරණීය සංවර්ධනය පිළිබඳ සමුළුව පිළිබඳවද ඉදිරිපත් කරන කරුණු මෙරට පාඨකයින්ට ඉතා වැදගත් වනු නොඅනුමානය.

පරිසර පරිහානිය ජීවිතයේ ගුණාත්මක භාවයට සෘජුවම බලපාන්නකි. එමෙන්ම සංවර්ධනයද අප නිතර මෙනෙහි කළ යුතු කරුණකි. 'ධරණීය සංවර්ධන' සංකල්පයෙන් මතු වන්නේ අනාගත පරපුරට සම්පත් පරිහරණයට ඉඩ සලසමින් සංවර්ධනය කල හැකි ක්‍රියාවලිය පෙන්නුම් කිරීමකි.

මෙම සංවර්ධන රීතියට අනුගත මූලික කරුණු සාකච්ඡා කරන මෙම ග්‍රන්ථය පරිසර සාහිත්‍යයක් ගොඩනැගීමට කටයුතු කෙරෙන අවස්ථාවක ඉතා වැදගත් ප්‍රයත්නයක් වශයෙන් සැලකිය හැකිය.

**තොසපාල හේවගේ**
ලේකම්
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

# පිවිසුම

**මහාචාර්ය විමල් දිසානායක**
හවායි විශ්ව විද්‍යාලය

ධරණීය සංවර්ධනය යන්න අද විවිධ සංකථනයන්හි බහුල ලෙස හමුවන උක්තියකි. මෙම යෙදුම ආර්ථික විද්‍යාඥයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, දේශපාලකයන්, සංවරධනවේදීන් අතර පමණක් නොව සාමාන්‍ය පුරවැසියන් අතර ද ප්‍රචලිත වෙමින් පවතී. ධරණීය සංවර්ධනය යන සංකල්පය නිසා සංවර්ධනයෙහි අරමුණු, එහි විශේෂතා ප්‍රතිවේක්ෂණය කිරීමට බොහෝ දෙනා පෙළඹුණාහ. ධරණීය සංවර්ධනය නමැති සංකල්පයෙහි විශේෂත්වයත්, එය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවල ගන්නා ලද වැදගත් තීරණත්, සාමාන්‍ය පාඨකයාට පහසුවෙන් වටහා ගත හැකි අයුරින් ඉදිරිපත් කිරීම ධරණීය සංවර්ධනය රියෝ සිට ජොහැන්නස්බර්ග් දක්වා ග්‍රන්ථයේ අභිප්‍රායයි. මෙම ග්‍රන්ථය සාවධානව කියවන පාඨකයන්ට යට සඳහන් කරන ලද කරුණ මැනවින් පැහැදිලි වනු ඇත.

සංවර්ධනය පිළිබඳ ප්‍රධාන ආකෘති පහක් හඳුනා ගත හැකිය. ඉන් පළමු වැන්න ධනවාදි ආකෘතියයි. ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල් ගුරුකොට ගනිමින් සීඝ්‍ර කාර්මීකරණය, මහා පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම වැනි ප්‍රයත්නයන්ට මුල් තැනක් දෙමින් ධනවාදී රටවල් ගමන් කළ පථය ඔස්සේ ගමන් කිරීමට අනුබල දීම මෙම ආකෘතියෙහි මුඛ්‍ය ලක්ෂණයයි. දෙවැන්න සමාජවාදි ආකෘතියයි. සෝවියට් රුසියාව, මහජන චීනය වැනි රටවල පැවතියේ මෙම ආකෘතියයි. එහෙත් සෝවියට් දේශයෙහි බිඳ වැටීමත්, මහජන චීනය විවෘත ආර්ථිකයක් කෙරෙහි සිත් සතන් යොමු කිරීමත් සමඟ සමාජවාදී ආකෘතිය බොහෝ දුරට ප්‍රතිශංස්කරණයට භාජනය වී ඇත.

තුන් වැන්න ප්‍රායෝගික ආකෘතියකට වඩා විචාරාත්මක ආකෘතියකි. මෙම ආකෘතිය ලෝක පද්ධතිය, ගෝලීයකරණය වැනි සංකල්ප පාදක කොට ගෙන නිර්මිත වූවකි. පහළොස් වැනි සියවසට පමණ පසු අනුක්‍රමයෙන් ලෝකය එකම පද්ධතියකට පරිවර්තනය වූ ආකාරයත් එය සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරයත් මෙම ආකෘතියෙන් පෙන්නුම් කෙරෙයි.

සතර වැන්න, ක්ෂුද්‍රත්වය සුන්දරත්වයය යන අදහස මුල්කොටගෙන බිහි වූවකි විශ්ව ව්‍යාප්ත ප්‍රවණතා හා ප්‍රපංච වෙනුවට දේශීය හා ප්‍රාදේශීය අවශ්‍යතා කෙරෙහි මෙම ආකෘතියෙන් අවධානය යොමු කෙරෙයි. ජාතික ස්වාධීනත්වය සුඛ සාධනය යන සංකල්ප මත ගොඩනැගුනු යථෝක්ත ආකෘතිය දේශීයත්වය මුල්තන්හිලා සලකයි. පස්වැන්න, පශ්චාත් නව්‍යවාදය ගුරු කොට ගෙන පහල වූවකි. සංවර්ධනය යනු කෙබඳු සංකල්පනයක් ද? සංවර්ධනය නිර්වචනය කිරීමේ බලය ඇත්තේ කා හටද? සංවර්ධනය හා බලය අතර ඇත්තේ කවර සම්බන්ධයක් ද? සංවර්ධනය පිළිබඳ ආඛ්‍යාන සකස් වන්නේ කෙලෙසද? මෙවැනි ප්‍රශ්න කෙරෙහි පස්වැනි ආකෘති අගය කරන්නෝ අවධානය යොමු කරති.

ධරණීය සංවර්ධනය යන සංකල්පයෙහි වැදගත්කම වටහා ගැනීමට යට සඳහන් කරන ලද සංවර්ධන ආකෘති කෙරෙහි අපගේ සැලකිල්ල යොමු කළ යුතුය. සතර වැනි ආකෘතියෙහි බලපෑම මෙම සංකල්පයෙහි සටහන්ව ඇත. ධරණීය සංවර්ධනය, සංවර්ධන සංකල්පයෙහි බහුත්වය අවධාරණය කරන්නකි. එය අන්‍යෝන්‍ය ප්‍රතිපක්ෂ ප්‍රපංචගණනාවක් අතර සමතුලිත භාවයක් ඇති කිරීමට වෑයම් කරයි. භෞතික සංවර්ධනය හා අධ්‍යාත්මික සංවර්ධනය, දේශීයත්වය හා සර්වදේශිකත්වය, සංවර්ධනය පිළිබඳ පොදු ප්‍රමිති හා එක් එක් රටකට ගැලපෙන ප්‍රමිති සම්ප්‍රදාය හා නවීනත්වයට සඳහන් කරන ලද පරස්පර ප්‍රතිපක්ෂ උද්භූතීන් අතර මුල් තැනක් ගනියි.

**ධරණීය සංවර්ධනය රියෝ සිට ජොහැන්නස්බර්ග් දක්වා** නමැති මෙම ග්‍රන්ථය රචනා කිරීමෙන් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය සිදුකොට ඇත්තේ වැදගත් ශාස්ත්‍රීය සේවාවකි. ධරණීය සංවර්ධනය හා සම්බන්ධ අංශ ගණනාවක් කෙරෙහි ආලෝක ධාරාවක් යොමු කිරීමට මෙම කෘතිය සමත් වේ. එමෙන්ම ඓතිහාසික රියෝ සමුළුවේ සිට දකුණු ආප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවර දක්වා ලෝකය අනුගමනය කල ක්‍රියාවලිය පැහැදිලි කරන්නක් ද වෙයි.

# ධරණීය සංවර්ධනය
# Sustainable Development

**සුනිල් සරත් පෙරේරා**
අතිරේක ලේකම්, පරිසර හා සවභාවික සම්පත් අමාත්‍යාංශය.

"ධරණීය සංවර්ධනය" Sustainable Development යන යෙදුම පසුගිය දශක දෙකක පමණ කාලය තුළ ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූවකි. නූතන ලෝකයේ "සංවර්ධනය" යන වදන තනිව භාවිත නොවේ. එය දැන් ඔරොත්තු දෙන විශේෂණ පදය හා ඈඳ භාවිතා කෙරෙයි, ධරණීය සංවර්ධන නව සමාජ හා ආර්ථික ප්‍රවනතාවක්ද පිළිබිඹු කරයි. ධරණීය සංවර්ධනය යන සංකල්පය නව ලෝකයක ආර්ථික හා න්‍යායාත්මක මග පෙන්වීමක් වශයෙන්ද සැලකිය හැකිය. අනාගත පරපුරේ අවශ්‍යතාවන්ට හා තෘප්තිමත් භාවයට බාධා නොවන පරිදි වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටුකර ගැනීම ධරණීය සංවර්ධන සංකල්පයේ මූලික හරය ලෙස සරලව දැක්විය හැකිය. සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමේ "අපේ පොදු අනාගතය" නම් වූ වාර්තාවේ තේමාවට ද මෙය මනාව ගැලපෙනු ඇත.

සමාජ - ආර්ථික සංවර්ධනය හා බැඳුණු පාරිසරික සංරක්ෂණය වෙසෙසින් මෙම සංකල්පය ඇසුරෙන් විවරණය කෙරෙයි. ධරණීය සංවර්ධන සංකල්පයේ මූල බීජවට 1970 දශකයේ මුලදී රෝපණය වූවාසේ සැලකෙයි. එසේ වුවද මෙය තවදුරටත් පෝෂණය වී සංකල්පික න්‍යායක් බවට පත් වූයේ 1980 ගණන් වලදීය. 1992 බ්‍රසීලයේ රියෝ නුවර මුළුදුන් ඓතිහාසික සමුළුවත් සමගම මෙය සංවර්ධන උපාය මාර්ගයක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලියක ස්වරූපයද ගැණුනි.

ධරණීය සංවර්ධනය පිළිබඳ දර්ශනය ලොව පුරා නව ඥානාලෝකයක් දැල්වීමටද හේතුවී ඇත.

මෙතෙක් පැවති ගතානුගතික චින්තනයෙන් මිදී නව දෘෂ්ටි කෝණයකින් පරිසරය හ සංවර්ධනය දෙස බැලීමට මෙමගින් පෙළඹවීමක් කෙරෙයි.

සංවර්ධනය නාමයෙන් අධික ලෙස ස්වභාවික සම්පත නෙලා ගැනීම සඳහා මෑත මිනිසා පෙළඹුණේ කාර්මික විප්ලවයේ හා නවීකරණයේද බලපෑමෙනි. එසේ වුවද අසමතුලිත සමාජ ආර්ථික තත්ත්වයට පෙර මිනිසාගේ ජීවන ශෛලිය ස්වභාවයෙන්ම දරාගත හැකි සංවර්ධන සංකල්පය හා නිරතුරුවම බද්ධ වූවක් විය.

පරිසරයට හානි පමුණුවමින් අත්කරගනු ලබන සංවර්ධනය දිගුකාලීනව පවත්වාගෙන යා නොහැකි බවත්, සංවර්ධනයේ නියම ප්‍රතිලාභ භුක්ති විඳීමට එමගින් බාධා පමුණුවන බවත් පැරැන්නෝ අනාදිමත් කාලයක සිට දැන සිටියහ.

අපේ මුතුන් මිත්තෝ බාගෙන කෑ යුතු වල ඉහගෙන නොකෑහ. එමෙන්ම වර්තමාන දහසක් අවශ්‍යතා වෙනුවෙන් අනාගත අවශ්‍යතා කැප නොකළහ. ජනවහරින් හා වාගාලාප වලින්ද සරල ලෙස මූර්තිමත් කරන්නේ ධරණීය සංවර්ධනය පිළිබඳ සම්ප්‍රදායික ඇබ්බැහිකම් බව පැහැදිලිය.

දේශීය සංස්කෘතිය ධරණීය සාරධර්ම හා බැඳුණු ජීවන රීතියක් හා රිද්මයක් පවත්වාගෙන යෑමට නිරතුරු මඟ පෙන්වීමක් කරයි.

ස්වභාවික සම්පත් භාවිතයට හා සුරක්ෂණයට සාහිත්‍යයික සන්නිවේදනය උපයෝගී කරගත් අවස්ථා ළමා සාහිත්‍යයෙන් හා කවි ගී වලින්ද මතුවෙයි.

අප කොයි කවුරුත් ළමා වියේදී ගායනා කර ඇති පහත සඳහන් ළමා ගීයෙන්ද සංකේතවත් වන්නේ දරාගත හැකි සංවර්ධනය පිළිබඳ අදහසකි.

***මේ ගසේ බොහෝ***
***පැණි දොඩම් තිබේ***
***පැහිලා ඉදිල බිමට නැමිල***
***බරවෙලා අතු***
***නංගිටයි මටයි***
***ගෙඩි දෙකක් ඇති***
***වැඩිය කඩන නරක ළමෝ - හෙම නොවේ අපි***

ධරණීය සංවර්ධනය සබැඳි සංකල්පය නව චින්තන ධාරාවක උල්පතක් බඳුවිය. ධරණීය සංවර්ධනය ආශ්‍රයෙන් ජනිත ප්‍රාඥ භාවය හා ක්‍රියාත්මක භාවය නිසා අනේක විධ පොත පතද අළුතෙන් බිහිවිය මෙය නව සාහිත්‍යික සංස්කෘතියක් ගොඩනැගීමට හේතු වී ඇත. සියළු විද්‍යා හා ශාස්ත්‍ර ප්‍රගුණ කළ විද්වත්හු තම ක්‍ෂෙත්‍ර මෙහි න්‍යායාත්මක ලක්‍ෂණ හා ආකෘතිය තුළට අනුගත කර ගැනීමට උත්සාහ දැරූහ. ධරණීය සංවර්ධනය මුළු ලොවටම බලපාන නව සාරධර්ම පද්ධතියක් හා සංවර්ධන රීතියක්ද මතුකර ඇත.

භාෂාව මානව වර්ගයාට සුවිශේෂ වූ සංසිද්ධියකි. භාෂාව ඥාන වර්ධනයට හේතු වන්නාසේම ඥාන වර්ධනය නිසා භාෂා භාවිතයේද වෙනස්කම් ඇතිවෙයි.

පෙරපර දෙදිග ජීව භාෂාවන්ට මෙන්ම විශ්වකෝෂ හා ශබ්ද කෝෂවලට නව වදන් රූප එක් කිරීමටද ධරණීය සංවර්ධනය හේතු වී තිබේ.

ධරණීය සංවර්ධනය යන වදන් භාවිතය අප විසින් උපයෝගී කරගනු ලබන්නේ සස්ටේනබල් ඩිවෙලොප්මන්ට් (Sustainable Development) යන ඉංග්‍රීසි වදන් වලින් ප්‍රකාශිත දරාගත හැකි සංවර්ධනය යන අර්ථය නිරූපනය කිරීම පිණිසය. මෙම අර්ථයම දැක්වීම සඳහා විවිධ අවස්ථා වලදී "තිරසාර සංවර්ධනය" චිරස්ථායි සංවර්ධනය යන යෙදුම් භාවිතා වෙයි.

එවා ධරණීය සංවර්ධනය යන යෙදුම තරම් අර්ථාන්විත හා විදුහුරු (scientific) වේයයි සිතිය නොහැක.

"දෙරණ" යන්න දරා ගැනීමේ ශක්තිය ඇති වස්තූන්ට භාවිතා වෙයි. මහ පොළවට සියල්ල දරා ගැනීමේ ශක්තිය ඇති නිසා දෙරණ යනුවෙන් හැඳින්වෙයි.

එමෙන්ම දරණුව අප භාවිතා කරන්නේද තවත් වස්තුවක් දරා සිටීම පිණිස බවද පැහැදිලි වෙයි.

නූතන ඉංග්‍රීසි බසටද විදුහුරු වදන් අළුතෙන් එක්කිරීමට ධරණීය සංවර්ධන සංකල්පය බලපෑ අවස්ථා කොතෙකුත් දක්නට ඇත.

sustain-omics (සස්ටේනොමික්ස්) යන සිජ් වදන ඉතා මෑතකදී ඉංග්‍රීසි භාෂා භාවිතයට අළුතෙන් එක්වූ වදනක් ලෙස සැලකෙයි. මෙයින් නිරූපිත අර්ථය වන්නේ ධරණීය අර්ථ ශාස්ත්‍රය යන්නයි. ධරණීය අර්ථ ශාස්ත්‍ර මූලාශ්‍රය හා සම්බන්ධ විෂය ආශ්‍රිතව කාලීන උද්යෝගයක් ලොව පුරා ඇතිව තිබේ. පර්යේෂණ රාශියක්ද කෙරෙමින් පවතී. පරිසර ආර්ථික විද්‍යාවේදී හරිත ගණකාධිකරණයේදී හා සංවර්ධන කාර්යයේදී මෙම වදන මෙන්ම එමගින් නිරූපිත අර්ථයද බහුල වශයෙන් විමර්ශනයට ලක් කෙරයි.

ස්වභාවික සම්පත් වල හා ජෛව විවිධත්වයේද ආර්ථික වටිනාකම ජාතික සැලසුම් සම්පාදනයේදී ඒකාබද්ධ කිරීමේ උත්සාහයක් ලෝපුරා මතුවී තිබේ. හරිත ගිණුම්කරණය (Green Accounting) මෙහිලා සැලකිය යුතු අතුරු ඵලයකි. පාරිසරික ප්‍රගතිය ජාතික ආදායමේ සහ නිෂ්පාදන ගිණුම් තුළට සංයුක්ත කිරීම හරිත ගිණුම් කරනයේ අවශ්‍යතාවක් සේ සැලකිල්ලට ගත හැකිය. හරිත ඵලදායීතා (Green Productivity) සංකල්පයද විමසුමට පාත්‍ර විය යුතු තවත් අංගයකි. දේශානුරූපී සංවර්ධන ආකෘති සකස් කර ගැනීමේදී ජෛව විවිධත්වයෙන් පොහොසත් ශ්‍රී ලංකාව වැනි රටවල් ජෛව විවිධත්වයේ මෙන්ම ස්වභාවික සම්පත්වල ආර්ථික වටිනාකම ගණනය කර තැබීම ධරණීය සංවර්ධනයටම හේතු වන්නකි.

ධරණීය සංවර්ධන ප්‍රවනතාව මෙතෙක් ඇස නොගැසුණු ක්‍ෂෙත්‍ර ඔස්සේ පර්යේෂණ මෙහෙයවීමට විද්‍යාඥයන් උනන්දු කිරීමක්ද කර ඇත. නොනැසී පැවතිය හැකි කෘෂිකර්මයක් (Sustainable Agriculture) ගැන සිතන්නට කෘෂි විද්‍යාඥයන් පෙළඹී ඇත්තේ මෙයට අනුගතවය.

ධරණීය සංවර්ධන සංකථනයේදී මුලසිටම විවාදාත්මක කරුණු මතුවිය. මෙහිදී මතුකල එක් විවරණයක් වූයේ එකම ලෝකයක් සඳහා සංවර්ධන අකෘති දෙකක් තිබීම කොතෙක් දුරට සාධාරණද යන්නයි. බටහිර කාර්මික රටවල් දියුණුවට පත්වී දියුණු වෙමින් පවත්නා රටවලට සවභාවික සම්පත් භාවිතයේදී ධරණීය සංවර්ධනයේ නාමයෙන් වක්‍රාකාර තහංචි පැනවීමක් සිදුවේද යන්න විමසුමට පාත්‍රවූ පළමු කරුණයි.

දෙවැන්න පරිසර හානිය අවම කරගැනීමට නව තාක්‍ෂණය ආදේශ කිරීමට වැය වන අධික පිරිවැය දියුණුවෙමින් පවත්නා රටවලට දරාගත හැකිද යන්නයි.

සංවර්ධනය මුඛ්‍ය වශයෙන් අංග සතරකින් සමන්විත වෙයි. මෙයට ආර්ථික සංවර්ධනය, සාමාජික සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය, සදාචාරාත්මක සංවර්ධනය යන කොටස් ඇතුලත් වේ. මෙම අංග අතරින් ප්‍රමුඛස්ථානය ලබන්නේ ආර්ථික සංවර්ධනයයි. සංවර්ධනයේ අනෙක් අංග තුන ආර්ථික සංවර්ධනයට කිසියම් අනුරූපතාවක් දක්වන බවට යමෙකුට තර්ක කළ හැකිය.

මෑතක් වනතුරු සංවර්ධනය මැනීම සඳහා යොදාගත් මිනුම් දණ්ඩ වූයේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනයයි. (ආදායමයි). මෙම මිනුම් ක්‍රමය සංවර්ධනය යන පුළුල් විෂය පථය ආවරණය කර ගැනීමට අසමත් අඩුපාඩු රැසක් පෙන්නුම් කරන්නක් බව පැහැදිලි වෙයි.

කෙසේ නමුත් ආර්ථික සංවර්ධනය යන්න ස්වභාවික සම්පත් මෙන්ම මානුෂික සම්පත්ද ජනතාවගේ ජීවන

තත්ත්වය නගා සිටුවාලීම පිණිස බුද්ධිමත්ව උපයෝගී කරගැනීම ලෙස හැඳින්විය හැකිය.

ආර්ථික සංවර්ධනය යන පුළුල් ක්‍රියාවලිය එක තනි මිනුමකින් ගණනය කළ නොහැක්කක් බව වඩාත් අවධාරණය වන්නේ ධරණීය (පවත්වාගෙන යා හැකි) තත්ත්වයක් වියට එක්වීමත් සමඟය.

ලෝක බැංකු වර්ගීකරණයකට අනුව ලෝකයේ රටවල් කොටස් හයකට බෙදා දැක්වෙයි. මෙම වර්ගීකරණය කෙරෙන්නේ ඒකපුද්ගල දළ ජාතික නිෂ්පාදනය උපයෝගී කරගනිමිනි.

මෙතෙක් ලෝකයේ පැවති සංවර්ධන ආකෘතිය අනුව ඇතිවූ අසමතුලිත තත්ත්වයක් හැටියටද මෙය හුවා දැක්විය හැකිය.

1. අඩු ආදායම් ලබන රටවල්
2. සංවර්ධනය වන රටවල්
3. ඉහළ ආදායම් ලබන ඛනිජ තෙල් අපනයන කරන රටවල්.
4. කාර්මික / වෙළෙඳපොල ආර්ථික
5. සාමාජික නොවන රටවල් (වාර්තා නොසපයන)
6. ආර්ථික සාංක්‍රමනික අවධියේ පවතින රටවල්. යනුවෙන් ලෝකය ආදායම පාදකකොට බෙදා වෙන්වෙයි.

මෙම විශලේෂණය අනුව ලෝකයේ සංවර්ධිත රටවල් හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර පැහැදිලි ආර්ථික විෂමතාවක් මතුකෙරෙයි. ලෝකයේ සෑම රටකම ජීවන තත්ත්වය පසුගිය දශක කිහිපය තුළ වර්ධනය වී ඇතත් දුප්පත් රටවල් හා ධනවත් රටවල් අතර සංවර්ධන පරතරයද සාපේක්ෂව වර්ධනය වී ඇත. මෙම විෂමතාව හා පරතරය තවදුරටත් පවත්වාගෙන යාමට අනුබල දෙන සංවර්ධන ආකෘතියක් සේ සලකා ධරණීය සංවර්ධන ආකෘතිය ඇතැම් ආර්ථික විද්‍යාඥයෝ විවේචනයට ලක් කරති. ධරණීය සංවර්ධන සංකල්පය පිළිබඳව හිටපු උන්ටාඩ් මහලේකම් ගාමිණී කොරයා මහතා දක්වන අදහස් මේ අතර ප්‍රධාන තැනක් ගනී. ඔහු එක ලොවක සංවර්ධන ආදර්ශ දෙකක් පවත්වාගෙන යාමට ධරණීය සංවර්ධනය බලපාන බවක් පෙන්වා දෙයි.

> "මට පෙනෙන ලෙසට අද **"සංවධීනය"** යන වදන තනිව භාවිත නොවේ. එය දැන් **"ඔරොත්තු දෙන"** යන වදන හා ඈඳා භාවිත කරති. මෙහි අදහස කුමක්දැයි මම මගෙන් ම ප්‍රශ්න කළෙමි. මෙය සිදුවන්නේ එක්සත් ජනපදයේ ද, එක්සත් රාජධානියේ ද, බටහිර යුරෝපයේ, ජපානයේ, කොරියාවේ හෝ නැගෙනහිර යුරෝපයේ ද? ඒ පෙදෙස් වල සංවධීන ආදර්ශය බිඳ වැටෙන තැනට ලංව ඇතැයි මට නම් ඒත්තු නොයයි. ඔවුන් ගෙන් ඔවුන් හටත් පොළෝ තලයේ, පරිසර පද්ධතියේ සමතුළනයටත් හානි සිදුවන බව නම් සැබෑය. එහෙත් මෙතෙක් ඔවුන්ගේ සංවධීන ආදර්ශ ඇත්තෙන් ම ඔරොත්තු නොදෙන්නේ යැයි කිව නොහැකිය.
>
> සංවධීනය වෙමින් පවත්නා රටවල් වෙනත් මගක් අනුගමනය කළ යුතු යැයි දැන් යෝජනා වී තිබේ. සංවර්ධිත රටවල් අනුගමනය කර තිබෙන පරිසරයට හානිකර සංවධීන ආදර්ශ අනුගමනය නොකළ යුතුය යන්න මින් අදහස් වේ. මේ කියන අනෙක් මාර්ගය ඒකාන්ත වශයෙන් පැහැදිළි නැත. එක ලොවක සංවධීන ආදර්ශ දෙකක්, මිනිස් ජීවන රටා දෙකක් පවතිනවාට මා නම් අකමැතිය.
>
> කාර්මික රටවල පොහොසතුන් මෙන්, තුන්වැනි ලෝකයේ රටවල් - එනම් දුප්පත් රටවල් කාර්මික වී දියුණු වී එම රටවල මිනිසුන් ද පොහොසත් වී කාර්මික රටවල මිනිසුන් මෙන් ජීවත් වන්නට පටන් ගනීය යන අදහස් පවතී. මෙසේ වූ පසු පොළොව මත ජීවත්වීම අපහසු වී පරිසර තුළනතාව විනාශ වෙතැයි බියක් පවතී. මේ කියන කරුණ ඇත්ත විය හැකියි. එහෙත් මෙහි න්‍යාය කුමක් ද? දුප්පත් රටවල් සඳහට ම දුප්පත්ව සිටිය යුතු ද යන්න ද? එම රටවල ජීවන තත්ත්වය බටහිර රටවල ජීවන තත්ත්වයට වෙනස්ව පැවතිය යුතුය යන්න ද? නැතිනම් එක ම ලොවේ එක කොටසක් පොහොසත්ව සිටින අතර, අනෙක් කොටස ලෝකය සුරකිමින් හුරු පුරුදු ජීවන රටා නොවෙනස්ව පැවැත්වීමය යන්න ද?
>
> **"ඔරොත්තු දෙන සංවධීනය"** වෙනුවට විකල්ප හැටියට පරිසර ගැටළුවේ හරය තුන්වැනි ලෝකයේ රටවල් සිය පරිසරය මැනවින් පාලනය කිරීම පමණක් නොවේ. එබඳු පාලනයකට මා එකඟයි. කාර්මික රටවල් ද ඔවුන්ගේ ආර්ථික සහ නිෂ්පාදන ව්‍යුහයන්හි ආකෘති වෙනස් කළ යුතුය. ඔවුන්ගේ පාරිභෝජක පරිචයන් හෝ ව්‍යවහාරයන් වෙනස් කොට, ලොවේ පරිසර

පද්ධතියට හානිකර නොවන අන්දමේ ජීවන රටාවක් අනුගමනය කළ යුතුය. සංවර්ධිත රටවල් තම ජීවන රටාවන් වෙනස් කොට අනෙක් රටවල් අනුගමනය කළ යුතු ක්‍රම පෙන්වා දිය යුතුය. ඔරොත්තු දෙන සංවර්ධනය මෙන් ම අනුගමනය කළ යුතු සංවර්ධන ක්‍රමයක්ද අපට අවශ්‍යය. එම නිසා මට නම් සංවර්ධනය කුමක්දැයි සිතා ගැනීම අපහසුය, එය හරි හැටි වටහා ගන්නා තුරු කිසිවකු "ඔරොත්තු නොදෙන සංවර්ධනයකට" කැමති වෙතැයි නොසිතේ.

**ආචාර්ය ගාමිණී කොරයා - "සොබා" 1990 දෙසැම්බර්**

කෙසේ වුවද සීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථික පාරිසරික අභියෝග ජය ගැනීමට හැකි ක්‍රියාවලියක් වශයෙන් ධරණීය සංවර්ධන න්‍යාය පිළිගැනීමට ලෝකයේ රාජ්‍යයෝ පෙළඹී සිටිති. මෙයට හේතුව පෘථිවි වායුගෝලය උණුසුම් වීම. ඕසෝන ස්ථරය ක්‍ෂය වීම වැනි විපර්යාසයන් මානව ප්‍රජාව අවබෝධ කර ගැනීම විය හැකිය. තවද මානව ශිෂ්ඨාචාරය විනාශ නොවී පවත්වාගෙන යාමට ක්‍ෂණිකවත් කාර්යක්‍ෂමවත් ක්‍රියාවට නැගිය යුතු විසඳුම් ක්‍රියාවලියක් ලෙසද මෙය පිළිගැනීමට ලෝක ප්‍රජාවට සිදුවී තිබේ.

ධරණීය සංවර්ධන මූලාශ්‍ර පදනම් කර නිර්මිත රියෝ ප්‍රකාශනය හා 21 වන සියවස් න්‍යාය පත්‍රය එක්සත් ජාතීන් විසින් පිළිගැනීම මෙම කරුණු තවදුරටත් තහවුරු කරයි.

ප්‍රංශ විප්ලවයට මෙන්ම කාර්මික විප්ලවයට ද සමානව ලෝකය පුරා සමාජ ආර්ථික හා සංස්කෘතික විපර්යාසයක් ඇතිකළ චින්තන විප්ලවයක් වශයෙන් ඇතැමෙක් ධරණීය සංවර්ධනය ආශ්‍රිත වෙනස්වීම් තක්සේරු කරන අවස්ථා ඇත. ස්වාභාවික සම්පත් කළමනාකරණයට රාජ්‍යයන් යොමුකරන ශීක්‍ෂණ මාර්ගයක් ලෙසද ඇතැම්හු මෙය හුවා දක්වති.

ධරණීය සංවර්ධන සංකල්පය රෝපණය වී දශක දෙකක් ගෙවී යන්නට පෙර මෙම සංකල්පය මූලාශ්‍රකොට එක්සත් ජාතීන්ගේ සන්ධාන සම්මුති හා 21 වන සියවස න්‍යාය පත්‍රය වැනි අන්තර් ජාතික ක්‍රියාවලි රාශියක් ඇරඹිනි.

# රියෝ මිහිතල සමුළුව

1992 ජුනි මස රියෝද ජැනයිරෝ හිදී පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය පරිසර සුරැකීම පිළිබඳ ජාත්‍යන්තර නීති රීති මෙන් සාරධර්මකෙරෙහිද එකසේ අනුභාව පාන ලැබීය.

රියෝ සමුළුව කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිකිරීමට එ. ජ. සම්මත යෝජනා 38 - 161 යටතේ පිහිටවූ පරිසරය හා සංවර්ධනය පිළිබඳ කොමිසම මගින් නෝර්වේ අගමැතිනියව සිටි ග්‍රෝ හාර්ලම් බ්‍රැන්ට්ලාන්ඩ්ගේ සභාපතිත්වයෙන් සැකසුණු වාර්තාව ද සමත්විය. මෙම වාර්තාව "අපගේ පොදු අනාගතය" (Our Common Future) යන නමින් 1987 ප්‍රකාශයට පත් කෙරිණ. ධරණීය සංවර්ධනය (Sustainable Development) බ්‍රැන්ට්ලාන්ඩ් වාර්තාවේ සම්පිණ්ඩිත අදහසවිය. මෙම වාර්තාවේ මුඛ්‍ය තේමාව වූයේ පරිසරය නිසිලෙස ආරක්ෂා කිරීමට නම් අනතුරින් පසුව සුව කිරීමට වඩා (Rective) අනතුරු වලක්වාලීමේ පියවර (Protective) ගැනීම කෙරෙහි යොමුවීමයි.

සමුළුව අවසානයෙහි රාජ්‍ය පාර්ශවයින් විසින් පරිසරය හා සංවර්ධනය පිළිබඳව රියෝ ප්‍රකාශනයට අත්සන් තබන ලදී.

# රියෝ මිහිතල සමුළුව හා 21 න්‍යාය පත්‍රය

බ්‍රසීලය දකුණු ඇමරිකාවට අයත් ජෛව විවිධත්වයෙන් පොහොසත් මනරම් දේශයකි. බ්‍රසීලය කියූ පමණින් අප සිත්හි ඇඳී යන මනෝ රූපය ඇමසන් වැසි වනාන්තරයයි. හුස්ම ගැනීමට අවශ්‍ය ඔක්සිජන් වැඩි ප්‍රමාණයක් පෘථිවි ගෝලයට මුදා හරින වන පෙතක් ලෙසද ඇමසන් සැලකේ. දකුණු ඇමරිකාවේ පෘතුගීසි බස වහරන එකම රට වශයෙන්ද බ්‍රසීලය සුපතලය. බ්‍රසීලයේ අගනුවර වන රියෝ ද ජැනැයිරෝපුර සංචාරකයන් බහුල පෙදෙසකි. එක් පසෙකින් සුදු සුමුදු වැලිතලා මතුකළ වෙරළ තීරයකි. මෙනුවර වඩාත් දැකුම්කළු බව මතු කරන්නේ ගොඩබිම්හි තැන තැන දිස්වන කඳු ගැට පෙළයි.

රමණීය කෝපකබානා වෙරළ තීරය සැඳෑ සිරිය සැණකෙළි සිරියටද මුසුවන්නකි. රමණීය රියෝ පුර දෙරණ 1992 දී පැවති රියෝ මිහිතල සමුළුව නිසා වඩාත් අලංකෘත විය.

ලොව නන් දෙසින් පැමිණි රාජ්‍ය නායකයෝ මෙන්ම පඬිවරුද, විද්‍යුහුරු නැණැත්තෝ ද කෝපකබානා වෙරළ තීරයේ සුසැදි සෑම සංචාරක හෝටලයකම අතුරු සිදුරු නැතිව පිරී ගියහ. මෙය මිහිතල සමුළුව සඳහා සුදානම් වීමකි.

පෘතුවියේ චමත්කාරය පිළිබඳ එඩ්වින් ඕල්ඩ්‍රින් නැමති ඇපලෝ 11 යානයෙන් සඳමත පතිතවූ ඇමරිකානු ගගනගාමියා දැක්වූ අදහස් ඉතා වැදගත්ය. ඔහු සැතපුම් 25,000 ක් පමණ ඈත සිට දුටු දර්ශනය පිළිබඳ කියමන මෙහිලා වඩාත් වැදගත් වේ. ඔහු මිහිමඬල දැක ඇත්තේ විල්ලුදමය රෙදිකඩක් මත තැබූ නිල්මිනි කැටයක් බඳුවය. පෘථිවිය හරිම ලස්සන වස්තුවක් බවත් ඔහු දුටු මෙම නිල්වන් ලෝකය තුළ මිනිසා විසින් බෙදාගත් කෘතිම ලෙස යොදාගත් කිසිම මායිමක් දර්ශනය නොවූ බවත් ඔහු පවසයි. මිනිසාට පෘථිවියේ ඒකාබද්ධතාවය පසක් වූයේ සැතපුම් 25,000 ක් පමණ ඈතක සිට බව මෙයින් පැහැදිලි වේ.

ස්වභාවධර්මය, කාලගුනය, දේශගුනය මිනිසා විසින් කෘතිම ලෙස තැනූ මායිම් නොසලකන බව පැහැදිලිවේ. මේඝ වලා මෙන්ම දුහුලුවලාවද භූගෝලීය මායිම් නොතකා පාවී යයි. මිනිසුන් විසින් පෘතුවිය දේශපාලන මායිම් වලට කෘතිම වශයෙන් බෙදා වෙන් කරනු ලැබූවද මෙබඳු මායිම් කෙරෙහි සොබාදහම කිසිදු තැකීමක් නොකරන බව මිනිසා විසින්ම පසක් කොට ගැනිණි.

රියෝ මිහිතල සමුළුව වන විට මිහිතලයේ ඒකමිතිභාවය පිළිබඳ දර්ශනය ඔහු වඩාත් හොඳින් පසක්කොටගනී. මෙහිදී මිහිතලය වනාහී පූර්ණ පද්ධතියක් බවත් පෘථිවි තලයේ එක් එක් අංශ ඉතා සංකීර්ණ ආකාරයෙන් අනෙකුත් අංශ හා බැඳී පවතින බව මිනිසා විසින් තෙරුම් ගත් සත්‍යයකි. මිහිතලයට හා මානව සංහතියට බලපාන තීරණ ගැනීමේදී මුළු ලොවම එක්ව ක්‍රියාකළයුතු බව දැන් සැමගේ පිළිගැනීමයි. මිහිතලය රැකගැනීමේ වෙසෙස් ක්‍රියාවලිය වශයෙන් සැලකෙන්නේ ධරණීය සංවර්ධන උපායමාර්ගය මත ගොඩ නැගුණු 21 වන සියවසේ න්‍යායපත්‍රයයි. රියෝ නුවරදී අත්සන් තැබුනේ මෙම අවශ්‍යතාවය සලකාගෙනය.

එක්සත් ජාතීන්ගේ පරිසර හා සංවර්ධනය පිළිබඳ සමුළුව රියෝ නුවරදී මුලුදුන්නේ ස්ටොක්හෝම් සමුළුව පවත්වා වසර 20 කට පසුවය. එතෙක් මෙතෙක් රාජ්‍ය නායකයින් වැඩිම ගණනක් සහභාගීවූ ඓතිහාසික සමුළුව ලෙස රියෝ සමුළුව ඉතිහාස ගතවෙයි.

1992 බ්‍රසීලයේ රියෝ නුවර පැවැත්වූ මිහිතල සමුළුව මානව ශිෂ්ඨාචාරයේ ඉතා වැදගත් සන්ධිස්ථානයකි. ලෝක නායකයින් විසින් එහිදී අත්සන් තැබූ රියෝ ප්‍රකාශනය මෙන්ම 21 වන සියවස සඳහා වන න්‍යාය පත්‍රය ද මෙම සියවසේ නව සංස්කෘතික හා සංවර්ධනයක මඟ සලකුණක් සේ සැලකිය හැකිය.

සංවර්ධනයේ නාමයෙන් මෙතෙක් විචාර බුද්ධියෙන් තොරව සිදුවූ පාරිසරික හානි අවම කිරීමට දැල්වූ නව

ඥානාලෝකය හා සුඛවාදී දර්ශනයක්ද මෙමගින් මතුකරනු ලැබ ඇත. පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය පරිසරය හා සංවර්ධනය පිළිබඳ කරුණු වලදී රාජ්‍යයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් පැහැදිලි කරන මූලධර්ම පද්ධතියක් සේද සැලකේ.

සෑම රටකටම ගෝලීය පරිසර සංරක්ෂණයේදී ක්‍රියාකාරකම් හා වගකීම් සංහිභාරයක් ඉටු කිරීමට සිදුවන බව මෙමගින් පැහැදිලි කෙරේ.

21 වන සියවස සඳහා වන න්‍යාය පත්‍රය පිළිබඳව ඒ ඒ රටවල ප්‍රතිපත්ති සම්පාදකයන් හා එය ක්‍රියාවට නගන්නන් තුළ මනා අවබෝධයක් තිබීම වැදගත් වේ. ජාතික මට්ටමේ මෙන්ම ප්‍රාදේශීය මට්ටමේද සංවර්ධන ක්‍රියාකාරකම් වලදී මෙන් සැලසුම් සම්පාදනයේදී මෙකී මූලධර්ම පිළිබඳ සංවේදීතාවක් ඇති කරගෙන සිටීම සෑම රාජ්‍ය මට්ටමේ නිලධාරියෙකුගේම වගකීමක්ද වේ. රාජ්‍ය නොවන ආයතන වල පුළුල් සහභාගීත්වයද මෙම ක්‍රියාකාරකම් වලදී පෘථුල ලෙස යොදා ගැනීමට සිදුවේ. 21 වන සියවසේ න්‍යායපත්‍රය හා රියෝ ප්‍රකාශනය පිළිබඳ පුළුල් මහජනතාවද දැනුවත්ව සිටීම අවශ්‍ය වේ. 21 වන සියවසේ න්‍යාය පත්‍රය පිළිබඳ සංකථනයක් ඇති කිරීම කාලීන අවශ්‍යතාවයක් වශයෙන් පෙනී යයි. පරිච්ඡේද 40 කින් සමන්විත 21 වන සියවසේ න්‍යායපත්‍රයෙහි අන්තර්ගත කරුනු පුළුල් සංකථනයකට භාජනය කළ යුත්තකි.

මිනිස් ඉතිහාසයේ කිසිදු දවසක මේ අයුරින් පරිසරය පිළිබඳ පූර්ණ විචාරයක් හෝ විවරණයක් කර නොතිබුනි. මිහිතලය පිළිබඳ පූර්ණ විචාරයකට හෝ විවරණයට මග සැලසූ සුවිශේෂී අවස්ථාව ලෙස රියෝ සමුළු මණ්ඩපය සැලකිය හැකිය. 21 වන සියවස සඳහා න්‍යාය පත්‍රයෙන් පරිසරය හා සංවර්ධනය පිළිබඳ අර්ථාන්විත විවරණයක් කෙරී ඇත. එය එක්ව කටයුතු කිරීමේදී මුළු ලොව පිළිගත් පොදු න්‍යාය පත්‍රයක් වන බවටද පත්ව ඇත.

පෘථිවියේ අවිනිශ්චිත අනාගතය හමුවේ මිනිස් වර්ගයාගේ ඉරණම විසඳන තීරණාත්මක කරුණු රාශියක් ඉතා පැහැදිලිව ඉදිරිපත් කරණ මෙම වාර්තාව මිනිස් වර්ගයා විනාශයෙන් ගලවා ගැනීමට හේතුවන්නකි.

මෙවකට එක්සත් ජාතීන්ගේ මහලේකම්ව සිටි 1992 - බුට්‍රෝස් බුට්‍රෝස් ඝාලි (Boutos Boutors Ghali) එය ඉතිහාසයේ වැදගත් සංදිස්ථානයක් හැටියටත් මෙය ලෝක සංවර්ධන ව්‍යායාමයේදී ඉදිරි පරම්පරා උවදුරෙහි නොහෙලන්නක් බවත් 21 න්‍යාය පත්‍රය අපේ අනාගතය සඳහා වන ආයෝජනයක් බවත් පවසා ඇත.

# ඉතිහාස සටහනක්

ඓතිහාසික මිහිතල සමුළුව (UNITED NATIONS CONFERENCE ON ENVIRONMENT AND DEVELOPMENT) 1992 ක් වූ ජූනි මස 03 වැනි දින සිට 14 දින දක්වා රියෝ ද ජැනෙයිරෝ නුවරදී පැවැත්විණි.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බුත්‍රොස් බුත්‍රොස් ඝාලි (BAUTORS BAUTORS GHALI) සමුළු සමාරම්භක උත්සවය විවෘත කරණ ලදී. බ්‍රසීල ජනාධිපති පර්නෑන්ඩෝ කුලෝ ද මෙලෝ (FERNANDO COLLOR DE MELLO) සමුළුව සභාපතිත්වය සඳහා තෝර ගනු ලැබිණි.

මොරිස් ස්ට්‍රොන්ග් (MAURICE STRONG) (කැනඩාව) සමුළුවේ මහ ලේකම් ධූරය හෙබවීය.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු ඩී. බී. විජේතුංග මහතා හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු එම්. වින්සන්ට් පෙරේරා මහතාද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් රාජ්‍ය නායක සමුළුවට සහභාගීවූහ.

# රියෝ සමුළුව
# පරිසරය හා සංවර්ධනය පිළිබඳව වන එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය (1992)

| | |
|---|---|
| **සම්මන්ත්‍රණය** | පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය (UNCED) රියෝ ද ජැනයිරෝව 1992 ජුනි මස 3 - 14 |
| **අවිධිමත් නාමය** | මිහිකත සමුළුව |
| **පැවැත්වුන රාජ්‍යය** | බ්‍රසීලය |
| **සහභාගිවුන රාජ්‍යයන් සංඛ්‍යාව** | 103 ක් රාජ්‍යයන් හි හෝ රජයේ ඉහල පෙළේ නිළධාරීන් |
| **සම්මන්ත්‍රණයෙහි මහ ලේකම්** | මොරිස් එෆ් ස්ට්‍රෝන්ග් - කැනඩාව |
| **සංවිධායකයෝ** | පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණයෙහි මහලේකම් කාර්යාලය |
| **ප්‍රධාන තේමාවන්** | පරිසරය හා තිරසාර සංවර්ධනය |
| **සහභාගීවන රාජ්‍ය නොවන සංවිධාන** | රාජ්‍ය නොවන සංවිධානයන්ගේ නියෝජිතයන් 2400 ක් පමණ පුද්ගලයන් 17000 ක් පමණ සමාන්තර රාජ්‍ය නොවන සංවිධාන මුළුවට සහභාගී විය. |
| **ප්‍රතිඵල පත්‍රය** | 21 වන සියවසේ න්‍යාය පත්‍රය, සංවර්ධනය හා පරිසරය පිළිබඳ වන රියෝ ප්‍රකාශය, වනාන්තර මූලධර්ම පිළිබඳ ප්‍රකාශය, දේශගුණ විපර්යාස පිළිබඳ වන එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය සහ ජෛවීය විවිධත්වය පිළිබඳව වන එක්සත් ජාතීන්ගේ සම්මුතිය. |
| **බිහි වූ තාක්ෂණයන්** | බිහි වූ තාක්ෂණයන්: තිරසාර සංවර්ධනය පිළිබඳ කොමිසම තිරසාර සංවර්ධනය පිළිබඳ අන්තර් නියෝජිත කොමිසම, තිරසාර සංවර්ධනය පිළිබඳ ඉහල මට්ටමේ උපදේශක මණ්ඩලය. |
| **පෙර පැවැත්වූ සම්මන්ත්‍රණය** | මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය ස්ටොක්හෝම් (1972) |

# පියවරෙන් පියවර
# 2002 මිහිතල සමුළුව සඳහා පියවර

**එක්සත් ජාතීන්ගේ ධරණීය සංවර්ධන ක්‍රියාදාමය**

1972 මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (ස්ටොක්හෝම්) එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන මගින් පිහිටුවන ලදී.

1980 ලෝක සංරක්ෂණ උපාය මාර්ගය ස්වභාව ධර්මය සුරැකීම සඳහා අන්තර්ජාතික සංගමය.

1983 පරිසරය හා සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසම පිහිටුවීම (බෘන්ට්ලන්ඩ් කොමිසම)

1989 අපේ පොදු අනාගතය පිළිබඳ බෘන්ට්ලන්ඩ් වාර්තාව

1989 ස්වභාවික ආපදා අවම කිරීම සඳහා අන්තර්ජාතික දශකයේ ආරම්භය.

1992 පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (මිහිතල සමුළුව) රියෝ ද ජැනෙයිරෝ ධරණීය සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම පිහිටුවන ලදී.

1997 රියෝ + 5 සමුළු සමාලෝචනය (මන්දගාමී ක්‍රියාකාරිත්වය නිසා විවාදාත්මක විය)

1999 ස්වාභාවික ආපදා අවම කිරීම සඳහා අන්තර් ජාතික දශකයේ අවසානය.

2000 ආපදා අවම කිරීමේ අන්තර්ජාතික උපාය මාර්ගය ආරම්භය.

**ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව (රියෝ + 10) ක්‍රියාදාමය**

2001 ක්‍රියාදාමයේ ක්‍රමවේදයන් නිර්වචනය කිරීම. ජාතික, උප කලාපීය හා කලාපීය මූලික රැස්වීම්

2002 ලෝක මූලික කමිටුව - 2 (ජනවාරි-නිව්යෝර්ක්) 21 වන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූලික සමාලෝචනය

ලෝක මූලික කමිටුව - 3 (මාර්තු - නිව්යෝර්ක්) ක්‍රියාත්මක කිරීමේ පිළියෙල කිරීම සඳහා මූලික කරුණු සමාලෝචනය හා නිම කිරීම.

ලෝක මූලික කමිටුව - 4 (මැයි - බාලි) මූලික ගැටළු හඳුනාගැනීම, දේශපාලනික ප්‍රකාශය සඳහා ක්‍රියාමාර්ගය සහ මූලික කරුණු පිළියෙළ කිරීම.

**මූලික අවස්ථා**

1982 එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ පළමු උසස් මට්ටමේ සාකච්ඡාව.

1991 ළමා සමුළුව - නිව්යෝර්ක්.

1992 දේශගුණික විපර්යාස පිළිබඳ මූලාකෘති සම්මුතිය හා ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියට එකඟ වන ලදී.

1993 මානව අයිතිවාසිකම් පිළිබඳ සමුළුව - වියානා.

1994 "ආරක්ෂාකාරී ලොවක් සඳහා" ස්වාභාවික උපද්‍රව අවම කිරීමේ ලෝක සම්මේලනය, යෝකොහමා. කුඩා දූපත් සංවර්ධන ස්වභාවයන් පිළිබඳ සම්මේලනය - බාබේඩස්

1995 සමාජීය සමුළුව - කොපන්හේගන්

කාන්තා සමුළුව - බෙයිජිං
ලෝක වෙළඳ සංගමය පිහිටුවන ලදී

1996 මානව පදිංචිවීම් පිළිබඳ සමුළුව - ඉස්තාම්බුල්

ආහාර සමුළුව - රෝමය

1997 දේශගුණික විපර්යාස පිළිබඳ කියොතො සන්ධානය සම්මත කරගන්නා ලදී.

1998 පූර්ව ඥාණාන්විත එකඟතාවය පිළිබඳ සම්මුතිය සම්මත කරගන්නා ලදී.

1999 ස්වාභාවික ආපදා අවම කිරීමේ අන්තර්ජාතික දශකය පිළිබඳ වැඩසටහනේ රැස්වීම - ජිනීවා

2000 සහස්‍ර සමුළුව - නිව්යෝර්ක්

ලෝක යොවුන් සමුළුව - දකා
ජෛව ආරක්ෂක සන්ධානය සම්මත කරගන්නා ලදී.

2001 එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනෙහි 21 වන පාලන කවුන්සිලය - කාට්ජෙනා

ඌණ සංවර්ධිත රටවල් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තුන්වන සම්මේලනය - බෘසල්ස්.

පිරිසිදු ජලය පිළිබඳ අන්තර්ජාතික සම්මේලනය - බොන්

? GATTS සහ කෘෂිකර්මය ඇතුළු ලෝක වෙළඳ සංගමයේ සාකච්ඡා.

2002 සංවර්ධනය සඳහා මූල්‍යාධාර - මෙක්සිකෝව.

ලෝක ආහාර සමුළුව - ඉතාලිය

# රියෝ ප්‍රකාශනය පූර්විකාව

වර්ෂ 1992 ක් වූ ජුනි මස 03 වැනි දින සිට 14 වැනි දින දක්වා රියෝ ද ජැනෙයිරෝ නුවර රැස් වූ පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව, වර්ෂ 1972 ජුනි මස 16 වැනි දින ස්ටොක්හෝම් නුවර දී සම්මත කර ගන්නා ලද මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ ප්‍රකාශනය නැවත තහවුරු කරමින් ද සියල්ලන්ගේ ම අයිතිවාසිකම්වලට ගරු කරන්නා වූ සහ ගෝලීය පාරිසරික හා සංවර්ධන පද්ධතියේ අඛණ්ඩතාව ආරක්ෂා කරන්නා වූ ජාත්‍යන්තර ගිවිසුම් සඳහා ක්‍රියාකරන රාජ්‍යයන් ද සමාජවල සහ ජනතාවන්ගේ ප්‍රධාන අංශ ද අතර නව මට්ටමේ සහයෝගිතාවන් ඇති කිරීම තුළින් අලුත් සහ සාධාරණ ලෝක හවුලක් පිහිටුවීමේ පරමාර්ථයෙන් යුතුව ඒ මත විශ්වාසය තැබීමට අපේක්ෂා කරමින් ද අපගේ වාසභූමිය වන පෘථිවියේ අඛණ්ඩ සහ අන්‍යෝන්‍ය වශයෙන් රැඳී පවත්නා ස්වභාවය පිළිගනිමින් ද පහත සඳහන් ප්‍රකාශය කරයි.

**1 වැනි ප්‍රතිපත්තිය**

ප්‍රවර්තනීය සංවර්ධනය පිළිබඳ කාර්ය කටයුතු මනුෂ්‍ය වර්ගයා කේන්ද්‍රකොට ඇත. ස්වභාව ධර්මයට අනුකූල සෞඛ්‍ය සම්පන්න සහ ඵලදායී ජීවිතයකට ඔවුනට හිමිකම ඇත.

**2 වැනි ප්‍රතිපත්තිය**

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට සහ ජාත්‍යන්තර නීතියේ මූලධර්මවලට අනුව, රාජ්‍යයන්ට, තම තමන්ගේ පාරිසරික සහ සංවර්ධන ප්‍රතිපත්තීන්ට අනුගත ව තම තමන් සතු සම්පත් අධික ලෙස භාවිතයට ගැනීමේ අයිතිය ද තම බලප්‍රදේශ සහ තම පාලනයට නතු ප්‍රදේශ හෝ ඇතුළත කෙරෙන කටයුතුවලින් සෙසු රාජ්‍යයන්ගේ හෝ දේශීය බලප්‍රදේශවල සීමාවන්ගෙන් ඔබ්බෙහි පෙදෙස්වල හෝ පරිසරයට හානියක් නොවන බවට සහතික වීමේ වගකීම ද ඇත.

**3 වැනි ප්‍රතිපත්තිය**

සංවර්ධනය සඳහා ඇති අයිතිය ක්‍රියාවේ යෙදවිය යුත්තේ වර්තමාන සහ අනාගත පරම්පරාවන් ගේ සංවර්ධන සහ පාරිසරික අවශ්‍යතා සාධාරණ ලෙස සපුරාලන අයුරිනි.

**4 වැනි ප්‍රතිපත්තිය**

ප්‍රවර්තනීය සංවර්ධනය මුදුන් පමුණුවා ගනු පිණිස, පාරිසරික ආරක්ෂාව සංවර්ධන ක්‍රියාවලියේ අවශ්‍ය අංගයක් බවට පත් විය යුතු අතර එය ඉන් වෙන් කොට සැලකිය නොහැකි ය.

**5 වැනි ප්‍රතිපත්තිය**

දිළිඳු බව මුලිනුපුටා දැමීමේ අත්‍යවශ්‍ය කර්තව්‍යයෙහි දී, ලෝකයේ බහුතර ජනතාවගේ ජීවන තත්ත්වයේ විෂමතා අඩු කරනු පිණිසත් ඔවුන්ගේ අවශ්‍යතා වඩා හොඳින් සපුරාලනු පිණිසත් සියලු රාජ්‍ය සහ සියලු ජනතාව ප්‍රවර්තනීය සංවර්ධනය පිළිබඳ අනිවාර්ය අවශ්‍යතාවක් හැටියට එහි ලා සහයෝගය දැක්විය යුතු ය.

**6 වැනි ප්‍රතිපත්තිය**

සංවර්ධනය වන රටවල විශේෂයෙන් ම ඉතා අඩු සංවර්ධනයකින් යුත් සහ පාරිසරික වශයෙන් බෙහෙවින් ම අනතුරට ගොදුරු විය හැකි රටවල විශේෂ අවශ්‍යතාවලට විශේෂ ප්‍රමුඛත්වයක් දිය යුතු ය. පරිසරය සහ සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයට අයත් ජාත්‍යන්තර කටයුතුවල දී සියලු රටවල අයිතිවාසිකම් සහ අවශ්‍යතා කෙරෙහි ද සැලකිල්ල දැක්විය යුතු ය.

**7 වැනි ප්‍රතිපත්තිය**

පෘථිවියේ පරිසර පද්ධතියෙහි ස්වස්ථතාව සහ අඛණ්ඩතාව සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම උදෙසා ලෝක හවුලක හැඟීමෙන්

යුතුව සියලු රාජ්‍ය එහි ලා සහයෝගය දැක්විය යුතු ය. ලෝක පාරිසරික පරිහානියට විවිධ අන්දමේ දායකවීම් ගැන සලකන විට, රාජ්‍යවලට ඇත්තේ පොදු එහෙත්, එකිනෙකට වෙනස් ආකාරයේ වගකීම් ය. ලෝක පරිසරය කෙරෙහි තම සමාජයන් විසින් ඇති කරනු ලබන පීඩනයන් සහ ඔවුන්ට ලබා ගත හැකි තාක්‍ෂණයන් හා මූල්‍ය සම්පත් ද ගැන සලකන විට, ප්‍රවර්තනීය සංවර්ධනය කරා යාමේ ජාත්‍යන්තර ප්‍රයත්නයේ දී තමන් උසුලන වගකීම දියුණු වූ රටවල් පිළිගනිති.

## 8 වැනි ප්‍රතිපත්තිය

ප්‍රවර්තනීය සංවර්ධනයත් සකල ජනතාවට ම වඩා හොඳ ජීවන තත්ත්වයකුත් සාක්‍ෂාත් කර ගැනීම සඳහා රාජ්‍යයන් විසින් ප්‍රවර්තනීය නොවන නිෂ්පාදන සහ පරිභෝජන රටාවන් අඩු කිරීමත් බැහැර කිරීමත් කරනු ලැබිය යුතු වාක් මෙන් ම උචිත ජන ජීවී සංඛ්‍යාත පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කරනු ලැබිය යුතු ය.

## 9 වැනි ප්‍රතිපත්තිය

විද්‍යාත්මක හා තාක්‍ෂණික දැනුම හුවමාරු කිරීම් මගින් විද්‍යාත්මක අවබෝධය වැඩි දියුණු කිරීමෙන් ද නව සහ නව්‍යකරණීය තාක්ෂණ ද ඇතුළුව තාක්‍ෂණයන් සංවර්ධනය කිරීම, අනුවර්තනය, විසරණය සහ පැවරීම වැඩි කිරීමෙන් ද ප්‍රවර්තනීය සංවර්ධනය උදෙසා අභ්‍යන්තරගත ශක්තිය ගොඩනැගීම ප්‍රබල කිරීමට රාජ්‍යයෝ සහයෝගිතාව දැක්විය යුත්තා හ.

## 10 වැනි ප්‍රතිපත්තිය

පාරිසරික ප්‍රශ්න ගැන ඉතා හොඳින් ක්‍රියා කිරීමට හැකි වන්නේ අදාළ සියලු පුරවැසියන් උචිත මට්ටමින් ඊට සහභාගී වීමෙනි. ජාතික මට්ටමේ දී රාජ්‍ය බලධාරීන් වෙත ඇති, ඔවුන්ගේ ජන කොටස් තුළ වූ උපද්‍රවකාරී ද්‍රව්‍ය සහ කටයුතු පිළිබඳ තොරතුරු ඇතුළු, පරිසරයට අදාළ තොරතුරු ලබා ගැනීමේ නිසි මාර්ග සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමේ අවස්ථාව ද සෑම පුද්ගලයකුට ම තිබිය යුතු ය. තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට සැලැස්වීමෙන් මහජන අවබෝධය සහ සහභාගීත්වය පහසු කිරීමත් දිරිමත් කිරීමත් රාජ්‍යයන් විසින් කරනු ලැබිය යුතු ය. අධිකරණමය සහ පරිපාලනමය කාර්ය සටහන් ලබා ගැනීමේ ඵලදායී මාර්ග ද සහන සහ ප්‍රතිකර්ම ද සැලැස්විය යුතු ය.

## 11 වැනි ප්‍රතිපත්තිය

කාර්යක්‍ෂම පාරිසරික නීති, රාජ්‍යයන් විසින් නීතිගත කරනු ලැබිය යුතු ය. පාරිසරික ප්‍රමිතීන්ගෙන් කළමනාකරණ පරමාර්ථයන් ගෙන් සහ ප්‍රමුඛතාවන්ගෙන් ඒවාට අදාල වන පාරිසරික සහ සංවර්ධන සන්දර්භය පිළිබිඹු විය යුතු ය. ඇතැම් රටවල් විසින් යොදා ගනු ලබන ප්‍රමිතීන් වෙනත් රටවලට, විශේෂයෙන් ම සංවර්ධනය වන රටවලට උචිත නොවිය හැකිවාක් මෙන් ම ඒවා අනවශ්‍ය ආර්ථික හා සමාජ පිරිවැයකට හේතු වන ඒවා විය හැකි ය.

## 12 වැනි ප්‍රතිපත්තිය

පරිසර හායනය පිළිබඳ ගැටළු කෙරෙහි වඩා හොඳින් සැලකිල්ල යොමු කරනු සඳහා සියලු රටවලම ආර්ථික වර්ධනයටත් ප්‍රවර්තනීය සංවර්ධනයටත් තුඩු දෙන උපකාරක සහ විවෘත ජාත්‍යන්තර ආර්ථික ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමට රාජ්‍යයන් සහයෝගය දැක්විය යුතු ය. සංවර්ධන කාර්යයන් සඳහා වූ වෙළෙඳ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තුළින් ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ අත්තනෝමතික හෝ අසාධාරණ වෙනස්කමක් නැතහොත් වෙස්වළාගත් සීමා කිරීමක් ඇති නොවිය යුතු ය. ආනයනය කරන රටෙහි බල සීමාවෙන් පිටත ඇති පාරිසරික අභියෝගයන් පිළිබඳ ක්‍රියාකිරීම සඳහා ගනු ලබන ඒකපාර්ශ්වික ක්‍රියාමාර්ග අත්හැරිය යුතුය. දේශසීමාවෙන් ඔබ්බෙහි වූ හෝ ගෝලීය හෝ පාරිසරික හෝ ගැටළු ගැන සැලකිල්ල යොමු කෙරෙන පාරිසරික ක්‍රියාමාර්ග, හැකි තාක් දුරට ජාත්‍යන්තර ඒකමතිකභාවයක් මත පදනම් විය යුතු ය.

## 13 වැනි ප්‍රතිපත්තිය

පරිසර දූෂණයටත් වෙනත් පාරිසරික හානිවලටත් ගොදුරු වන්නන්, සඳහා වගකීම සහ වන්දි ගෙවීම හා සම්බන්ධ ජාතික නීතිය, රාජ්‍යයන් විසින් සුදුසු පරිදි වෙනස් කර ගත යුතු ය. තවද, තමන්ගේ බලසීමාව හෝ පාලනය ඇතුළත හෝ තම බල සීමාවෙන් පරිබාහිර ප්‍රදේශවලට හෝ සිදු වන පාරිසරික හානිවල අහිතකර බලපෑම් සඳහා වගකීම හා වන්දි ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් ජාත්‍යන්තර නීතිය පුළුල් කිරීම සඳහා කඩිනමින් හා වඩා අධිෂ්ඨාන පූර්වක අයුරින් රාජ්‍යයන් විසින් සහයෝගය දෙනු ලැබිය යුතු ය.

## 14 වැනි ප්‍රතිපත්තිය

බරපතල පාරිසරික පරිහායනයක් ඇති කරන හෝ මිනිස් සෞඛ්‍යයට හානිකර යැයි පෙනී යන හෝ, යම් යම් කටයුතු සහ ද්‍රව්‍ය වෙනත් රාජ්‍ය කරා ගෙන යාම හෝ මාරු කිරීම අධෛර්යවත් කිරීම සඳහා හෝ වැළැක්වීම සඳහා රාජ්‍යයන් විසින් ඵලදායී අයුරින් සහයෝගය දෙනු ලැබිය යුතු ය.

## 15 වැනි ප්‍රතිපත්තිය (ආරක්ෂක ප්‍රතිපත්ති)

පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා තම තමන්ගේ ශක්තිය අනුව, රාජ්‍යයන් විසින් ආරක්ෂක සම්ප්‍රාප්ති ක්‍රියා මාර්ගය පුළුල් ලෙස යොදා ගනු ලැබිය යුතු ය. බරපතල හෝ ප්‍රතිසාධ්‍ය නොවන හෝ හානි සිදු වීමේ තර්ජන ඇති විටෙක දී, පාරිසරික පරිහායනය වැළැක්වීම සඳහා වූ පිරිවැය - සාධක ක්‍රියාමාර්ග ගැනීම කල් දැමීමේ හේතුවක් වශයෙන්

පූර්ණ විද්‍යාත්මක නිශ්චිතතාවක් නොමැති කම යොදා නොගත යුතු ය.

## 16 වැනි ප්‍රතිපත්තිය

මහජන යහපත ගැන නිසි සැලකිල්ල දක්වමින් සහ ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජනය විකෘති කිරීමෙන් තොරව, ප්‍රතිපත්තියක් වශයෙන් දූෂකයා දූෂණයේ පිරිවැය දැරිය යුතු ය යන සම්ප්‍රාප්ති ක්‍රියාමාර්ග සැලකිල්ලට ගනිමින්, පාරිසරික පිරිවැය සහ ආර්ථික උපකරණ භාවිතයත් අභ්‍යන්තරීකණය සඳහා ජාතික බලධාරීහු උත්සාහ ගත යුත්තා හ.

## 17 වැනි ප්‍රතිපත්තිය

පරිසරය කෙරෙහි සැළකිය යුතු අන්දමේ අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබෙන සහ නිසි ජාතික බලධරයාගේ තීරණයට යටත් වන යෝජිත කටයුතු සඳහා, ජාතික උපකරණයක් වශයෙන් පාරිසරික බලපෑම් තක්සේරුව යොදා ගනු ලැබිය යුතු ය.

## 18 වැනි ප්‍රතිපත්තිය

වෙනත් රාජ්‍යවලට අයත් පරිසරයට හදිසි හානිකර විපාක ගෙන දිය හැකි වූ යම් ස්වාභාවික විපතක් හෝ වෙනත් හදිසි අවස්ථාවන් ගැන රාජ්‍යයන් විසින් එකී රටවලට වහාම දැනුම් දිය යුතු ය. එසේ අනතුරට ගොදුරු වන රාජ්‍යවලට උදව් කිරීමට ජාත්‍යන්තර ප්‍රජාව සෑම උත්සාහයක් ම දැරිය යුතුය.

## 19 වැනි ප්‍රතිපත්තිය

දේශ සීමාවෙන් බැහැර පරිසරයට සැළකිය යුතු අන්දමේ අහිතකර බලපෑමක් ඇති කළ හැකි කටයුතු සම්බන්ධයෙන්, විභව්‍ය වශයෙන් බලපෑමක් ඇති රටවලට රාජ්‍යයන් විසින් පූර්ව දැනුම් දීමක් කල්වේලා ඇති ව කරනු ලැබිය යුතු අතර, අදාළ වන තොරතුරු ද ලබා දිය යුතු වන අතර ඉක්මනින් සහ සද්භාවයෙන් යුතුව එකී රාජ්‍යයන් සමග සාකච්ඡා කළ යුතු ද වේ.

## 20 වැනි ප්‍රතිපත්තිය

පාරිසරික කළමනාකරණය සහ සංවර්ධනය ද පිළිබඳව, කාන්තාවන්ට වැදගත් කාර්ය භාරයක් ඇත. එබැවින්, ප්‍රවර්තනීය සංවර්ධනය මුදුන් පමුණුවා ගැනීම සඳහා ඔවුන්ගේ පූර්ණ සහභාගිත්වය අත්‍යවශ්‍ය ය.

## 21 වැනි ප්‍රතිපත්තිය

ප්‍රවර්තනීය සංවර්ධනයක් මුදුන් පමුණුවා ගැනීමත් වඩා යහපත් අනාගතයක් සියල්ලන්ට ම ලබා දීම සහතික වීමත් අරමුණු කොට ගෙන ගෝලීය හවුලක් පෙරට ගෙන යනු පිණිස, ලෝකයේ තරුණ ජනතාවගේ නිර්මාණශීලිත්වය, පරමාදර්ශ සහ ධෛර්යය ඒකරාශී කරනු ලැබිය යුතු ය.

## 22 වැනි ප්‍රතිපත්තිය

ආදිවාසී ජනතාවත් ඔවුන්ගේ ප්‍රජාවත් වෙනත් දේශීය ජන කොටසුත් සතු දැනුම සහ පාරම්පරික භාවිතයනුත් නිසා, පාරිසරික කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ වැදගත් කාර්ය භාරයක් ඔවුන් සතුව ඇත. ඔවුන්ගේ අනන්‍යතාව, සංස්කෘතිය සහ අයිතිවාසිකම් රාජ්‍යයන් විසින් පිළිගෙන ඒවාට නිසි අනුබලය ලබා දිය යුතු අතර ප්‍රවර්තනීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමෙහි ලා ඔවුන්ට ඵලදායී ලෙස සහභාගී වීමට සැලැස්විය යුතු ය.

## 23 වැනි ප්‍රතිපත්තිය

පීඩනය, ආධිපත්‍යය සහ පදිංචිය යටතේ වෙසෙන ජනතාවගේ පරිසරය සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

## 24 වැනි ප්‍රතිපත්තිය

යුද කටයුතු නෛසර්ගික වශයෙන් ම ප්‍රවර්තනීය සංවර්ධනය නසාලයි. එබැවින් සන්නද්ධ අරගල පවත්නා කාලවල දී පරිසරයේ ආරක්ෂාව සලසන ජාත්‍යන්තර නීතියට රාජ්‍යයන් ගරු කළ යුතු අතර, අවශ්‍ය පරිදි, එහි වැඩිදුර සංවර්ධනයෙහි ලා සහයෝගය දැක්විය යුතු ද වේ.

## 25 වැනි ප්‍රතිපත්තිය

සාමය, සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂාව ස්වාධීන සහ අභාජ්‍ය වේ.

## 26 වැනි ප්‍රතිපත්තිය

රාජ්‍යයන් විසින්, තම පාරිසරික ආරාවුල්, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූලව සාමකාමීව සහ උචිත මාර්ගවලින් විසඳා ගනු ලැබිය යුතු ය.

## 27 වැනි ප්‍රතිපත්තිය

මේ. ප්‍රකාශනයෙහි ඇතුළත් වූ ප්‍රතිපත්ති මුදුන්පත් කර ගැනීමෙහි දී සහ ප්‍රවර්තනීය සංවර්ධනය ක්ෂේත්‍රයෙහි ජාත්‍යන්තර නීතිය තවදුරටත් සංවර්ධනය කර ගැනීමෙහි දී ද රාජ්‍යයන් සහ ජනතාව සද්භාවයෙන් සහ හවුල් හැඟීමෙන් යුතුව සහයෝගය දැක්විය යුතු ය.

# 21 සියවසේ න්‍යාය පත්‍රය
# පරිසරය හා සංවර්ධනය පිළිබඳ
# එක්සත් ජාතීන්ගේ සමුළු වාර්තා - සිරස්තල


01 **වන පරිච්ඡේදය**
පූර්විකාව

02 **වන පරිච්ඡේදය**
දියුණු වන රටවල ධරණීය සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගය සහ සබැඳි දේශීය ප්‍රතිපත්තීන්

03 **වන පරිච්ඡේදය**
දිළිඳුකම පිටුදැකීම

04 **වන පරිච්ඡේදය**
පරිභෝජන රටාවන් වෙනස් කිරීම

05 **වන පරිච්ඡේදය**
ජනගහන ගතිකත්වය හා දරාගත හැකි (ධරණීය) තත්ත්වය

06 **වන පරිච්ඡේදය**
මානව සෞඛ්‍ය සංරක්ෂණය හා සංවර්ධනය

07 **වන පරිච්ඡේදය**
ධරණීය මානව වාසස්ථාන සංවර්ධන ප්‍රවර්ධනය

08 **වන පරිච්ඡේදය**
තීරණ ගැනීමෙහි පරිසරය හා සංවර්ධනය ඒකාබද්ධ කිරීම

09 **වන පරිච්ඡේදය**
වායු ගෝලය සුරැකීම

10 **වන පරිච්ඡේදය**
භූමි සම්පත් සැලසුම් සහ කළමණාකරණය වෙත ඒකාබද්ධ ප්‍රවේශය

11 **වන පරිච්ඡේදය**
වන හරනයට එරෙහිව

12 **වන පරිච්ඡේදය**
පරිසර පද්ධතින් කළමණාකරනය: කාන්තාරකරණය සහ නියඟය පිටු දැකීම.

**13 වන පරිච්ජේදය**
දුර්වල පරිසර පද්ධතීන් කළමණාකරනය තිරසාර කඳුකර සංවර්ධනය

**14 වන පරිච්ජේදය**
තිරසාර කෘෂිකර්මය හා ග්‍රාමීය සංවර්ධනය නැංවීම.

**15 වන පරිච්ජේදය**
ජෛව විවිධත්වය සංරක්ෂණය හැඳින්වීම

**16 වන පරිච්ජේදය**
ජීවතාක්ෂණයේ පරිසර හිතකාමී කළමණාකරනය

**17 වන පරිච්ජේදය**
සාගර, සංවෘත හා අර්ධ සංවෘත ඇතුලු සියලු වර්ගවල මුහුදු සහ වෙරළබඩ ප්‍රදේශ සහ එහි සජීවී සම්පත් සුරැකීම සහ බුද්ධිමත් පරිහරනය හා සංවර්ධනය

**18 වන පරිච්ජේදය**
මිරිදිය සම්පත් වල යහගුණයෙන් හා සැපයුම් ආරක්ෂාව: සංවර්ධනයට, කළමණාකරනය හා ජල සම්පත් පරිහරණයට ඒකාබද්ධ ප්‍රවේශ භාවිතය.

**19 වන පරිච්ජේදය**
විෂ සහිත හා අනතුරුදායක නිපැයුම්වල නීති විරෝධී ජාත්‍යන්තර ප්‍රවාහනය ඇතුළුව, විෂ සහිත ද්‍රව්‍ය වල පරිසර හිතකාමී කළමණාකරනය

**20 වන පරිච්ජේදය**
උවදුරු සහිත අපද්‍රව්‍ය වන නීති විරෝධී ජාත්‍යන්තර ප්‍රවාහනය වැලැක්වීම ඇතුලු උවදුරු සහිත අපද්‍රව්‍යවල පරිසර හිතකාරී කළමණාකරනය

**21 වන පරිච්ජේදය**
ඝණ අපද්‍රව්‍ය සහ කසළ ගැටළු පරිසර හිතකාමී කළමණාකරනය

**22 වන පරිච්ජේදය**
විකිරණ අපද්‍රව්‍යවල ආරක්ෂිත හා පරිසර හිතකාමී කළමණාකරනය

**23 වන පරිච්ජේදය**
ප්‍රධාන ජන කොටස්වල භූමිකාව ශක්තිමත් කිරිම

**24 වන පරිච්ජේදය**
තිරසාර හා සාධාරණ සංවර්ධනය කරා ස්ත්‍රීන් සඳහා ජගත් ක්‍රියාකාරීත්වය

**25 වන පරිච්ජේදය**
තිරසාර සංවර්ධනයෙහි ලා ළමයින් හා තරුණ තරුණියන්

**26 වන පරිච්ජේදය**
දේශීය ජනයාගේ හා ඔවුන්ගේ ප්‍රජාවන්ගේ භූමිකාව පිළිගැනීම හා ශක්තිමත් කිරීම.

**27 වන පරිච්ජේදය**
රාජ්‍ය නොවන සංවිධානවල භූමිකාව ශක්තිමත් කිරීම : තිරසාර සංවර්ධනයෙහි ලා හවුල්කාරයෝ

**28 වන පරිච්ජේදය**
21 වන සියවසේ න්‍යාය පත්‍රයට සහායට ප්‍රාදේශීය අධිකාරියන්ගේ ආරම්භක පියවර

**29 වන පරිච්ඡේදය**
සේවකයන්ගේ සහ ඔවුන්ගේ වෘත්තීය සමිතිවල භූමිකාව ශක්තිමත් කිරීම.

**30 වන පරිච්ඡේදය**
වෙළෙඳ ව්‍යාපාරවල හා කාර්මික ව්‍යාපාරවල භූමිකාව ශක්තිමත් කිරීම.

**31 වන පරිච්ඡේදය**
විද්‍යාවේදී හා තාක්ෂණවේදී ප්‍රජාව

**32 වන පරිච්ඡේදය**
ගොවීන්ගේ භූමිකාව ශක්තිමත් කිරීම

**33 වන පරිච්ඡේදය**
මූල්‍ය සම්පත් හා යාන්ත්‍රනයන්

**34 වන පරිච්ඡේදය**
පරිසර හිතකාමී තාක්ෂණය පැවරීම, සහයෝගය, හා ශක්තීන් ගොඩනැගීම.

**35 වන පරිච්ඡේදය**
තිරසාර සංවර්ධනය සඳහා විද්‍යාව

**36 වන පරිච්ඡේදය**
අධ්‍යාපනය, මහජන සතිමත්භාවය හා පුහුණුව, ප්‍රවර්ධනය

**37 වන පරිච්ඡේදය**
දියුණු වන රටවල ශක්තීන් ගොඩනැගීම සඳහා ජාතික යාන්ත්‍රනයන් හා ජාත්‍යන්තර සහයෝගය

**38 වන පරිච්ඡේදය**
ජාත්‍යන්තර ආයතනික වැඩපිළිවෙල ක්‍රියාකාරීත්ව පදනම

**39 වන පරිච්ඡේදය**
ජාත්‍යන්තර නෛතික ලේඛන හා යාන්ත්‍රණ

**40 වන පරිච්ඡේදය**
තීරණ ගැනීම සඳහා තොරතුරු

# වරම් දෙවමු මිහිමඬලේ පැවැත්මට
# 21 සියවසේ න්‍යාය පත්‍රය

පෘථිවිය වනාහී පූර්ණ පද්ධතියකි. පෘථිවි ගෝලයේ එක් එක් අංශය ඉතා සංකීර්ණ ආකාරයෙන් අනෙක් අංශ හා සමග සම්බන්ධවී පවතී. ව්‍යාකූල වූ සම්බන්ධතාවන් ගතික සමතුලිතතාවක් විසින් පවත්වා ගෙන යනු ලබන අතර ස්වභාව ධර්මයට ඉඩ හළහොත් ආසන්න වශයෙන් පරිපූර්ණ සමතුලිතතාවක් ලැබෙනු ඇත. වායු ගෝලයත්, ජල ගෝලයත්, ශිලා ගෝලය සහ ජෛව ගෝලයත් අතර පවත්නා මෙකී අන්තර් ක්‍රියාවලිවලට මිනිසා බාධා පමුණුවන අතර නිරන්තරයෙන්ම එහි ප්‍රතිඵලය වී ඇත්තේ සෞම්‍ය තත්ත්වයෙන් පැවති ගතික සමතුලිතතාවට බාධා වීමයි.

මිනිසුන් විසින් පෘථිවියේ භූ දේශපාලනික මායිම්වලට කෘත්‍රිම වශයෙන් බෙදනු ලැබ ඇති නමුත්, මෙබඳු මායිම් කෙරෙහි ස්වභාව ධර්මය කිසිදු තැකීමක් නො කරයි. ඉහත සඳහන් කරන විවිධ ගෝල පැහැදිළි ලෙස ම හරස් කැපෙන අතර පෘථිවියේ සමතුලිතතාව රැක ගැනීම සඳහා එකී සියලු භූ-දේශපාලනික මායිම් වලින් කිසි ලෙසකින් පිටිවහලක් නො ලැබේ. මේ අයුරින්, මුළු මිහිතලයම තමන්ගේ ජන්ම භූමිය ලෙස සලකා ලෝකයේ භෞතික ස්ථාවර භාවය ඇති කර ගැනීම පිණිස සාමූහික ව ක්‍රියා කිරීම හැර මනුෂ්‍ය ප්‍රජාවට වෙනත් විකල්පයක් නැත.

මෙවැනි එකමුතුවක් ඇති කර ගැනීමේ එකම මග "21 සියවසේ න්‍යාය පත්‍රය" වේ. තමන් උපන් බිම - එනම් මිහිතලය රැක ගැනීමේ බලවත් වුවමනාව හා අවශ්‍යතාව පිළිබඳ හැඟීමක් මනුෂ්‍ය වර්ගයාට එමගින් දෙනු ලැබේ. සියලු රටවල්, ප්‍රජාවන් සහ සියලු ආගම් අතරින් ගොස් ඒ හැම එකට බැඳ තබන වරපොට මෙය යි. මේ දක්වා ඉදිරිපත් කරනු ලැබ ඇති ඕනෑම අවියකටත් එමෙන්ම මූල ධර්මයකටත් වඩා මෙය මනුෂ්‍ය වර්ගයා එකමුතු කිරීමෙහිලා හැම අතින්ම ප්‍රබලය. එබැවින් "කාර්ය සටහන - 21" සඳහා සෑම පුද්ගලයෙක්ම, සෑම ප්‍රජාවක් ම සහ සෑම රටක්ම ඉහළම ප්‍රමුඛතාව දිය යුතු අතර අනාගතය සඳහා පෙර නොවූ විරූ ප්‍රතිලාභ මෙ මගින් අත් කරගත හැකි වෙනු ඇත.

**මහාචාර්ය සී. බී. දිසානායක**
පේරාදෙනිය විශ්වවිද්‍යාලය

## රියෝ සමුළුව අවසානයේ අත්සන් කළ සම්මුති හා සංධාන

- කාලගුණ වෙනස්වීම් සැලසුම් කිරීම පිළිබඳ සම්මුතිය

  (Framework Convertion on Climate Changes)

- ජීව විද්‍යාත්මක විවිධත්වය පිළිබඳ සම්මුතිය

  (Convention of BIO - Diversity)

- සෑම වර්ෂයකම කැලෑ ආරක්ෂාකර කලමනාකරණය හා යෝග්‍ය සංවර්ධනයක් බිහි කිරීම සඳහා ජගත් සම්මතයට අවශ්‍ය මූලධර්ම පිළිබඳ ප්‍රකාශනය.

  (Statement of Principles for A Global Management Conservation and Sustainable Development of all Types of Forests)



# රියෝ ප්‍රකාශනයට අත්සන් තැබීම

පරිසර හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය එම්. වින්සන්ට් පෙරේරා මහතා රියෝ ප්‍රකාශනයට සහ 21 සියවස න්‍යාය පත්‍රයට අත්සන් තැබූ අවස්ථාව, ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම ද ඡායාරූපයෙන් දැක්වේ.

ඡායාරූපයේ වමේ සිට

සමුළු නිලධාරී එල්. සී. ඒ ද එස් විජේසිංහ ආචාර්ය දේවනේසන් නේසයියා (ලේකම් පරිසර හා පාර්ලිමෙන්තු කටයුතු අමාත්‍යාංශය), ජී. කේ. අමරතුංග (සභාපති මධ්‍යම පරිසර අධිකාරිය) එම්. වින්සන්ට් පෙරේරා (පරිසර හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍ය),විජේතුංග, ස්ටැන්ලි කල්පගේ (ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපති) සුනිල් සරත් පෙරේරා (පරිසර හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්), ආචාර්ය ගාමිණී කොරයා සහ එක්සත් ජාතීන්ගේ සාධාන අංශයේ ප්‍රධානී මාරි ලුයිස්.

# 2002
# ජොහැන්නස්බර්ග් සමුළුව

1992 දී පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඓතිහාසික මිහිතල සමුළුව පවත්වා වසර 10 ක් සපිරෙණ අවස්ථාවක රියෝ දසවසර (රියෝ + 10 වශයෙන් ද) හඳුන්වන ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුව දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවරදී ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුව මුල් වුණි.

"ධරණීය සංවර්ධනය" යන්න තේමාකොට ගත් මෙම සමුළුවේදී සංකථනයට පාත්‍රවූ මුඛ්‍ය කරුණ වූයේ රියෝ සමුළුවෙන් පසු ලෝකය වෙනස් වී ඇති ආකාරය ලොව පුරා ඇති රාජ්‍යයන්, පුරවැසියන්, එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යායතන, බහුපාර්ශවීය මූල්‍ය ආයතන සහ අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරී හු රියෝ සමුළුවෙන් පසු ගෙවී ගිය දසවසර ගැන නැවත හැරී බැලීමක් කළහ. රාජ්‍ය සහ ආණ්ඩු නායකයන්ට අමතරව ව්‍යාපාර ප්‍රධානීහු සිවිල් සමාජ සංවිධාන නියෝජිතයෝ දහස් ගණනක් ජොහැන්නස්බර්ග් සමුළුවට සහභාගී වූහ. ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක නායක සමුළුව පෘථිවි පරිසර පද්ධතිය විනාශයෙන් බේරා ගැනීම ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ විශේෂිත අවස්ථාවක් විය.

ගතවූ සියවස් කීපය ඇතුලත මානව වර්ගයා දැවැන්ත භෞතික සංවර්ධනයක් අත්කර ගෙන ඇති නමුදු සිය අනාගත පැවැත්ම නැතහොත් මානව ශිෂ්ඨාචාරයේ පැවැත්ම පිළිබඳ අභියෝගයකට මුහුණ පා සිටී.

ජොහැන්නස්බර්ග් සමුළුව පැවැත්වෙන අවස්ථාව වන විට මතුවී පෙනුන අන්තරාදායක තත්ත්වයන් එක්සත් ජාතීන් විසින් සපයන තොරතුරු හ දත්ත ආශ්‍රයෙන් අවධාරණය කර තිබුණි.

මේ වන විට ලෝක ජනගහනයෙන් කෝටි 120 කට දිනකට ලැබෙන අදායම ඩොලර් 1 කට අඩු ප්‍රමාණයක් විය. මිනිස් සංහතියෙන් භාගයකට දෛනික ආදායම ඩොලර් 2 කට අඩුය. පොසිල ඉන්ධන භාවිතය වේගයෙන් ඉහල යන අතර නිෂ්පාදන සහ පරිභෝජන රටා ස්වාභාවික සම්පත් ඒවා ප්‍රතිපූර්ණය කළ හැකි වේගය ඉක්මවා ගිල දමමින් පවතී. ලෝකයේ මත්ස්‍ය සම්පතෙන් හතරෙන් තුනක් ස්වාභාවික සීමා ඉක්මවා ප්‍රයෝජනයට ගෙන තිබේ. කඳුකර ග්ලැසියර සෙමෙන් දියවී යමින් පවතී ගතවූ දශකයේ පමණක් වෙනිසියුලාවට වඩා විශාල වනාන්තර අහිමි වී ගියේය.

මේ ප්‍රවණතාව ආපසු හැරවිය හැකියයි නායක සමුළුව සංවිධානය කරණ අවස්ථාවේදීම එක්සත් ජාතීන්හු බලාපොරොත්තු තැබූහ.

ධරණීය සංවර්ධනය සැබෑවක් බවට පත් කර ගැනීමට අවශ්‍ය දේශපාලන කැපවීම ජොහැන්නස්බර්ග් සමුළුවේදී ප්‍රදර්ශනය විය යුතුයි" යනුවෙන් එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අන්නන් සමුළුව පැවැත්වීමට පෙර පැවසීය.

ජොහැන්නස්බර්ග් නායක සමුළුව පැවැත්වෙනුයේ ධරණීය සංවර්ධනය පිළිබඳ නිල සැලැස්ම වන "න්‍යාය පත්‍රය" 21 සම්මත කොට ගනු ලැබූ 1992 වසරේ රියෝද ජනෙයිරෝ නුවර පැවති මිහිකත සමුළුවෙන් දස වසරකට පසුවය. එහෙත් ජොහැන්නස්බර්ග් සමුළුව හුදෙක් රියෝ සමුළුවේ පසු අවස්ථාවක් නොවන බවද අවධාරණය කර තිබුනි. ජොහැන්නස්බර්ග් සමුළුව එදා සිට අත්කරගත් ජයග්‍රහණ මත පදනම්ව 2000 වසරේ පැවති සහස්‍රක නායක හමුව ඇතුලු බොහෝ ලෝක සමුළුවලදී ගිවිසගත් අරමුණු ලඟා කර ගැනීම පෙර දැරී කොට ගත් ප්‍රයත්නයක් වශයෙන්ද සැලකේ.

ධරණීය සංවර්ධනය හා බැඳුණු අධි පරිභෝජනය, ඔරොත්තු නොදෙන ජීවන රටා, ජල හිඟය, එච්. අයි. වී. ඒඩ්ස් ඇතුලු සෞඛ්‍ය ගැටළු, ගෝලීයකරණය හා කාලගුණික විපර්යාසය වැනි දේ මෙහිදී පුළුල් ලෙස සාකච්ඡාවට පාත්‍රවිය.

# ජොහැන්නස්බර්ග් ධරණීය සංවර්ධනය පිළිබඳ වූ මිහිතල සමුළුව සම්පිණ්ඩිත වාර්තාවක්

**ආචාර්ය ඩබ්ලිව්. එල්. සුමතිපාල**

## 1. පසුබිම

පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCED), මීට දශකයකට පෙර, 1992 ජුනි මස 3 සිට 14 දක්වා බ්‍රසීලයේ රියෝ ද ජනයිරෝ නගරයේදී පවත්වන ලදී. මෙම සමුළුව මිහිතල සමුළුව ලෙසින්ද හඳුන්වන අතර, මෙම මුල් සමුළුවට රාජ්‍ය ප්‍රධානීන් සියයකට වඩා සහභාගි වූ අතර, මුළු සහභාගිත්වය දස දහසක් (10,000) පමණ විය.

මෙම **සමුළුවේ** ප්‍රධාන **ප්‍රතිපල** යන් වූයේ,

- පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශය
- ක්‍රියාත්මක වැඩ පිළිවෙල - 21 වන සියවසේ න්‍යාය පත්‍රය
- දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත වැඩ පිළිවෙල
- ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය.
- වනාන්තර සිද්ධාන්ත පිළිබඳ ප්‍රකාශය.

21 සියවසේ න්‍යාය පත්‍රයේ, පරිච්ඡේදය 38 යටතේ ජාත්‍යන්තර සහභාගිත්වය වැඩි කිරීමේ අදහසින් **ධරණීය** සංවර්ධනය පිළිබඳ කොමිසම (CSD) නිර්මාණය කිරීම සඳහා අදහස් ඉදිරිපත් විය.

මෙම කොමිසම ධරණීය සංවර්ධනය පිළිබඳවූ මිහිතල සමුළුව සඳහා සූදානම් කිරීමේ කමිටුවක් ලෙස ක්‍රියා කල අතර, රියෝ සමුළුවෙන් පසු පැවැත්වූ රැස්වීම් ගණනාවක ප්‍රතිපලයක් ලෙස, ධරණීය සංවර්ධනය පිළිබඳ වූ මිහිතල සමුළුවේ තීරණ ක්‍රියාවට නගන අයුරු පිළිබඳව සැලැස්මක් ඉදිරිපත් කර ඇත.

## 2. ධරණීය සංවර්ධනය පිළිබඳවූ මිහිතල සමුළුව

මෙම සමුළුව වර්ෂ 2002, අගෝස්තු මස 26 සිට සැප්තැම්බර් මස 4 දක්වා දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවරදී පැවැත්විණි. මෙම සමුළුවේ **අභිප්‍රාය** වූයේ, 1992 පැවැත්වූ සමුළුව පිළිබඳ **විවරණයක්** කරන අතරම, ධරණීය සංවර්ධනය පිළිබඳව තව දුරටත් **බැඳීම්** ඇති කර ගැනීමයි. මෙම විවරණයේදී, වැඩ සටහන 21 යටතේ ගත් තීරණ ක්‍රියාත්මක කිරීමේදී, තව දුරටත් **උපකාර** අවශ්‍ය කොටස් හඳුනාගැනීම, ධරණීය සංවර්ධනය කරා ළඟාවීමට, දේශපාලන බැඳීම් අළුත් කිරීම වැනි දෑ කෙරෙහි වඩාත් අවධානය යොමු විය. ධරණීය සංවර්ධනය පිළිබඳ මිහිතල සමුළුවේදී ප්‍රධාන වශයෙන් ලේඛන දෙකක් සම්මත කර ගන්නා ලදී.

- දේශපාලන ප්‍රකාශය - ධරණීය සංවර්ධනය සඳහා ජොහැන්නස්බර්ග් බැඳීම.
- සමුළුවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම.

ඉහත ප්‍රතිඵලයන් ලබා ගැනීම සඳහා, මෙම සමුළුවේදී නොයෙකුත් විධි ක්‍රම ක්‍රියාත්මක කල අතර, රැස්වීම්, සාකච්ඡා, ගිවිසගැනීම් ප්‍රධාන ලෙස සැලකිය හැක.

පාර්ශ්ව කරුවන්ගේ උපදේශකත්වය, ක්‍රියාත්මක කිරීමේදී සම්බන්ධ කරගත යුතු කොටස්, යහපත් පාලනයේදී සම්බන්ධ කරගත යුතු කොටස්, දුප්පත්කම තුරන් කිරීමේ "ව්‍යාපාර" ආකාරයේ ගිවිසගැනීම් කොටස්, නිපදවීමේ සහ භාවිතයට ගැනීමේ රටාව, ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා පාලනය කිරීම, සෞඛ්‍යය සහ ධරණීය සංවර්ධනය, ගෝලීය කරණ ලෝකයේ ධරණීය

සංවර්ධනය, කුඩා දූපත් සංවර්ධනය කිරීමේ තත්ත්වයන් යටතේ ධරණීය සංවර්ධනය, අප්‍රිකාව සඳහා ධරණීය සංවර්ධනය, වැනි මාතෘකා යටතේ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්විණි.

## 3. ශ්‍රී ලංකාවේ සහභාගිත්වය

ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ නායකත්වය දැරුවේ පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍ය ගරු. රුක්මන් සේනානායක මැතිතුමාය. පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ ලේකම් තොසපාල හේවගේ මහතා, නිවාස සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් ඩබ්. ඩී. අයිලප්පෙරුම මහතා, වාරිමාර්ග හා ජල කළමණාකරන අමාත්‍යාංශයේ ලේකම් එම්. එස්. වික්‍රමආරච්චි මහතා, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ආචාර්ය ඩී. එම්. එස්. බටගොඩ මහතා සහ මොන්ට්‍රියල් සන්ධාන ඒකකයේ සමායෝජක ආචාර්ය, ඩබ්. එල්. සුමතිපාල මහතා. විදේශ කටයුතු අමාත්‍යාංශයේ **දේශපාලන කටයුතු** (Chief Protocol) පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් ටී. බී. මඩුවේ ගෙදර මහතා, ද මෙම නියෝජිත පිරිසට අයත් වූහ.

## 4. ප්‍රධාන සැසිය (Plenary Session)

මිහිකත සමුළුවේ ආරම්භක සැසිය, සැන්ඩ්ටන් සම්මුති කේන්ද්‍රයේදී අගෝ: 26 උදේ 10.00 ට ආරම්භ විය ගරු. තාබෝ එම්බෙකි විසින් සැසිය විවෘත කල අතර, සමුළුවේ මහලේකම් නිටින් දේශායි මහතා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහනේ විධායක අධ්‍යක්ෂ ක්ලොස් ටොප්ෆර් යන මහත්වරුන් ආරම්භක දේශණ පැවැත්වූහ. දකුණු අප්‍රිකා ජනාධිපති ගරු. තාබෝ එම්බෙකි, සමුළුවේ සභාපති ලෙස පත් කර ගන්නා ලදී. මෙම සැසියේදී විශේෂයෙන් සාකච්ඡා වූ මාතෘකා වූයේ සෞඛ්‍යය, ජෛව විවිධත්වය, පරිසර පද්ධතිය, කෘෂිකර්මය, වෙළෙඳ / මූල්‍ය, තාක්ෂණය හුවමාරුව, විද්‍යාව / අධ්‍යාපනය / තොරතුරු, භාවිතයට ගැනීමේ රටාව සහ **හැකියාව වැඩි දියුණු කිරීම** ජලය සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳවය.

## 5. සමුළුවේ ප්‍රධාන තේමාව

ධරණීය සංවර්ධනය පිළිබඳ වූ මිහිතල සමුළුව ආරම්භ කරන ලද්දේ, ධරණීය සංවර්ධනය පිළිබඳ ගැටළු ගෝලීය ස්වභාවය පිළිබඳ මූලික අදහස ඇතිවය. දුප්පත් කම, වාතය සහ ජලය අපවිත්‍ර කිරීම, වන විනාශය, කාන්තාර කරණය, ප්‍රමාණයට වඩා මතස්‍යය සම්පත නෙලාගැනීම, දේශගුණය වෙනස්වීම වැනි සියලුම සිද්ධීන් ගෝලීය වශයෙන් එකිනෙකට සම්බන්ධ වේ. ඒ නිසා කිසිම රටකට මෙම අභියෝග වලට තනියම මුහුණු දිය නොහැක. මේවාට විසඳුම් සෙවීමේදී, පොදු තීරණ ක්‍රියාත්මක කිරීමට ගෝලීය එකඟතාවයන් අවශ්‍ය වේ. එසේ වුවහොත් මිනිසාගේ ජීවත්වීමේ තත්ත්වයන් වැඩි දියුණුවනවා පමණක් නොව විනාශ වී යන පරිසර පද්ධතියටද විශාල සහයෝගයක් ලබා ගත හැක.

සියලුම ජාතීන් එකතුවී පොදු එකඟතාවයකින් ක්‍රියා කිරීමේ මූලික අඩිතාලම ඇති කිරීමේ මහඟු අවස්ථාව මෙම සමුළුව මගින් උදාකර දී ඇත. ධරණීය සංවර්ධනය ඇති කරලීම සඳහා ගනු ලබන තීරණ සඳහා මූලික අවශ්‍යතා සහ ක්‍රියාකාරකම් නිර්ණය කිරීමට සහ රාජ්‍ය නායකයන් ගේ දර්ශණය සහ කැපවීම නිරූපණය කරන දේශපාලන ප්‍රකාශය සඳහා ලෝකයේ රටවල් 190 ක් පමණ පොදු තත්ත්වයන් සොයා ගත්තේය. සමුළුවේ එකඟතාවයන් පිළිබඳ ක්‍රියාවලියේදී, විවිධ කලාපීය සහ ජාතික අවශ්‍යතාවයන්, ගෝලීය ගිවිසුමකට ගෙන ඒමේදී නොයෙකුත් අපහසුතාවයන් පෙන්නුම් කරන ලදී.

මේවා අතර පිරිසිදු ජලය හා නියම ආකාරයෙන් සනීපාරක්ෂක පහසුකම් නොමැති අයට ඒවා ලබා දීම, සමුද්‍ර සහ වන ජනාවාස ආරක්ෂා කිරීම, නිපදවීමේ සහ භාවිතයට ගැනීමේ රටාව වෙනස් කිරීමෙන් ස්වාභාවික සම්පත් සඳහා ඇති ඉල්ලුම අඩු කිරීම වැනි **තීරණ** අඩංගු වේ.

ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම හා දේශපාලන ප්‍රකාශය නීතිමය එකඟතාවයක් නොවේ. කෙසේ වෙතත්, එකඟතාවයක් ඇති කිරීමේ ප්‍රබලතාවය සහ ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් මතු කළ අදහස් අනුව, මෙම ලේඛන දේශපාලනමය වශයෙන් සෑහෙන දුරට බලවත් බව පෙන්නුම් කෙරේ.

ජොහැන්නස්බර්ග් සමුළුවේදී එකඟතාවයන් ඇති කර ගැනීමේ පදනම වූයේ ඉන්දුනීසියාවේ බාලි නගරයේ පැවැත්වූ, සමුළුවට සූදානම් වීමේ අවසන් රැස්වීමේදී පිළියෙල කල ක්‍රියාත්මක කිරීමේ කෙටුම්පතයි.

එම කෙටුම්පත, පිටු 78 කි, පරිච්ඡේද 152 ක් සහ උප පරිච්ඡේද 625 කින් සමන්විත විය. එහි අඩංගු දෑ වලින් 75% ක් පමණ එකඟතාවයකට පත් වූ අතර, වරහන් තුල ඇති ඉතිරි කොටස පිළිබඳ තවමත්, එකඟතාවයකට පත්වී නොමැත. විසඳුමක් නොමැති කොටස් අතර, වෙළෙඳ සහ මූල්‍ය කටයුතු වලට සම්බන්ධ **ප්‍රතිපාදන** සහ නව කාලසටහන් සහ ඉලක්කයන් ප්‍රධාන තැනක් ගනී. එකඟතාවයන් ඇති කර ගැනීමේදී, විසඳුමක් නොමැති බොහෝ කාරණා සලකා බැලීමේදී පෙනී යන්නේ දියුණු වූ සහ දියුණු වන රටවල් අතර ඇති වෙනස් අවශ්‍යතා සහ දැක්ම වල් එයට හේතු වී ඇති බවයි.

එකඟතාවයන් ඇති කර ගැනීමේදී බොහෝ රටවල් උනන්දුවෙන් සහභාගි වූ අතර සාකච්ඡා බොහෝ දුරට කුඩා කණ්ඩායම් වලට ස්ථානගත විය. එයට හේතු වූයේ රටවල් එකඟතාවයන් ඇති කර ගත්තේ කොටස් වශයෙන් බැවිනි. දියුණුවන රටවල් 133 ක සාමාජිකත්වයෙන් යුත් රටවල් 77 හා චීනය කණ්ඩායම වශයෙන් සහභාගී වූ එම රටවල් ආර්ථිකය සම්බන්ධ කාරණා වලදී එක් මතයක් ප්‍රකාශ කරන ලදී. මෙම කණ්ඩායමට අප්‍රිකාව, ලතින් ඇමරිකාව වැනි රටවල්ද ඇතුලත්ය.

දියුණු වූ රටවල්ද, එකඟතාවයන් ඇති කර ගැනීම සඳහා කණ්ඩායම් පිහිටුවා ගන්නා ලදී. උදාහරණ ලෙස මධ්‍යම සහ නැගෙනහිර යුරෝපය වෙනුවෙන් යුරෝපා සංගමය පෙනී සිටින ලදී. ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවල් ද මෙවැනි අවිධිමත් කණ්ඩායම් ඇති කරගන්නා ලදී.

## 6. මිහිකත සමුළුවේ ප්‍රතිඵල

මිහිකත සමුළුවේදී ලේඛණ දෙකක් සම්මත කර ගන්නා ලදී. එවා නම් -

- ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රකාශය.
- ධරණීය සංවර්ධනය පිළිබඳ මිහිකත සමුළුව ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම.

  ගෝලීය ධරණීය සංවර්ධනය වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා පාර්ශ්ව කරුවන්ගේ මුල් පිරීමක්ද ඇති කරන ලදී. මෙය සමුළුවේදී ලද අමතර ප්‍රතිඵලයකි.

## 7. ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ප්‍රධාන කොටස් 8 කි.

- දුප්පත්කම තුරන් කිරීම.
- ධරණීය නොවන නිපදවීමේ සහ භාවිතා කිරීමේ රටාව වෙනස් කිරීම.
- ස්වාභාවික සම්පත් සහ පරිසර පද්ධතිය.
- ගෝලීය කරණයට මුහුණදීම.
- සෞඛ්‍යය සහ ධරණීය සංවර්ධනය.
- කුඩා දූපත් සංවර්ධනය.
- අප්‍රිකාව සහ අනෙකුත් ප්‍රදේශ.
- ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය.

මෙම සාකච්ඡා කල යුතු බොහේ කරුණු අළුත් දේවල් නොවන අතර ඒවා දිගු කාලීන වශයෙන් තේරුම් ගෙන සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමුළුව පැවැත්වීම සඳහා මුල්වූ කරුණු වේ.

උදාහරණයක් ලෙස ජලය සහ සනීපාරක්‍ෂක ක්‍රම පිළිබඳ කොටසට දැනටමත් එකඟතාවය පල කර ඇත. 2001 දෙසැම්බර් මස ජර්මනියේ බොන් නුවරදී පැවැත්වූ පානීය ජලය පිළිබඳ රැස්වීමේදී මෙම එකඟතාවය ඇති කර ගන්නා ලදී.

ලේඛනයේ ඇති කරුණු 21 වන සියවසේ න්‍යාය පත්‍රයෙන් පමණක් ලබාගත් ඒවා නොවන අතර, පසුගිය දශකය තුළදී සහශ්‍රක සමුළුව සහ අනෙකුත් ප්‍රධාන එක්සත් ජාතීන්ගේ සමුළුවලදී ගත් තීරණද එහි අඩංගු වේ.

සමුළුවට සහභාගි වීමට පෙර, රාජ්‍යයන් එකඟවූ සමහරක් ප්‍රධාන ක්‍රියාවන් මෙසේය :-

- පිරිසිදු ජලය ලබාගැනීමට නොහැකි බිලියන 1.2 ජනගහණයද, විධිමත් සනිපාරක්‍ෂක ක්‍රම නැති බිලියන 2.4 ජනගහණයද අඩු කිරීම. 2005 වර්ෂය වනවිට ජල කලමනාකරණයක් ඇති කිරීම පිළිබඳව සමුළුවේදී එකඟතාවයක් ඇති කර ගන්නා ලදී. මෙය විශේෂයෙන් කාර්යක්‍ෂම ගෘහමය සනීපාරක්‍ෂක පද්ධති ඇති කිරීමට සහ පොදු ආයතන වල හා විශේෂයෙන්ම පාසල් වල සනීපාරක්‍ෂක ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා වේ.
- විදුලිබලය වැනි නවීන බලශක්ති සේවාවන්, ඒවා නොමැති බිලියන 2 ක් පමණ ජනගහනයකට ලබාදීමට මාර්ගයන් සකස් කිරීම. කාර්යක්‍ෂම ශක්තිය භාවිතා කිරීමේ අවශ්‍යතාවයද මෙහිදි සාකච්ඡාවට බඳුන් විය.
- අත්‍යවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය, ප්‍රතිශක්තිකරණය, පාරිසරික සෞඛ්‍ය ගැටළු, අවම කිරීම, වැනි දේවල් වැඩි දියුණු කිරීමෙන් මූලික සෞඛ්‍යය සේවාවන් සියළු දෙනාටම ලබා දීම තව දුරටත්, ඒඩ්ස්, ක්‍ෂයරෝගය, මැලේරියාව වැනි රෝගවලට එරෙහිව ක්‍රියා කිරීමට සහ ලෙඩ අඩංගු ගැසොලින් සහ තීන්ත වර්ග භාවිතයෙන් ඉවත් කිරීමෙන්, ශ්වසනාල සම්බන්ධ රෝග අවම කිරීම සඳහා උදව් කිරීම වෙනුවෙන් අරමුදලක් පිහිටුවීමට සියළු රටවල් එකඟ විය.
- නීති විරෝධී ලෙස දැව කැපීම සහ ඒ ආශ්‍රිත වෙළඳාම් නතර කිරීමට වහාම පියවර ගැනීම, දියුණුවන රටවල් සඳහා සුදුසු ලෙස මුදල් හා තාක්‍ෂණය යෙදවීමෙන් ජෛව විවිධත්වය රැක ගැනීමට උදව් කිරීම.

- විනාශකාරී රසායනික ද්‍රව්‍ය හා ඉවතලන දෑ ජාත්‍යන්තර වශයෙන්, නීති විරෝධී ලෙස වෙළඳුම් නතර කිරීම. ජාත්‍යන්තරව රසායනික ද්‍රව්‍ය පාලනය සඳහා විසඳුම් ඇති කිරීම.
- සාගර සම්පත් රැක ගැනීම සඳහා ජෛව විවිධත්ව ක්‍රම යොදා සම්පත් රැක ගැනීම හා පාලනය කිරීම සහ ජලජ සම්පත් තිරසාර ලෙස දියුණු කිරීම.

ගෝලීය කරණය, මුදල් හා වෙළඳාම් පිළිබඳ සාකච්ඡා කලයුතු කරුණු වලින් 25% තවමත් නොවිසඳී පවතී. එකඟතාවයක් ඇති නොවූ අනෙක් ප්‍රධාන කරුණ වූයේ, ක්යෝටෝ සන්ධානය පිළිබඳවයි. අත්සන් කිරීමට රටවල් අයාචනා කරන්නේද නැත්නම් සමුළුව අළුත් ඉලක්ක හා දින වකවානු සඳහා එකඟවිය යුතුද යන්නය.

ජොහැන්නස්බර්ග්හිදී එකඟතාවය ඇති කරගත් ප්‍රධාන කරුණු මෙසේය.

- 1. ජලය හා සනීපාරක්ෂක ක්‍රම.
  2. බලශක්ති සහනාධාර.
  3. අළුත් කල හැකි බලශක්තීන්.
  4. රසායනික ද්‍රව්‍ය.
  5. ජෛව විවිධත්වය, ස්වාභාවික සම්පත්, සහ ධීවර කටයුතු.
  6. ඉවත ලන දෑ සහ පරිසර දූෂණය.

සඳහා දින වකවානු සහ ඉලක්කයන් පිළියෙල කිරීම.

**ධරණීය සංවර්ධනයේ හරය**

- වැදගත් (Cores) ධරණීය සංවර්ධනය පිළිබඳ කරුණු.
  1. පොදු, නමුත් එකිනෙකාට වෙනස් වගකීම්.
  2. ආරක්ෂාවීමේ සිද්ධාන්ත.
  3. දේශගුණ වෙනස්වීම්.
  4. ජෛව විවිධත්ව වාසි.
- වෙළඳ හා මුල්‍යමය කරුණු.
  1. වෙළඳ පොල ප්‍රවේශය (access)
  2. ආධාර සහ ණය සහන.
  3. GEF ගෝලීය පාරිසරික පහසුකම්.
  4. ECO Labeling පාරිසරික මුද්‍රාව.
- මානව හිමිකම් සහ පාලනය පිළිබඳ කරුණු.
  1. සංස්කෘතික වෙනස්වීම් සහ මානව හිමිකම් සඳහා ගරු කිරීම.
  2. ප්‍රධාන කම්කරු නීති.
  3. යහපත් පාලනය.
  4. ඉඩම් වලට ප්‍රවේශවීමේ බලය, ඉඩම් වල භුක්තිය සහ උකස් (Security) සහ විශ්වාසය (Credit)

## 8. ජොහැන්නස්බර්ග් ප්‍රකාශය

දේශපාලන ප්‍රකාශය වශයෙන්ද හඳුන්වනු ලබන ජොහැන්නස්බර්ග් ප්‍රකාශය, රැස්වීමට සහභාගි වූ රාජ්‍ය නායකයින්, සහ රජයේ උසස් නිලධාරීන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

## 9. අවසන් තීරණ. (Conclusion)

මිහිතල සමුළුවේ තීරණ විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ දියුණු වන රටවල්වල, ධරණීය සංවර්ධනය පිළිබඳ කරුණු බොහෝමයක්, එම තීරණ මගින් ආවරණය වන බවයි. එම කරුණු කිහිපයක් වන්නේ.

- දුප්පත් කම තුරන් කිරීම.
- නිපදවීමේ සහ භාවිතා කිරීමේ රටාව.
- ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම සහ පාලනය.
- ජෛව විවිධත්වය.
- සෞඛ්‍යය.
- පානීය ජල සැපයුම.
- සනීපාරක්ෂක විධි.
- බලශක්තිය.
- ගෝලීයකරණය සහ වෙළඳ කටයුතු පිළිබඳ කරුණු.
- කෘෂිකර්මය.
- යහපත් පාලනය.
- ආයතනික සහ මුල්‍යමය කටයුතු.

දුප්පත්කම තුරන් කිරීම, ජලය සැපයුම හා සනීපාරක්ෂක විධි පිළිබඳව කාලයන් තීරණය කිරීමේ වැඩ පිළිවෙල්, කලාපීය වශයෙන් සංවර්ධනයේදී ධනාත්මක බලපෑම් පෙන්නුම් කල හැක.

මොන්ටරි හි පැවැත්වූ සංවර්ධනය සඳහා මුදල් යෙදවීම පිළිබඳ ජාත්‍යාන්තර සමුළුව, දෝහා ප්‍රකාශය සහ මිලේනියම් සංවර්ධන ඉලක්ක හි ප්‍රතිඵල වලට සහයෝගය දීමට මෙම සමුළුව ප්‍රතිඥා දෙන ලදී.

කලාපීය සංවර්ධනය පිළිබඳව එකඟවූ වැදගත් තීරණ වනුයේ :-

- දෛනික ආදායම් ඩොලර් 1 ට වඩා අඩු ජනතාවගේ ප්‍රමාණය භාගයකින් අඩු කිරීම.

- බඩගින්නෙන් පෙළෙන ජනතාවගේ අනුපාතය භාගයකින් අඩු කිරීම.
- 2015 වනවිට හොඳ පානීය ජලය සහ සනීපාරක්ෂක විධි නොමැති ජනතාවගේ අනුපාතය භාගයකින් අඩු කිරීම.
- කෘෂිකාර්මික නිපයුම් අපනයනයේදී දෙනු ලබන සහනාධාර නැති කිරීම.
- ප්‍රධාන පාර්ශව කරුවන් ශක්තිමත් කිරීම.
- රසායනික ද්‍රව්‍ය ඇතුළු පරිසර ප්‍රශ්න සඳහා ජෛව විවිධත්ව ක්‍රම යොදා ගැනීම.
- පරිසර හා වෙළඳ කටයුතු කෙරෙහි අවධානය යෙදවීම.

පහත සඳහන් කරුණු පිළිබඳව එකඟතාවයකට ඒමට සමුළුවට නොහැකි විය.

- **අළුත්කල හැකි බලශක්ති ඉලක්කයන්.**
- ෆොසිල ඉන්ධන සඳහා දෙනු ලබන සහනාධාර ඉවත් කිරීම.
- අය වැයක් සමග කාලය තීරණය කරන ලද පැහැදිලි සැලැස්මක්.
- දියුණු වූ රටවල්වල මූල්‍යමය ගිවිස ගැනීම්.
- ගෝලීයකරණයේ සෘණමය බලපෑම් වලින් දියුණුවන රටවල් ආරක්ෂා කිරීම.

ගෝලීයකරණයේ සෘණමය බලපෑම් වලින් දියුණුවන රටවල් ආරක්ෂා කිරීමට සමුළුවට නොහැකි වීම නිසා, දියුණුවන රටවල් වල සංවර්ධනයට එමගින් විශාල ලෙස බලපෑම් ඇතිවේ.

- විශේෂයෙන් ඉතා අඩු දියුණු තත්ත්වයේ ඇති රටවලින් දියුණුවන රටවල් වලට ආනයනය සඳහා බදු සහන ඇති කිරීමෙන් ශ්‍රී ලංකාව වැනි මධ්‍ය ප්‍රමාණයෙන් දියුණුවෙන රටවල්වල ආනයනකරුවන් සඳහා අහිතකර බලපෑම් ඇතිවිය හැක.

කෘෂිකාර්මික සහනාධාර ඉවත් කිරීමෙන්, පාරම්පාරික ගොවීන් කෙරෙහි අයහපත් බලපෑම් ඇතිවිය හැක. එයට හේතුවන්නේ ගෝලීයකරණය කරන ලද නිදහස් වෙළඳ පොල සෑම විටම සමාන ලෙස සහ පාරිසරාත්මකව ධරණීය සංවර්ධනයට යොමු නොවීමයි. එනිසා සංවර්ධනය වන රටවල්, අනෙකුත් රටවල් සමග තරඟකල හැකි තත්ත්වයට පැමිණෙන තෙක් ඔවුන් ආරක්ෂා කිරීමට යම් පියවරක් ගත යුතුය.

## 10. යෝජනා.

සමුළුවට සහභාගිවූ ශ්‍රී ලංකා නියෝජිත පිරිස විසින් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත.

ජොහැන්නස්බර්ග් සමුළුවේ තීරණ අනුව, පහත සඳහන් ආකාරයට ක්‍රියා කිරීමෙන් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් වේ.

1. 2015 වන විට ආරක්ෂිත පානීය ජලය ලබාගත නොහැකි ජනගහනය භාගයකින් අඩු කිරීමට ජාතික වැඩ පිළිවෙලක් සකස් කිරීම.
2. ජලය සහ සනීපාරක්ෂක ක්‍රම නොමැති ජනගහනය භාගයකින් අඩු කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම.
3. පවතින ආහාර ප්‍රමාණය සහ ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම.
4. සමුළුවේදී එකඟවූ පරිදි ඉදිරියේදී පිහිටුවන ලෝක ශක්තිමත් කිරීමේ අරමුදලෙන් පහසුකම් ලබා ගැනීම සඳහා, ශ්‍රී ලංකාවට අදාලව දුප්පත් කම තුරන් කිරීමේ වැඩ පිළිවෙලක් ඉක්මනින් සකස් කිරීම.
5. ළදරු මරණ අනුපාතය සහ වයස අවු: 05 ට අඩු ළමයින්ගේ මරණ අනුපාතය දැනට පවතින අනුපාතයෙන් 2/3 කින්ද, මාතෘ මරණ අනුපාතය දැනට පවතින අනුපාතයෙන් 3/4 කින්ද අඩු කිරීමට සෞඛ්‍ය වැඩ පිළිවෙලක් සකස් කිරීම.
6. බාහිර ණය ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා ජාතික ණය පාලනය කිරීමේ උපාය මාර්ග සකස් කිරීම.
7. රටෙහි අභ්‍යන්තර ණය ගැටළුවට විසඳුම් සෙවීම සඳහා ධරණීය සංවර්ධනය හුවමාරුව සඳහා ණය වැනි නව ක්‍රමයන් විමසීම.
8. මොන්ටරී එකඟතාවයේ, ණය සහන වැඩ පිළිවෙල පිළිබඳ අධ්‍යනය කිරීම.
9. ඉතා අඩු දියුණු රට වලට ලැබෙන තීරු බදු හා කෝටා රහිත ගනුදෙනු කාර තත්ත්වයන් ගෙන් ඇතිවන අහිතකර බලපෑම් අවම කර ගැනීම පිණිස උපාය මාර්ග ගැන සොයා බලා කටයුතු කිරීම.
10. වෙළඳ ගිවිස ගැනීම් වලට සහභාගිවීමේ රටේ හැකියාව ඇති කිරීම සහ වැඩි දියුණු කිරීම.
11. දුප්පත් ජනයාට ජලය සැපයීමේ අරමුණින් ජල පාලනය සඳහා අභ්‍යන්තර අරමුදලක් ඇති කිරීම. ජල දූෂණය වීම වැළැක්වීම සඳහා ගෘහමය ජලය පිරිසිදු කිරීමේ පද්ධතිය ඇති කිරීම.

12. ඒ ඒ අමාත්‍යාංශ හා ආයතනවලට අදාල ප්‍රශ්ණ සඳහා නියම වේලාවට වැඩ පිළිවෙලවල් සකස් කිරීම.

13. ද්වි පාර්ශ්වික හා ගෝලීයව උපකාර ලබා ගැනීම. විශේෂයෙන්, සෞඛ්‍යය, බල ශක්තිය, ජලය හා සනීපාරක්ෂක ක්‍රම. මුහුද සහ වෙරල බඩ ආශ්‍රිත සම්පත් පිළිබඳව මෙසේ උපකාර ලබා ගත හැක.

14. 2004 වන විටදී දිගුකාලීනව පවතින කාබනික අපද්‍රව්‍ය සඳහා වූ ස්ටොක්හෝම් සම්මුතිය සඳහා වැඩි බලතල ලබාදෙන අතර, 2005 වන විට රසායනික ද්‍රව්‍ය පාලනය පිළිබඳ උපාය මාර්ග ඇති කිරීම.

15. මහජන සෞඛ්‍යය සහ නාගරික වායුතත්ත්වයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ප්‍රවාහන පද්ධතියේ කාර්යක්ෂමතාව, සහ පහසුකම් වැඩි දියුණු කිරීම.

16. පරිසර පාලනය සඳහා ලාභදායි උපකරණ හඳුන්වාදීම සහ පරිසරයේ වටිනාකම ස්වදේශිකරණය කිරීම.

17. බල ශක්ති සඳහා සහනාධාර ඉවත් කිරීම සහ බල ශක්තිය වෙළඳපොලට ඇතුළුවීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

18. දූෂණයට වගකිවයුත්තා ගෙවීමේ ප්‍රතිපත්තියක් ඇති කිරීම. ධරණීය නිෂ්පාදනය සහ භාවිතයට ගැනීම ඉදිරියට ගමන් කරවීම සඳහා, **දූෂනය කරන්නා ගෙවිය** යුතු යන වැඩ පිළිවෙලවල් ඇති කිරීම.

# ජොහැන්නස්බර්ග්

## සාමාලෝචනය

**ආචාර්ය බී. එම්. එස්. බටගොඩ**

දැරියහැකි සංවර්ධනයට ගෝලීය වගකීම බලවත් කිරීමට, 1992 පැවැති එක්සත් ජාතීන්ගේ පරිසර සංවර්ධන මහ සමුළුවෙන් පසු ගතවූ දහ අවුරුද්ද සමාලෝචනයට ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් මහ සමුළුවක් 2002 අගෝස්තු 26 වන දා සිට සැප්තැම්බර 4 වන දා දක්වා දකුණු අප්‍රිකාවේ ජෝහැන්නස්බර්ග්හි පැවැත් විණ. මිහිතල මහ සමුළුව යැයි ද කියන එක්සත් ජාතීන්ගේ පරිසර සංවර්ධන මහ සමුළුව 1992 ජුනි 3 වන දා සිට 14 වන දා දක්වා බ්‍රසීලයේ රියෝ ද පැනෙයිරෝහි පැවැත්විණ. රාජ්‍ය නායකයන් 100 කට වැඩි ගණනක් ද රටවල් 178 කින් රාජ්‍ය නියෝජිතයන් ද සහභාගිකයන් 17,000 පමණ පිරිස ද එයට පැමිණියහ. එහි ප්‍රධාන ප්‍රතිඵල වූයේ පරිසරය සහ සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය, 21 වන න්‍යාය පත්‍රය, දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුති සැලසුම, ජෛව විවිධත්ව සම්මුතිය සහ වනාන්තර පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය බිහිවීමයි. 21 වන න්‍යාය පත්‍රයෙහි 38 වන පරිච්ඡේදයෙහි ඉල්ලා තිබෙන පරිදි එක්සත් ජාතීන්ගේ පරිසර සංවර්ධන මහ සමුළුවේ අපේක්ෂා සාර්ථක ව ඉටුවීමට අන්තර්ජාතික සහයෝගිතාව වැඩිකිරීමට සහ අන්තර්රාජ්‍ය තීරණ යුක්ති සහගත කිරීමට සහ හැම මට්ටමින් ම 21 වන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය පරීක්ෂණයට ධරණීය සංවර්ධනය පිළිබඳ කොමිසම පිහිටුවන ලදී.

### එක්සත් ජාතීන්ගේ

2000 දෙසැම්බර්යෙහි පැවැත්වුණු මහ සමුළුවෙහි දී එක්සත් ජාතීන්ගේ පරිසර සංවර්ධන මහ සමුළුව අපේක්ෂා කළ කටයුතු ඉටුවීම් කෙරෙහි අවධානය යොමු කර වසර දහයක සමාලෝචනයක් කිරීමට තීරණය කර 21 වන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී තවත් ඉදිරියට උත්සාහ දැරිය යුතු අංශ හඳුනා ගැනීම අපේක්ෂා කෙරිණ. දැරියහැකි සංවර්ධනය පිළිබඳ ජගත් මහ සමුළුව දකුණු අප්‍රිකාවේ පැවැත්වීමට එරට දැක්වූ කැමැත්ත ගැන එක්සත් ජාතීන්ගේ මහ සමුළුව කෘතඥතාව පළ කළේය.

ප්‍රාරම්භක කමිටුවේ සැසි හතරක් දැරිය හැකි සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුව සඳහා ලේඛන පිළියෙළ කිරීමට තැන් සහ ක්‍රම යොදා ගැනීමට පැවැත්විණ. කලාපීය අන්තර් - රාජ්‍ය ප්‍රාරම්භක අමාත්‍ය රැස්වීම් පහක් පැවැත්විණ. ආසියා සහ ශාන්තිකර කලාපීය ප්‍රාරම්භක රැස්වීම 2001 නොවැම්බර් 27 - 29 දිනයන්හි කාම්බෝජයේ නොම් පෙන්හි පැවැත්විණ. බටහිර අප්‍රිකාවේ අමාත්‍ය රැස්වීම 2001 ඔක්තෝබර් 24 - 25 දිනයන්හි කයිරෝහි පැවැත්විණ. ලතින් අමැරිකානු සහ කැරිබියානු අමාත්‍ය රැස්වීම ඔක්තෝබර් 23 - 24 දිනයන්හි රියෝ ද ජැනයිරෝහි පැවැත්විණ. අප්‍රිකානු ප්‍රාරම්භක සම්මන්ත්‍රණය 2001 ඔක්තෝබර් 18 වන දා නයිරෝබියෙහි පැවැත්විණ. යුරෝපා අමාත්‍ය සම්මන්ත්‍රණය 2001 සැප්තැම්බර් 24 - 25 දිනයන්හි ජිනීවාහි පැවැත්විණ. මීට අමතර ව උප කලාපීය සමූපදේශක රැස්වීම් ගණනක් පැවැත්විණ. දකුණු ආසියාතික උප කලාපීය රැස්වීම 2001 නොවැම්බරයේ කොළඹ දී පැවැත්විණ. ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුව සඳහා රාජ්‍ය මට්ටමේ සමාලෝචනය ලබාගැනීමට, දැනුවත්කම නැංවීමට, සහ කොටස් කරුවන් ඈඳාගැනීමට ජාතික ප්‍රාරම්භක කමිටු පිහිටැවිණ. ඒ ඒ රටෙහි ජාතික ප්‍රාරම්භක කමිටුවලින් දැරියහැකි සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුවට අදාළ තොරතුරු අඩංගු ලේඛණ දෙකක් ඉල්ලනු ලැබිණ. ඒවා නම් රටේ තත්ත්වය පිළිබඳ තොරතුරු සහ ජාතික තක්සේරු වාර්තාවකි. ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුව විසින් සලකා බැලීම පිණිස ලේඛන පිළියෙළ කිරීමේදී කලින් සඳහන් සැසි හතර ම මෙකී සියලු ජාතික, උප කලාපීය සහ කලාපීය උපදේශක රැස්වීම් සැළකිල්ලට භාජනය කැරිණ.

ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුව ප්‍රධාන ලේඛන දෙකක් යොදාගත්තේ ය. එනම් ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුවේ ක්‍රියාකාරී සැලැස්ම සහ ධරණීය සංවර්ධනය පිළිබඳ ප්‍රකාශණයයි. ප්‍රධාන ප්‍රතිඵලවලට පරිපූරක වන සමුළුවේ II වර්ගයේ ප්‍රතිඵල ලෙස, ධරණීය ගෝලීය සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීමට, හවුල්කර ගැනීමේ

ආරම්භක පියවර කීපයක් ද වර්ධනය කැරිණ. සමුළුවේ මෙකී තීරණ සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි මුසු බලපෑම් සිදුකරනු ඇත. ශ්‍රී ලංකාවේ පරිසර සහ ආර්ථික සංවර්ධනය කෙරෙහි ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුවේ ප්‍රතිඵල බලපාන ආකාරය මේ ලිපිය සමාලෝචනය කරයි.

## කලාපීය ප්‍රමුඛතා

ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුවට කලාපීය ප්‍රමුඛතා ගැන අසමානකම් තිබුණත්, වැදගත් සමාන ව සැලකිය යුතු කරුණු ද තිබේ. අන්තර්ජාතික ප්‍රජාව 21 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය නොපමාව යොමුකළ යුතුයැයි ද, ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුව විසඳුම් සොයන අවස්ථාවක් ලෙස ද බොහෝ දෙනා විශ්වාස කරති. දෙවනු ව, ධරණීය සංවර්ධනය පිළිබඳ සාධක තුන සමෝදානය කිරීම අවධාරණය කළ යුතු බව ය. තුන්වනු ව ගෝලීකරණය වැනි නව යථාර්ථයන් කෙරෙහි සාධාරණත්වය ප්‍රවර්ධනය උදෙසා අවධානය යොමු කර එය ද ඇතුළත් කිරීම. හතරවනු ව ධරණීය සංවර්ධනය පිළිබඳ අරමුණු ඉටුකර ගැනීම කඩිනම් කිරීමට සමුළුව ඇතැම් ප්‍රධාන පෙදෙස් සහ ලබාදිය හැකි දේ ගැන යොමුවීම. එහෙයින් එක්සත් ජාතීන්ගේ නොයෙක් සම්මන්ත්‍රණවල දී එකඟ වූ අරමුණු මත එය ගොඩ නැගිය යුතුය. විශේෂයෙන් ම දෙදහස් ගණන්වල වූ මහ සමුළු අරමුණු අවසන් වශයෙන් ධරණීය සංවර්ධනය සඳහා අන්තර්ජාතික සංස්ථාමය යොදාගැනීම් ශක්තිමත් කිරීම සැලකිල්ලට ගත යුතුය.

සියලු රැස්වීම්වල පොදුවේ සලකන ප්‍රශ්න අතර; රියෝ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ගෝලීකරණය. දිළිඳුකම මුලිනුපුටා දැමීම; කෘෂිකර්ම සහ ආහාර සුරක්ෂිතතාව; බල ශක්තිය; පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව; ඔරොත්තුදෙන මිනිස් ජනාවාස; වෙළෙඳාම සහ වෙළෙඳ පොළට ප්‍රවේශය; සෞඛ්‍ය; මිනිස් සංවර්ධනය; ධරණීය සංවර්ධනයට මුදල් සැපයීම; තාක්ෂණය ලබාදීම සහ හැකියා ගොඩනැඟීම; ධරණීය සංවර්ධනයට ආයතනික ව්‍යූහය සහ පාලනය සහ තීරණ ගැනීම සහ තොරතුරු අවශ්‍යතා සපුරාලීම ඇතුළත් විය.

1. **රියෝ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම:** සියලු ප්‍රතිපත්ති යළි සහතික කිරීම. විශේෂයෙන් ම දූෂිතයා ගෙවිය යුතුය යන ප්‍රතිපත්තිය, කල්තියා වළක්වාලීමේ ප්‍රතිපත්තිය සහ පොදු, එහෙත් වෙනස්කොට දක්වන වගකීම් පිළිබඳ ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය ඇතිව සිදු කිරීම.

2. **ගෝලීකරණය:** ගෝලීකරණය සාධාරණ, දැරියහැකි සහ අන්තර්ගත වීම. වෙළෙඳ ප්‍රදේශ, මුදල්, ආයෝජන සහ තාක්ෂණය නියමිත ආරම්භකයන් ගැන සැලකිලිමත් වීම මතු කැරිණ. ධරණීය සංවර්ධනය උදෙසා ගෝලීකරණය ක්‍රියාත්මක කිරීමේ ක්‍රම සහ උපායයන් කෙරෙහි මහ සමුළුව අවධානය යොමු කරනු ඇත යන විශ්වාසය කවුරුත් තුළත් තිබේ.

3. **දිළිඳුකම මුලිනුපුටා දැමීම** : 2015 වන විට දිළිඳුකම බාගයකට අඩුකිරීමේ, දහසේ ප්‍රකාශන අරමුණ ඉටුකර ගැනීමට මහ සමුළුවේ දායකත්වය අපේක්ෂා කැරිණ. පරිසරය, දිළිඳුකම, වෙළෙඳාම සහ මිනිසා ගේ ආරක්ෂාව අතර තිබෙන සම්බන්ධතා ගැන වඩා හොඳ අවබෝධයක් ඇති කිරීම ද එයින් අපේක්ෂිතය.

4. **දැරියහැකි පරිභෝජනය සහ නිෂ්පාදනය:** මහ සමුළුව දැරියහැකි පරිභෝජනය සහ නිෂ්පාදනය දිරිගැන්විය යුතුය. විශේෂයෙන් ම බලශක්ති වර්ධනය. ආර්ථික වර්ධනයෙහි දී පරිසරයට සහ ස්වාභාවික සම්පත් පදනමට සිදුවන බලපෑම් වෙන්කිරීම කෙරෙහි අවධාරණය කළ යුතුය.

5. **ස්වාභාවික සම්පත් කළමනාකරණය:** පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව, සාගර සහ මුහුදු, වෙරළබඩ කලාප, කඳු, ඉඩම් පරිහරණය, කැලෑ, ජෛව විවිධත්වය, කාන්තාර බිහිවීම, ඛනිජ සහ ලෝහ සංවර්ධනය, ආදිය ගැන නියමිත ඇරැඹීම් සිදුකිරීම. ඇතැම් ප්‍රදේශ වාත තත්ත්ව සහ දේශගුණ විපර්යාස පිළිබඳ ප්‍රශ්ණ ද මතු කළේය.

6. **කෘෂිකාර්මික සහ ආහාර සුරක්ෂණය:** දැරියහැකි කෘෂිකර්ම සහ ග්‍රාම සංවර්ධනය ප්‍රවර්ධනයට තිබෙන අවශ්‍යතාව අවධාරණය කැරිණ.

7. **බලශක්තිය:** මහ සමුළුව බලශක්තියට ප්‍රවේශ වීම සඳහා ප්‍රවර්ධනය කළ යුතුය. යළි අලුත් කළ හැකි සහ වියදම් දැරියහැකි බලශක්ති බෙදාගැනීමට හැකිවන ලෙසට විශේෂ ආරම්භන යෙදීම.

8. **පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව:** ජලය සහ සනීපාරක්ෂක සේවාවන් ලැබිය හැකි ලෙසට දහසේ ප්‍රකාශනය අනුව අනුකලිත ජල කළමනාකරණය ප්‍රවර්ධනය.

9. **ඔරොත්තුදෙන මිනිස් ජනාවාස:** ඵලදායි නාගරික සැලසුම් හා කළමනාකරණය සඳහා ආරම්භන යෝජනා කැරිණ.

10. **සෞඛ්‍යය:** දිළිඳුකම අඩුකිරීම සහ ධරණීය සංවර්ධන උපායයන් සඳහා සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ආරම්භන මුළුමනින් ම වැදගත් බව පිළිගැනිණ.

11. **මිනිස් සංවර්ධනය:** අධ්‍යාපනය, පුහුණුව, රැකියාව, ලිංග භේදය සහ තරුණ පෙළ සංවර්ධනය කිරීම කෙරෙහි අවධාරණය යොමු විය යුතු බව.

12. **ධරණීය සංවර්ධනය උදෙසා මුදල් වැය කිරීම:** සියලු මුදල් ප්‍රභව යෙදවීම. සංවර්ධිත රටවල 0.7% දළ ජාතික - ණය - නිෂ්පාදනය ODA ලෙස සැලකීම, දිළිඳුම රටවල ණය කපාහැරීම, මුදල් වැයකිරීමේ දී අලුත් ප්‍රභව ගැන සැලකිලිමත් වීම.

21 වන න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සහ සිදු වූ අඩුපාඩු විශ්ලේෂණය පිණිස පළමුවෙන් ම ධරණීය ගෝලීය සංවර්ධන ආරම්භනයන් පිළිබඳ ගැඹුරින් සමාලෝචනයකට යොමු විය. සමාලෝචනය පරිසරය සහ සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය, 21 න්‍යාය පත්‍රය, දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සැලසුම සම්මුතිය, ජෛව විවිධත්ව සම්මුතිය, වනාන්තර ගැන ප්‍රතිපත්ති ප්‍රකාශය, ධරණීය සංවර්ධනයට මුදල් වියදම් සඳහා බැසගත් මූල්‍යමය එකඟතා, දහසේ සංවර්ධන අරමුණු සහ වෙළෙඳාම සහ පරිසරය ගැන දෝහා ප්‍රකාශනයට විශේෂයෙන් යොමු විය. ප්‍රතිපත්තියට අදාළව රෙකමදාරු කිරීමට, ශ්‍රී ලංකාවට අදාළ කලාපීය සංවර්ධනය පිළිබඳ ධරණීය සංවර්ධනය පිළිබඳ ව ජගත් මහ සමුළුවේ ප්‍රධාන තීරණ විමර්ශනීය ව ඇගැයිණ.

ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුවේ තීරණ කාලාපීය සංවර්ධනයට අදාළ ප්‍රශ්න රාශියක් ආවරණ කර තිබෙන බව විශ්ලේෂණයෙන් පැහැදිලි විය. එනම් දිළිඳුකම මුලිනුපුටා දැමීම පාරිභෝජන සහ නිශ්පාදන රටා, ස්වාභාවික සම්පත් සුරැකීම සහ කළමනාකරණය, ජෛව විවිධත්වය, සෞඛ්‍යය, පානීය ජලය සැපැයුම, සනීපාරක්ෂාව, බලශක්තිය, ගෝලීකරණය සහ වෙළෙඳ ප්‍රශ්න, කෘෂිකර්මය, මනා රාජ්‍ය පාලනය, නිසි ලෙස සකස් වුණු ආයතන සහ මුදල් ප්‍රශ්න ආදියයි. 21 වන න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීමට ඇති ප්‍රධාන අවහිරය මුදල් සැපැයුම හෙයින් මහ සමුළුවේ වැඩි අවධානය මුදල් සහ වෙළෙඳ ප්‍රශ්න කෙරෙහි යොමු විය. වසර 1992 - 2000 කාර්යාල උපකාර ලෙස දළ ජාතික නිෂ්පාදනයෙන් 0.7% සැපැයීමට සංවර්ධිත රටවල් මිහිතල සමුළුවේ දී එකඟ වුවත් මේ උපකාරය නොනැවැතී 0.33% සිට 0.22% දක්වා ආධාර සපයන රටවල් විසින් අඩුකර තිබේ. කාර්යාල උපකාර කෙරෙහි මහත් සේ බලාපොරොත්තු තබන, අඩුම මට්ටමේ සංවර්ධනයක් පවතින රටවලට මේ පහළ බැසීම බලපා තිබේ. මේ රටවලට ලැබෙන දිගුකාලීන උපකාරවලින් 90% පමණ මේ දීමනාවලට අයත් ය. කෙසේ වෙතත් මේ කාලසීමාවෙහි දී සෘජු විදේශ ආයෝජනය මහත්සේ වැඩිවී තිබේ. සංවර්ධනය වෙමින් පවතින රටවලට දුන් සෘජු විදේශ ආයෝජන එක්සත් ජනපද ඩොලර් බිලියන 36 සිට එක්සත් ජනපද ඩොලර් බිලියන 185 දක්වා 1991 සිට 1999 තෙක් වැඩිවී තිබේ. එහෙත් 2000 වන විට එය එක්සත් ජනපද ඩොලර් බිලියන 175 දක්වා පහළ බැස ඇත. කෙසේ වෙතත් මෙය ගෝලීය සෘජු විදේශ ආයෝජනයෙන් කුඩා ප්‍රමාණයක් පමණි. එම ආයෝජනය 2000 දී එක්සත් ජනපද ඩොලර මිලියන 1.1 ක් විය. 2000 දී සෘජු විදේශ ආයෝජනයෙන් 80% ක් ගියේ සංවර්ධනය වෙමින් පවතින රටවල් දහයකට පමණි. අඩුම සංවර්ධනය පවතින රටවලට සෘජු විදේශ ආයෝජනයෙන් ගියේ 2.5% පමණි. එහෙයින් ජගත් සමුළුවේ ප්‍රධාන නියත ප්‍රතිඵලවලින්, දිළිඳුකම මුලිනුපුටා දැමීමට පිහිටු වූ සහයෝගිතා අරමුදල අතිශයින් ආර්ථවත්ය.

සංවර්ධනය පිණිස මුදල් වැයකිරීමට මොන්ටෙරෙහි පැවැති අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි ප්‍රතිඵලවලට, දෝහා ප්‍රකාශනයට සහ දහසේ සංවර්ධන අරමුණුවලට රුකුල් දීමට ජගත් සමුළුව පොරොන්දු විය. කලාපීය සංවර්ධනයට අදාළ වැදගත් තීරනවලට, දිනක ආදායම ඩොලර 1 කට අඩු මිනිසුන්ගේ ගණන බාගයකින් අඩු කිරීම, එලෙස ම සාගින්නෙන් පෙළෙන මිනිසුන් ගේ ගණන අඩු කිරීමට, 2015 වන විට පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂාව ලැබිය යුතු අයට ඒවා ලබාදීම, කෘෂි ද්‍රව්‍ය ආධාර අපනයන යොග්‍ය ලෙස බෙදී යෑමට සැලසීම, ප්‍රධාන කණ්ඩායම් ශක්තිමත් කිරීම, හවුල්කාරයන්; රසායනික ද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු පාරිසරික ප්‍රශ්න පිළිබඳ වියදමට අනුකූලව ක්‍රියාකිරීම සහ වෙළෙඳාම සහ පරිසර ප්‍රශ්න ඇතුලත් විය.

යළි අලුත්කල හැකි බලශක්ති ඉලක්ක, පාෂාණ ඛණිජ බලය සඳහා ආධාර මුදල් වෙන්කිරීම, අයවැයන් සඳහා පැහැදිලි කාලසීමා සහිත ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීම, සංවර්ධිත රටවල ප්‍රබල මූල්‍යමය වගකීම ආදිය ගැන එකඟතාවකට එළඹීමට ජගත් සමුළුවට නොහැකි විය. ගෝලීකරණයෙන් සිදුවන සෘනාත්මක බලපෑම්වලින් සංවර්ධනය වෙමින් පවතින රටවල් ආරක්ෂා කිරීමට ජගත් සමුළුව අපොසත් වූ නිසා, සංවර්ධනය වෙමින් පවතින රටවල කලාපීය සංවර්ධනයට එය සැලකිය යුතු බලපෑමක් සිදුකරයි. සංවර්ධිත රටවල් විසින්, අඩුවෙන් ම සංවර්ධන වූ රටවල් අපනයනය කරන භාණ්ඩ සඳහා තීරුබදු සහන ඒකපාක්ෂික තීරණ අනුව පැනවීම ශ්‍රී ලංකාව වැනි මධ්‍යම - ආදායම් සහිත සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයනිකයන් කෙරෙහි බරපතල පසුබෑම් සිදුකළ හැකිය. අපනයන තීරුබදු සහන බුත්ති විඳින අඩුවෙන්ම සංවර්ධනය වූ රටවල් අපනයනිකයන් සමඟ සංවර්ධනය වෙමින් පවතින රටවල ලාභ ආන්තිකය අඩු අපනයන කර්මාන්තවලට තරග කළ නොහැකි වනු ඇත. ගෝලීය වෙළෙඳ ලිහිල්කරණය සාධාරණ හෝ පාරිසරික ව දැරියහැකි සංවර්ධන කරා හැම විට ම යොමු නොවන නිසා කෘෂිකර්ම ආධාර සම්ප්‍රදායික ගොවීන් කෙරෙහි සෘනාත්මක ව බලපානු ඇත.

ජගත් සහයෝගිතා අරමුදල සහ දිළිඳුකම මුලිනුපුටා දැමීමේ ඉලක්කවල ධනාත්මක ප්‍රතිඵල බුක්ති විඳීමට නම් රටට ම අයත් දිළිඳුකම අඩු කිරීමේ උපායමාර්ගයක් යොදා නොපමාව ක්‍රියා කිරීමෙන් රටේ කලාපීය සංවර්ධනයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි වනු ඇතැයි සමාලෝචනය අනුව යෝජිතය.

**ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් මහ සමුළුව ප්‍රධාන ලේඛන දෙකක් පිළිගත්තේ ය.**

* ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රකාශනය.
* ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් මහ සමුළුවේ ක්‍රියාකාරි සැලැස්ම.

**ධරණීය සංවර්ධනය පිළිබඳ ජගත් මහ සමුළුවේ ක්‍රියාකාරි සැලැස්ම.**

## හැඳින්වීම

**මේවාට කැපවීම යළි සහතික කිරීම :**

* රියෝ ප්‍රතිපත්ති, දහසේ ප්‍රකාශනයේ අරමුණු සහ 1992 සිට ඇති කරගත් එක්සත් ජාතීන්ගේ එකඟතා.
* පොදු වුවත් වෙනස් වූ වගකීම්.

**ධරණීය සංවර්ධනය පිළිබඳ පැතිරි ආවරණය වන අරමුණු සහ අවශ්‍ය වුවමනාවන්:**

* ආර්ථික සංවර්ධනය, සාමජයිය දියුණුව සහ පාරිසරික ආරක්ෂණය අනුකලනය.
* දිළිඳුකම් මුලිනුපුටා දැමීම.
* අස්ථාවර නිශ්පාදන සහ පරිභෝජන රටා වෙනස් කිරීම.
* ආර්ථික සහ සමාජ සංවර්ධනයෙහි ස්වාභාවික සම්පත් පදනම ආරක්ෂණය සහ කළ මනාකරණය.

**ජගත් මහ සමුළුවේ ප්‍රතිඵල ප්‍රයෝජනවත් විය යුතුය:**

* හැමෝටම.
* ගැහැණුනට.
* තරුණනට.
* ළමයිනට.
* වැඩිහිටි පිරිස්වලට.

**ක්‍රියාත්මක කිරීමේ දී:**

* සියලු අදාළ ක්‍රියාකාරින් සමඟ හවුල් වීම.
* උතුරේ සහ දකුණේ ආණ්ඩු සමඟ.
* ආණ්ඩු සහ ප්‍රධාන සමූහ සමඟ එක් වීම.

**ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ මනා පාලනය:**

* ඉස්තරම් පාරිසරික, සමාජයීය සහ ආර්ථික ප්‍රතිපත්ති.
* ජනතා වුවමනාවලට සැලකිලි දක්වන ප්‍රජාතන්ත්‍රවාදී ආයතන.
* නීතියේ මහිමය.
* දූෂණ විරෝධී පිළිවෙත්.
* ගැහැණු පිරිමි සමානාත්මතාව.
* අයෝජනවලට ඉඩ සලසන පරිසරය.

**දිළිඳුකම මුලිනුපුටා දැමීම.**

**2015 වන විට මෙය බාගයකට බැස්සීමට එකට සිදුකරන නියම යෙදීම හැම මට්ටමකින්ම අවශ්‍යය:**

* දිනක ආදායම ඩොලර් 1 කට අඩු ලොවේ වසන ජනයා ගේ අනුපාතය.
* සාගින්නෙන් පෙළෙන ජනයාගේ අනුපාතය.
* පිරිසිදු පානීය ජලය ලබාගත නොහැකි ජනයාගේ අනුපාතය.
* මූලික සනීපාරක්ෂාව ලබන ජනයාගේ අනුපාතය.

දිළිඳුකම මුලිනුපුටා දැමීම. ලෝක සහයෝගිතා අරමුදලක් පිහිටුවීම. ස්වෙච්ඡා දායකත්ව සහිත

**දිළිඳුවම ජීවත්වන ජනතාව සඳහා ජාතික වැඩසටහන් වර්ධනයට:**

* ඵලදායී සම්පත්.
* පොදු සේවා සහ ආයතන.
* ඉඩම්.
* ජලය.
* රැකියා සැලසීම.
* ණය.
* අධ්‍යාපනය.
* සෞඛ්‍යය.

තීරණ ගැනීමට ගැහැණුනට සමාන ඉඩකඩ සැලසීම සියලු මට්ටමේ අධ්‍යාපනයට පිරිමි සහ ගැහැණු ළමයිනට ඉඩකඩ සහතික කිරීම.

ගැහැණුනට සහ දේශීය මිනිසුනට කෘෂි සම්පත් ලබා ගැනීමට ඉඩකඩ සැලසීම.

ගැමි දුප්පතුන් සඳහා යටිතල පහසුකම්, ප්‍රවාහනය, වෙළෙඳ පොළවල්, තාක්ෂණ තොරතුරු සහ ණය සැපයීම.

ආහාර ඇති බව සහ - එය ලබාගත හැකි බව වැඩි කිරීම කාන්තාර බවට පත්වීම, නියඟ සහ ජලගැලීම් අවම කිරීම.

විශ්වාසදායක සහ ලබාගැනීමට පුළුවන් බලශක්ති සේවා ලබා ගැනීමට ඇති ඉඩකඩ වැඩිදියුණු කිරීමට එක්ව ක්‍රියා කිරීම.

නවීන ජෛව ඉන්දන තාක්ෂණ සහ ඉන්දන දැව සම්පත්වලට ඇති පිවිසුම වැඩි දියුණු කිරීම.

**කර්මාන්ත සංවර්ධනයට කරන දායකත්වය ශක්තිමත් කිරීම:**

- ✽ උපකාර සපයා සම්පත් සංවිධානය කිරීම.
- ✽ ආදායම් උත්පාදන වැඩි කරන රැකියා සඳහා උපකාර සැපයීම.
- ✽ ඉතා කුඩා, කුඩා සහ මධ්‍යම තරමේ කර්මාන්ත ප්‍රවර්ධනය.
- ✽ කුඩා පරිමාණයේ ආකර ව්‍යාපාරවලට මූල්‍ය සහ තාක්ෂණික ආධාර සැපයීම.
- ✽ පිසීම සහ වතුර උණුකිරීම පිණිස ඉන්ධන ඉතිරි කිරීම සඳහා අඩු වියදම් තාක්ෂණ යොදා ගැනීමට සංවර්ධනය වෙමින් පවතින රටවලට උපකාර සැපයීම.

"මුඩුක්කු නැති නගර" යෝජනාවට අනුව අඩු තරමින් දශලක්ෂ 1000 ක මුඩුක්කු වාසීන් ගේ ජීවන තත්ත්වය මහත් සේ වැඩි දියුණු කිරීම.

දැරිය නොහැකි පරිභෝජනය සහ නිෂ්පාදනය වෙනස් කිරීම.

නිෂ්පාදනයේ සහ පරිභෝජනයේ මූලික වෙනස්කම් නොකරම බැරිය.

කවුරුනුත් දැරියහැකි පරිභෝජනය ප්‍රවර්ධනය කළ යුතුය. මෙහි දී සංවර්ධන රටවල් නායකත්වය දිය යුතුය.

දැරියහැකි පරිභෝජනය සහ නිෂ්පාදනයට මාරුවීමට දහ අවුරුදු සැලැස්මක් සැකසිය යුතුය.

දූෂකයා ගෙවීමේ ප්‍රතිපත්තිය යෙදීම විද්‍යාව පදනම් වූ එළඹුමක් සහ ජීවන චක්‍ර විශ්ලේෂණය.

අර්ථවත් පරිභෝජන තොරතුරු සැපයීම වඩා පිරිසිදු නිෂ්පාදන වැඩසටහන් වලට අනුබල දීම සහ පිහිටුවීම.

**වඩා පිරිසිදු නිෂ්පාදනය.**

වඩා පිරිසිදු නිෂ්පාදනයට ආයෝජනය පිණිස රජය විසින් සපයන ණය, ඇරඹීම ප්‍රාග්ධනය, කාර්මික ආධාර සහ පුහුණුව දිරිගැන්වීම් ලෙස සැපයීම.

පාරිසරික වියදම අඩුකිරීමට සහ පිරිමසින උපකරණ පාවිච්චිය ප්‍රවර්ධනය කිරීම.

පාරිසරිකව අර්ථවත් තාක්ෂණ පැතිරවීමට අනුබල දෙන පොදු සැපයීම් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය.

**බලශක්තිය.**

රටේ නියම තත්ත්වය අනුව ධරණීය සංවර්ධනය පවත්වන ආධාර සැපයීම

වෙළෙඳ පොළ අවහිර අභිබවා බලශක්ති වෙළෙඳ පොළට ළංවීමට ඇති හැකියාව දියුණු කිරීම.

**දැරියහැකි ප්‍රවාහන උපායයක් ක්‍රියාත්මක කිරීමට:**

- ✽ හැකියාව, දක්ෂතාව සහ පහසුතාව දියුණු කිරීම.
- ✽ නාගරික වාතයේ තත්ත්වය සහ සෞඛ්‍යය දියුණු කිරීම.
- ✽ හරිතාගාර වායු පිටකිරීම අඩු කිරීම.
- ✽ බලය අතින් කාර්යක්ෂම බහු වර්ගයේ ප්‍රවාහණ ක්‍රමයක්.
- ✽ පිටිසර පෙදෙස්වලට වඩා හොඳ ප්‍රවාහන ක්‍රමයක්.
- ✽ සංවර්ධනය වන රටවලට මූල්‍යමය සහ කාර්මික ආධාර සැපයීම.

**අපද්‍රව්‍ය කළමනාකරණය:**

- ✽ අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කර යළි පාවිච්චිය සහ ප්‍රතිභාවිතය වැඩි කිරීම.
- ✽ යටිතල පහසුකම් වර්ධනය කිරීම.

**රසායනික ද්‍රව්‍ය කළමනාකරණය:**

- ✽ 2020 වන විට මිනිස් සෞඛ්‍යය සහ පරිසරය කෙරෙහි රසායනික ද්‍රව්‍යවල බලපෑම් අඩු කිරීම.
- ✽ 2003 වන විට PIC සම්මුතිය ක්‍රියාත්මක වීමට යොමු කිරීම.
- ✽ 2004 වන විට POP පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතිය ක්‍රියාවට නැගීම.
- ✽ 2005 වන විට රසායනික ද්‍රව්‍ය කළමනාකරණයට උපක්‍රමශීලී එළඹුමක් වර්ධනය කිරීම.
- ✽ 2008 වන විට මුළුමනින් ම මෙහෙයවන ගෝලීයව ඒකාග්‍රතාවකට පැමිණි රසායනික ද්‍රව්‍ය වර්ගීකරණක් සහ නම් සටහන් කිරීමේ ක්‍රමයක් ප්‍රවර්ධනය.
- ✽ නීති විරෝධී භයානක රසායනික ද්‍රව්‍ය වෙළෙඳාම වැළැක්වීම.

**ස්වාභාවික සම්පත් පදනම කළමනාකරණය:**

- ස්වාභාවික සම්පත් පදනම කළමනාකරණය අවශ්‍යය.
- දුප්පතුනට, ගැහැණුනට සහ පිරිමිනට ජලය සැපයීම අරමුණු කර ගෙන ජල කළමනාකරණය පිණිස ජාතික සහ අන්තර්ජාතික අරමුදල් සංවිධානය කිරීම.
- 21 වන න්‍යාය පත්‍රයේ 18 වන පරිච්ඡේදය ක්‍රියාත්මක කරවීමට අතිරේක මුදල් සම්පතක් සැපයීම.
- ජල දූෂණය අඩුකර අපද්‍රව්‍ය පිළියම් කරන දේශීය ක්‍රම වර්ධනය.
- 2005 වන විට ජල සම්පත් කළමනාකරණ සහ කාර්යක්ෂම ව ජලය භාවිත කිරීමේ අනුකලක සැලැස්මක් සංවර්ධනය කිරීම.
- බිම් ජලය, දිය බෙත්ම සහ ගංගාධාර අනුකලක ජාතික කළමනාකරණ උපායයක් වර්ධනය කර ක්‍රියාත්මක කිරීම.
- ජල සේවා, වෙළෙඳ සහ තොරතුරු සඳහා යන වියදම් අයකර ගැනීමට ප්‍රතිපත්තිමය නීතිමය ලේඛන යොදා ගැනීම.
- සම්ප්‍රදායික නොවන ජල සම්පත් යොදා ගැනීමට මුදල් ආධාර.
- 2003 පිරිසිදු ජලය පිළිබඳ අන්තර්ජාතික වසරයි.

**සාගර සහ මුහුදු පෙදෙස්:**

- ගෝලීය ආහාර සුරැකුම සඳහා සාගර, මුහුදු, දූපත් සහ වෙරළ බඳ පෙදෙස් ඉතා වැදගත් ය.
- 2010 වන විට දිය දමට හිතකර එළඹුම යොදා ගැනීමට අනුබල දීම.
- 2015 වන විට ඉහළ ම දැරියහැකි අස්වැන්න ලැබිය හැකි මට්ටමකට තොගය තබා ගැනීම හෝ යළි පිහිටුවා ගැනීම.
- 2005 වන විට මාළු ඇල්ලීමේ ප්‍රමාණය කළමනාකරණයට අන්තර්ජාතික ක්‍රියාකාරී සැලැස්මක් වර්ධනය කිරීම.
- 2004 වන විට අවිධිමත් සහ වාර්තා නොවූ සහ නීති විරොධී මාළු ඇල්ලීම් වැළැක්වීම, නැවැත්වීම සහ බැහැර කිරීමට අන්තර් ජාතික ක්‍රියාකාරී සැලැස්මක්.
- කාර්යක්ෂම නිරීක්ෂණය සහ එය ක්‍රියාත්මක කිරීමට යන්ත්‍රණයක් යෙදීම.
- අවිධිමත් සහ නීති විරෝධී මාළු ඇල්ලීමට සහායවන පිහිටාධාර ඉවත් කිරීම.
- සුළු පරිමාණයේ කෘෂිකර්මයට උපකාර GPA ක්‍රියාත්මක කිරීම - නගරසභා සීමාවෙන් මුහුදට බැසයන අපවිත්‍ර ජලය නිසා වෙරළ බඳ පෙදෙසට සිදුවන දූෂණය, භූමිභාගවල සිදුවන වෙනස් වීම් නිසා වාසභූමිවලට සහ පෝෂ්‍යජනක දැයට වන හානි 2002 - 2006 තුළ වැළැක්වීම.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2004 වන විට මුහුදු පරිසරය පිළිබඳ නියමිත SOE තක්සේරුවක් කිරීම.

**ආපදා කළමනාකරණය:**

- ආපදා අඩුකිරීම සඳහා වන අන්තර්ජාතික ක්‍රමෝපාය පිළිබඳ භාරකාර අරමුදලට මුදල් සැපයීම.
- අනතුරට ලක්විය හැකි දෑ තක්සේරු කිරීමට හැකියාව ගොඩ නැගීම.
- ජල ගැලීම් සහ නියඟයන් ඇතිවීමට ඇති ඉඩකඩ අඩු කිරීම.
- දේශගුණික බලපෑම්වලින් සිදුවිය හැකි ආපදා ඇගයීමට තිබෙන ක්‍රම සහ උපායයන් දියුණු කිරීම.
- බලපෑම් අඩු කිරීමට දේශීය දැනුම පාවිච්චියට අනුබල දීම.
- ජනතාව ම යොදාගන්නා ආපදා කළමනාකරණ දැනුම පාවිච්චියට රුකුල් දීම
- EL Nino සහ La Nina සඳහා කල්තියා අනතුරු අඟවන ක්‍රමය වර්ධනය.

**ගෝලී කරණය**

**ගෝලී කරණය අවස්ථා සහ අභියෝග ඉදිරිපත් කරයි**

**අවසථා :**

- ප්‍රාග්ධනය ගාලා වීමට සහ ආයෝජනයට, වෙළෙඳාමට නව අවස්ථා.
- තාක්ෂණය පිළිබඳ දියුණුවීම්.
- ජීවන තත්ත්ව දියුණු කිරීම සහ වර්ධනය.

**අභියෝග :**

- බලගතු මුදල් අර්බුද.
- අවදානම.
- දුප්පත් කම.
- සමාජ තුළ සහ ඉන් පිටත අසාධාරණය සහ බැහැර කිරීම.

**ගෝලීකරණය සහමුලින් ම සාධාරණ සහ කාටත් පොදු විය යුතුය :**

* විවෘත, සාධාරණ, නීත්‍යානුකූල, විශ්වාසී සහ වෙනස්කම් නොකරන බහු පාර්ශ්වීය වෙළෙඳ සහ මූල්‍ය ක්‍රමයක් ප්‍රවර්ධනය.
* දෝහා ප්‍රකාශනයට රුකුල් දෙන මොන්ටෙරි සම්මුතියට අනුබල දෙන ක්‍රමයක් විය යුතුය.
* වෙළෙඳ සංසන්දික නිකාවලට සහභාගිවීමට සංවර්ධනය වෙමින් පවතින රටවල හැකියා වර්ධනයට උදව් කළ යුතුය.

**සෞඛ්‍යය :**

* රෝගවලට හේතු සහ සංවර්ධනයට ඒවායේ බලපෑම කෙරෙහි යොමුවීම බලවත් අවශ්‍යතාවකි.
* දැරියහැකි සාධාරණ කාර්යක්ෂම සෞඛ්‍ය සේවා ක්‍රමයක් වර්ධනය කිරීම.
* "කාටත් සෞඛ්‍යය යන උපයා" සුදුසු ලෙස යෙදවීම.
* 2010 වන විට ගෝලීය මට්ටමින් සෞඛ්‍යය පිළිබඳ දැනුම ලබා දීමට සෞඛ්‍ය අධ්‍යාපනය සරුකිරීම.
* 2015 වන විට කුඩා දරුවන්ගේ (වයස 5ට අඩු) මිය යෑම තුනෙන් දෙකකින් අඩු කිරීමත්, 2000 තිබුණු මව්වරුන් ගේ මරණ ගණන හතරෙන් තුන දක්වා අඩු කිරීම.
* හැකියා ගොඩනගන අන්තර්ජාතික ආරම්භයන් ඇති කිරීම.
* ඒඩ්ස්, කාශරෝගය සහ මැලේරියාවට විරුද්ධව කරන සටනට යොදන ගෝලීය අරමුදල්වලට අවශ්‍ය ප්‍රමාණ සම්පත් සැපයීමට කැපවීම.
* ඛනිජ තෙල්වල තිබෙන ඊයම් ඉවත් කර හුස්ම ගැනීමේ අපහසුතා පිළිබඳ රෝග අඩු කිරීම, පිරිසිදු ඉන්ධන යෙදීම, ගැහැනුන් සහ ළමයින් සුරැකීමට, පිසීම සහ රත්කිරීමට ගැමි ජනතාවට සම්ප්‍රදායික ඉන්ධන ප්‍රභව වෙනුවට ඔවුනට ඔරොත්තුදෙන බලශක්ති සැපැයීම.

ආසියාවේ සහ ශාන්තිකරයේ ධරණීය සංවර්ධනය.

ලොවේ ජනගහණයෙන් අඩකට වැඩිය වසන, එහෙත් වැඩි ම ගණන දිළිඳුව ජීවත්වන පෙදෙස.

**කලාපීය සංවිධානය ආරම්භනයන් හතක් හඳුනාගෙන ඇත.**

* හැකියා ගොඩනැඟීම.
* දිළිඳුකම අඩුකිරීම.
* වඩා පිරිසිදු නිෂ්පාදනය සහ දැරියහැකි බලශක්තිය.
* ඉඩම් කළමනාකරණය සහ ජෛව විවිධත්ව සුරක්ෂණය.
* පිරිසිදු ජල සම්පත් ආරක්ෂණය, කළමනාකරණය සහ ඒවා ලබාගත හැකි වීම.
* වෙරළ බඳ සහ මුහුදු සම්පත්.
* වායුගෝලය සහ දේශගුණ විපර්යාසය.

**මුදල් :**

* අවශ්‍ය නම් සංවර්ධනය වෙමින් පවතින රටවලට සෑහෙන ODA වැඩිකිරීමක් ගැන සැලකිලිමත් වීම.
* FDI සඳහා සුදුසු වාතාවරණයක් ඇති කිරීම.
* සංවර්ධනය සඳහා මුදල් යෙදවීම පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි දී බැසගත් මුදල් පිළිබඳ වගකීම් ඉටුකිරීම.
* සංවර්ධනය වෙමින් පවතින රටවල ODA ය දළ ජාතික නිෂ්පාදනයෙන් 0.7 ඉලක්කයට තබා ගැනීමට උනන්දු කරවීම (1992 - 2000 දක්වා ODA ය දළ ජාතික නිෂ්පාදනයෙන් 0.33% සිට 0.22% දක්වා පහළ වැටිණ).
* විනිවිද පෙනෙන, සාධාරණ සහ ඇතුළත් විය හැකි ක්‍රමයක් මගින් අන්තර් ජාතික ආර්ථික තීරණ ගැනීමේ දී සංවර්ධනය වෙමින් පවතින රටවලට කාර්ය සාධකව සහභාගි වීමට අන්තර් ජාතික මුදල් පිළිබඳ ආකෘතිය ශක්තිමත් කිරීම.
* GEF පිළිබඳ කාර්ය පටිපාටි කාර්යක්ෂම කර එහි ව්‍යාපෘති ක්‍රියාවලිය ලිහිල් කිරීම.

**දැරිය නොහැකි ණය බර අඩුකිරීම :**

* ණය සහන.
* ණය කපා හැරීම.
* පැරිස් සහ ලන්ඩන් මණ්ඩල, සහ අනෙක් සාකච්ඡා මණ්ඩල තුළ ණය සහන ක්‍රියා පටිපාටි දැඩි ලෙස අනුගමනය කිරීම.
* මොන්ටෙරි සමාගිතයෙහි බාහිර ණය සහන.
* බාහිර ණය නිරීක්ෂණයට සහ කළමනාකරණයට ජාතික උපාය මාර්ග වර්ධනය.
* අන්තර්ජාතික ණයකාරයන් සහ ණය හිමියන් විසින් දැරිය නොහැකි ණය නැවත සැකසීම.
* ධරණීය සංවර්ධනයට ණය දීම වැනි ණය ගැටළුවලට නව යන්ත්‍රණ සෙවීම.

**වෙළෙඳාම :**

* 2001 - 2010 දක්වා අඩුවෙන් ම සංවර්ධනය වූ රටවල අපනයනයන් සඳහා තීරුබදු රහිත සහ 'කෝටා' වලින් නිදහස් ප්‍රවේශය.

* භාණ්ඩවලින් යැපෙන රටවල හැකියාව ගොඩනැගීම.

* දොහා අමාත්‍ය ප්‍රකාශනයට අනුව වෙළෙඳාම සහ පරිසරය පිළිබඳ WTO කමිටුව වගිකීම ඉටු කිරීම.

* පරිසරයට අහිතකර පිහිටාධාර ප්‍රතිසංස්කරණය.

* ඓන්ද්‍රීයා නිෂ්පාදිත ඇතුළු පරිසරයට හිතකර භාණ්ඩ සහ සේවා සඳහා වෙළඳ පල ඇතිකිරීමට උපකාර වීම.

* පාරිසරික අරමුණු පිණිස යොදාගන්නා පිළිවෙත් අන්තර්ජාතික වෙළෙඳාමට සැඟවුණු අවහිරයන් ලෙස නොයෙදිය යුතුය.

* දේශපාලනය බලපෑමට ආහාර සහ බෙහෙත් උපකරණ ලෙස නොයෙදීම සහතික කළ යුතුය.

**පාරිසරිකව ඉස්තරම් තාක්ෂණය :**

* පාරිසරිකව ඉස්තරම් තාක්ෂණය ප්‍රවර්ධනය සහ ඒයට වියදම් කිරීම.

* වැඩදායක පරිසරය ඇති කිරීම - නීතිමය සහ ප්‍රතිපත්තිමය.

* සරසවි, ආණ්ඩු සහ පෞද්ගලික අංශය අතර සම්බන්ධය වැඩි දියුණු කිරීම.

* තාක්ෂණික අවශ්‍යතා තක්සේරු කිරීමට ආධාර සැපයීම.

* රජයේ අරමුදල් ලබන පර්යේෂණ වලට උදව් දීම.

**අධ්‍යාපනය :**

* දහසේ ප්‍රකාශනය ප්‍රාර්ථනා කරන විශ්ව ප්‍රාථමික ආධ්‍යාපනය ඉටුකරගැනීම.

* 2015 වන විට සියලු පිරිමි සහ ගැහැනු ළමයිනට සම්පූර්ණ ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම.

* අධ්‍යාපනය, පර්යේෂණය සහ ජනතා දැනුවත්කම සඳහා අරමුදල් සැපයීම.

* කාටත් අධ්‍යාපනය දීමේ ක්‍රියාකාරී ඛකා සැලැස්මට අරමුදල් සැපයීම.

* 2005 වන විට ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයෙහි ගැහැනු පිරිමි භේදය ඉවත් කිරීම සහ 2015 වන විට හැම මට්ටමක ම එම භේදය ඉවත් කිරීම.

* ධරණීය සංවර්ධනය අධ්‍යාපනයට අනුකලනය කිරීම.

* පර්යේෂකයන් ගේ වැඩ සටහන් හුවමාරුව.

* 2005 වන විට අධ්‍යාපන දශකයක් යොදා ගැනීම.

**ජගත් මහ සමුළුවට එකඟවිය නොහැකි වූ කරුණු :**

* යළි අලුත්කළ හැකි බලශක්ති ඉලක්ක.

* ජෛව ඛනිජ බලශක්ති පිහිටාධාර අතරවාරගත කිරීම.

* අයවැය සහ පැහැදිලි කාලසීමා සහිත ක්‍රියාකාරී සැලැස්ම.

* සංවර්ධිත රටවල ප්‍රබල මූල්‍ය වගකීම්.

* ගෝලීකරණයෙන් සිදුවන සෘණාත්මක බලපෑම් වලින් රටවල් සුරැකීම.

**කලාපීය සංවර්ධනයට සිදුවන බලපෑම් :**

* සංවර්ධිත රටවල් විසින් LDC වලින් කරන අපනයනයන් සඳහා දෙන තීරුබදු සහන ශ්‍රී ලංකාව වැනි මධ්‍යම - අදායම් පවතින සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයන කරුවන් කෙරෙහි බලවත් පසුබෑම් සිදුකළ හැකිය.

* ගෝලීය වෙළෙඳ ලිහිල්කරණය හැම විටම සාධාරණ, යුක්තිගරුක සහ හෝ පාරිසරිකව දැරියහැකි සංවර්ධනයකට මග නොපෑදෙන නිසා, කෘෂිකර්ම පිහිටාධාර අතරවාර ගත කිරීම සම්ප්‍රදායික ගොවීන් කෙරෙහි සෘණ බලපෑම් සිදුකළ හැකිය.

* කාල නියමිත දිළිඳුකම මුලිනුපුටා දැමීමේ, ජලය සහ සනීපාරක්ෂාව සැපයීමේ වැඩ සටහන් කලාපීය සංවර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑම් ඇතිකළ හැකිය.

**රෙකමදාරු :**

* ලෝක සහයෝගතා අරමුදල සහ දිළිඳුකම මුලිනුපුටා දැමීමේ ඉලක්කවල ධනාත්මක ප්‍රතිඵල බුක්ති විඳීමට නම් දිළිඳුකම අඩුකරන ප්‍රබල ක්‍රමෝපායයක් වර්ධනය කළ යුතුය.

* නිෂ්පාදනවල තත්ත්වය දියුණු කිරීමෙන් සහ අන්තර්ජාතික වශයෙන් තරගකාරී හොඳ වෙළෙඳ නමක් නංවා ගැනීමෙන් තර්ජන වළකාගත හැකිය.

# දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් සමුළුවෙන් ශ්‍රී ලංකාවට සලසාගත හැකි සෙත

තොසපාල හේවගේ
ලේකම් - පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවරදී මෑතදී පැවැත්වුණු ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවට පසු සමස්ත ලෝකයම ධරණීය සංවර්ධනය පිළිබඳව කථාබහ කරති. 1992 දී පැවැති එක්සත් ජාතීන්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ සමුළුවේ දස වසරක සමාලෝචන කටයුතු පැවැත්වීම උදෙසා 2002 අගෝස්තු 26 සිට සැප්තැම්බර් 4 දක්වා දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවරදී ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව පැවැත්විණි. රාජ්‍ය නියෝජිතයන් 20,000 කට අධික පිරිසක් සහ රාජ්‍ය නොවන සංවිධාන දහස් ගණනක හා පෞද්ගලික අංශ වල නියෝජිතයන් සහභාගී වූ මෙම ලෝක සමුළුවට සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත පිරිසේ සාමාජිකයෙකු වීමේ අවස්ථාව මා හට උදාවිය. මා කථා කළ යුතු වූ විශේෂිත මාතෘකාවක් නොමැති වූ හෙයින් "දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවර පැවැති ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ ප්‍රතිඵල මගින් ශ්‍රී ලංකාවට සෙත සැලසෙන්නේ කෙසේද යන්න සහ අධ්‍යාපන ආයතන සහ වෘත්තිකයන්ගේ කාර්යභාරය" යන මාතෘකාව මෙහිදී පහත සඳහන් උප මාතෘකා යටතේ විමර්ශණයට ලක්වේ.

මාගේ කථාව පහත දැක්වෙන මාතෘකා යටතේ සකස් වී ඇත.

* ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළු ක්‍රියාවලිය පිළිබඳ කෙටි විස්තරයක්
* කලාපීය ප්‍රමුඛතා.
* ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා.
* ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවෙන් ලද ප්‍රධාන ප්‍රතිඵල.
* මෙකී ප්‍රතිඵල ක්‍රියාවට නැංවීමෙහි ලා අධ්‍යාපන ආයතන හා වෘත්තිකයන් සතු කාර්යභාරය.

මේ අවස්ථාවේදී ලෝක සමුළුව විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ කෙටි විස්තරයක් කිරීමට සහ ලෝක ධරණීය සංවර්ධන අරමුණු ඉටු කරගැනීම උදෙසා ගන්නා ලද තීරණ පිළිබඳව හැඳින්වීමට අපේක්ෂා කරමි.

ප්‍රථම මිහිතල සමුළුව 1992 දී රියෝ ද ජැනෙයිරෝ නුවරදී මීට වසර 10 කට පමණ පෙර පැවැත්වූ බව අපි සියලු දෙනාම දනිමු. මෙහි ප්‍රධාන ප්‍රතිඵල වූයේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය හා විශ්වීය, කලාපීය හා ජාතික මට්ටමෙන් ධරණීය සංවර්ධනය ළඟා කර ගැනීම උදෙසා මග පෑදූ 21 වන න්‍යාය පත්‍රයයි. ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව යනු රියෝ මිහිතල සමුළුවේ දසවන සංවත්සරයයි.

ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව පැවැත්වීමට පෙර, එම සමුළුව සඳහා අවශ්‍ය ලියකියවිලි සහ අනෙකුත් සංවිධාන කටයුතු සූදානම් කරනු පිණිස සූදානම්වීමේ කමිටුවේ සැසිවාර 4ක් පැවැත්විණි. කලාපීය වශයෙන්, අන්තර් - ආණ්ඩු වශයෙන් හා අමාත්‍යාංශ වශයෙන් රැස්වීම් 5 ක් පවත්වා ඇත. ආසියානු සහ පැසිපික් කලාපීය සූදානම්වීමේ කමිටුව 2001 නොවැම්බර් 27 සිට 29 දක්වා කාම්බෝජයේ ෆොනොම් පෙන්හි දී (Phonom Penh) පැවැත්විණි. මීට අමතරව, කලාපීය උපදේශක රැස්වීම් කිහිපයක්ද පවත්වන ලදී. දකුණු ආසියාවේ උප කලාපීය රැස්වීම් 2001 නොවැම්බර් මසදී කොළඹදී පැවැත්විණ. රටවල් මට්ටමෙන් සමාලෝචන පැවැත්වීමත් අවබෝධය නැංවීමත් සහ පාර්ශ්වකරුවන් එක්රැස් කිරීමත් සඳහා ජාතික සූදානම්වීමේ කමිටු පිහිටුවන ලදී. ධරණීය සංවර්ධනය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් ලියවිලි

දෙකක් එනම්, රටෙහි පැතිකඩක් සහ ජාතික තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කිරීමට සෑම රටකම සූදානම්වීමේ කමිටු වලින් ඉල්ලීමක් කරන ලදී.

**කලාපීය ප්‍රමුඛතා**

කලාපීය සූදානම්වීමේ රැස්වීම් වලදී විවිධ ගැටළු පැනනැඟිණි. ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේදී පැන නැඟුණු කලාපීය ප්‍රමුඛතා වල වෙනස්කම් සැළැකිල්ලට නොගත් අතර, සැළකිල්ලට ගනු ලැබූ පොදු කරුණු විය.

- ★ ප්‍රථමයෙන්ම, අන්තර්ජාතික ප්‍රජාව 21 වන න්‍යාය පත්‍රය ඉක්මනින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමු කළයුතු බවට සහ ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව විසඳුම් සෙවීමේ අදියරයක් වශයෙන් සැළකිය යුතු බව සියලුදෙනා විශ්වාස කරති.
- ★ දෙවනුව, ධරණීය සංවර්ධනයේ මිනුම් වන ආර්ථිකය, සමාජය හා පරිසරය යන ත්‍රිත්වයේ ඒකීයකරණය විශේෂකොට දැක්විය යුතුය.
- ★ තෙවනුව සාධාරණත්වය සහ ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය වන්නා වූ ගෝලීයකරණය වැනි නව ස්වභාවයන් තිබේ.
- ★ සිව්වනුව, ධරණීය සංවර්ධනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රගතිය කඩිනම් කළහැකි භාරදිය හැකි දේ සහ ඇතැම් මූලික අරමුණු සම්බන්ධයෙන් මෙම සමුළුව අවධානය යොමු කළ යුතුය.

ලෝක ධරණීය සංවර්ධනය ළඟාකර ගැනීමේදී, සියලුම කලාපීය රැස්වීම් වලදී පොදු කාර්යයන් වලට පහත කරුණු ඇතුළත් වේ. එනම්, රියෝ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ගෝලීයකරණය, දිළිඳු බව සහමුලින්ම උපුටා දැමීම, ධරණීය පරිභෝජනය හා නිෂ්පාදනය, ස්වභාවික සම්පත් කළමනාකරණය, කෘෂිකර්මය සහ ආහාර ආරක්ෂණය, ශක්තිය, පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව, තිරසාර මානව පදිංචිවීම්, සෞඛ්‍යය, මානව සංවර්ධනය, මූල්‍යකරණය හා ධරණීය සංවර්ධනය, වෙළඳාම හා වෙළඳපොල ප්‍රවේශය, තාක්ෂණය බෙදාහැරීම සහ ශක්‍යතා වර්ධනය, පාලනය/ධරණීය සංවර්ධනය සඳහා ආයතනික ව්‍යුහය, තීරණ සම්පාදනය හා තොරතුරු අවශ්‍යතා.

සියලුම කලාපීය රැස්වීම් වලදී ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේදී සැළකිල්ලට ගතයුතු පහත පොදු කරුණු පිළිබඳව යෝජනා කෙරිණි.

**1. ගෝලීයකරණය:-**

ගෝලීයකරණය සාධාරණ, ධරණීය හා විශේෂිත සීමාවන් ඇතුළත් කිරීම, වෙළඳාම, මූල්‍ය, ආයෝජනය හා තාක්ෂණය යන අංශ වල විශේෂිත නව පිවිසුම් සඳහා ඇති අවශ්‍යතාව මත උද්යෝගය නැංවී ඇත. ගෝලීයකරණය ධරණීය සංවර්ධනය උදෙසා හැඩගැස්වීමේ ක්‍රම සහ විධි පිළිබඳව මෙම සමුළුවේ ඉලක්කය වියයුතු බව සියලුදෙනා විශ්වාස කරති.

**2 දිළිඳුකම මුලිනුපුටා දැමීම :-**

වසර 2015 වන විට දිළිඳු බව අඩකින් පමණ අඩු කිරීමේ සහස්‍ර ප්‍රකාශන අරමුණු ඉටුකරගැනීම සඳහා දායක විය යුතු බවට සමුළුවෙන් අපේක්ෂා කරන ලදී. පරිසරය, දිළිඳුබව, වෙළඳාම සහ මානව ආරක්ෂාව යන අංශ අතර සම්බන්ධතා පිළිබඳව අවබෝධය ඉහළ නැංවීමටද මෙමගින් අපේක්ෂා කෙරේ.

**3. කෘෂිකර්මය සහ ආහාර ආරක්ෂණය :-**

ධරණීය කෘෂිකර්මය හා ග්‍රාමීය සංවර්ධනය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳ අවධාරණය කෙරේ.

**4. ශක්තිය :-**

සමුළුව මගින් ශක්තිය සඳහා විශ්ව ප්‍රවේශය ඉහළ නැංවේ. අලුත්වැඩියා කළහැකි හා දරාගත හැකි අන්දමේ ශක්තිය භාවිතය ඉහළ නැංවීමෙහිලා විශේෂ මුලපිරීම්.

**5. පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව :-**

ජලය සහ සනීපාරක්ෂක සේවාවන් ලබාගැනීමේ සහස්‍ර ප්‍රකාශන ඉලක්කය ඉටුකර ගැනීම සහ සමෝධානික ජල කළමනාකරණය ඉහළ නැංවීම.

**6. සෞඛ්‍යය :-**

සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන නව ක්‍රියාමාර්ග සමස්ත දිළිඳුබව අවම කිරීම සහ ධරණීය සංවර්ධනය පිළිබඳ උපාය මාර්ග වල කොටසක් විය යුතුය.

**7. මානව සංවර්ධනය :-**

අධ්‍යාපනය, පුහුණු කිරීම, රැකියා, ස්ත්‍රී - පුරුෂ වශයෙන් ප්‍රමුඛතාවක් ලබාගැනීම තරුණ සංවර්ධනය යන අංශ හා සම්බන්ධ ගැටලු විශේෂ කොට දැක්විය යුතුයි.

**8. ධරණීය සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් :-**

මූල්‍ය පහසුකම් සපයා ගතහැකි සියලුම මාර්ග එක්රැස් කිරීම, විදේශ සංවර්ධන ආධාර වශයෙන් සංවර්ධිත රටවල දළ ජාතික නිෂ්පාදිතය වන 0.7% ක ඉලක්කය සපුරා ගැනීම. අන්ත දිළිඳු රටවල ණය කපාගැනීම, මූල්‍ය පහසුකම් සලසා ගැනීමේ නව මාර්ග වැදගත් කොට සළකන ලදී.

**9. තාක්ෂණය සැපයීම සහ ශක්‍යතා වර්ධනය**

තාක්ෂණය ලබාදීමේ ඵලදායී ක්‍රම සහ ශක්‍යතා වර්ධනය ඉහළ නැංවීමේ ක්‍රම ඇතිකරලීම උදෙසා සමුළුව සහාය ලබාදිය යුතුය.

**10. තීරණ ගැනීම සහ තොරතුරු අවශ්‍යතා :-**

ධරණීය සංවර්ධනය පිළිබඳ ප්‍රගතිය මෙහෙයවීම සඳහා ඵලදායී සහභාගිත්වය සහ සංවර්ධන පියවර.

**ශ්‍රී ලංකාවේ වත්මන් ප්‍රමුඛතා :-**

ධරණීය සංවර්ධනය පිළිබඳ අපගේ ජාතික අරමුණු ඉටුකර ගැනීමේදී ඇතිවන මූලික බාධාවන් හඳුනා ගැනීමේදී දිළිඳුබව මුලිනුපුටා දැමීම, පාරිසරික පරිහානිය වැළැක්වීම, යළි සාමය ස්ථාපිත කිරීම, ගැටුම් විසඳීම සහ සමගිය ඇති කිරීම ආදිය වත්මන් ප්‍රමුඛතා ලෙස හඳුනාගෙන ඇත.

**දිළිඳු බව :-**

දිළිඳු බව පිළිබඳ ගැටලුව වෙත අවධානය යොමු කිරීමේදී දිළිඳු බව වර්ධනය කිරීමට මුල්වන දේ පාලනය කිරීමට, ජීවන වෘත්ති උසස් කිරීමට, ආදායම් වර්ධනය කිරීමට සහ අත්‍යවශ්‍ය සේවා වලට ප්‍රවේශවීම පිළිබඳව සහතික කිරීමට නව උපායමාර්ගික නව පිවිසුම් අවශ්‍ය වේ. මෙකී අන්තර්ගතය තුළ පහත සඳහන් මූලික අංශ පිළිබඳව දිළිඳු බව අවම කිරීමේ උපාය මාර්ගය සැළකිය යුතු ලෙස අවධාරණය කෙරේ.

* ස්ථිර හා විශාල ආර්ථික පරිසරයක් පවත්වා ගැනීම මගින් විශ්වාසය ඉහළ නැංවීම.

* දිළිඳු ප්‍රදේශ තරඟකාරී වෙළඳ පොළවල් හා සම්බන්ධ කිරීමෙන් වෙළඳපොල ප්‍රවේශය වැඩිදියුණු කිරීම.

* බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යාන්ත්‍රණයක් සැකසීම.

* සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා පුළුල් වෙළඳ පොළ ප්‍රවේශය සහ ඵලදායීතාව ඉහළ නැංවීම දිරිමත් කිරීම.

* පුළුල් ලෙස පදනම් වූ ග්‍රාමීය සංවර්ධනය, තරඟකාරී කාර්මිකරණය, සේවා අංශයේ සංවර්ධනය සහ මනා නාගරික පදිංචිවීම් දිරිමත් කිරීමෙන් හා දිළිඳු ජනතාව සඳහා ධරණීය තක්සේරු පදනමක් නිර්මාණය කිරීමෙන් ව්‍යුහාත්මක වෙනස්කමෙන් දිළිඳු ජනතාවට ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථා සැලසීම.

* ගුණාත්මක බවෙන් යුත් අධ්‍යාපනයට හා සෞඛ්‍යාරක්ෂාවට ප්‍රවේශවීම වැඩිදියුණු කිරීම.

* ආරක්ෂිත පානීය ජලය, සනීපාරක්ෂාව, විශ්වාස කළහැකි ශක්ති ප්‍රභව මූලික මිනිස් අවශ්‍යතා වැනි ආරක්ෂිත ප්‍රවාහන ක්‍රම ආදිය ලබා ගැනීම වැඩි දියුණු කිරීම.

* දිළිඳු බව අවම කිරීමේ ක්‍රියාවලියේ ධරණීය බව ඉහළ නැංවීමට නව මාදිලියේ පරිසර කළමණාකරණය.

* තාක්ෂණ සංවර්ධනය : ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය මත යැපෙන්නා වූ ග්‍රාමීය දිළිඳු ජනතාවගේ විෂම චක්‍රය බිඳ හෙළීමෙහි ලා ධනාත්මක බලපෑමක් ඇති පසු අස්වනු හා නිෂ්පාදන තාක්ෂණ ක්‍රම සඳහා සහාය.

* ජෛව සම්පත් සොරකම් කිරීම සාම්ප්‍රදායික දැනුම හා ස්වදේශීය දැනුම් ක්‍රම ආදිය පිළිබඳව ගොවියන්ගේ අයිතිවාසිකම් ආදිය පිළිබඳ අන්තර්ජාතික නියෝජ්‍යායතන අතර දැනුවත් බව ඇතිකිරීම. ලෝක ප්‍රජාව අතර විශේෂයෙන්ම ලෝකයේ වත්කම් පිළිබඳව ආයෝජනය කරන ලෝක පාරිසරික අරමුදල් සැපයීමේ නියෝජ්‍යායතන අතර දැනුවත්බව ඇති කිරීම, පාරිසරික ප්‍රතිලාභ ලබාගැනීම සඳහා වැදගත් වේ.

* සීමිත සම්පත් සහිත ප්‍රදේශ වල සිටින දිළිඳු ජනතාව පිළිබඳ සැළකිල්ල යොමු කිරීම.

**පරිසර හායනය**

පරිසරය පරිහානියට ලක්ව ඇති ප්‍රදේශ කීපයක් ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම (NEAP) (1998 - 2001) මගින් හඳුනාගෙන ඇත. මේවාට වනාන්තර ඇතුළු භූමිය, ජලය, වාතය, ජෛව විද්‍යාත්මක විවිධත්වය, වෙරළාශ්‍රිත ප්‍රදේශ හා නිර්මිත පරිසරය ඇතුළත් වේ. ධරණීය නොවන

කෘෂිකාර්මික පුරුදු, ඛණිජ සම්පත් අහිතකර ලෙස භාවිතයට ගැනීම, වාහන වලින් පාලනයක් නොමැතිව පිටවන විමෝචන ද්‍රව්‍ය, බලශක්ති යන්ත්‍රෝපකරණ හා කර්මාන්ත, පිළියම් නොකරන ලද කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීම. උපද්‍රවකාරී ද්‍රව්‍ය ඇතුළු ඝන අපද්‍රව්‍ය ඉවක්බවක් නැතිව බැහැර කරලීම ආදිය පරිසර හායනයට හේතුවේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සෞඛ්‍යයට බලපෑම් එල්ල වී ඇත: දිළිඳු ගොවීන් අන්ත දිළිඳු බවට පත්ව ඇත; ජීවිතයේ සාමාන්‍ය ස්වභාවය පිරිහීමට ලක්ව ඇත. එබැවින් පහත පියවරවල් කෙරෙහි වහාම අවධානය යොමුවිය යුතුය.

- ජංගම සම්පත්, ලිපිද්‍රව්‍ය සහ ගෘහස්ථ කටයුතු හා සම්බන්ධ වායු දූෂණ ගැටලු වෙත වහාම අවධානය යොමු කිරීම.
- නාගරික ප්‍රවාහන සේවා සඳහා විදුලි වාහන වැනි පවිත්‍ර ශක්ති සම්පත් හඳුන්වාදීම.
- පරිසර හිතකාමී ශක්තිය මගින් බලය සැපයෙන අධි හුවමාරු ක්‍රියාවලියක් සැකසීම.
- නාගරික හා ග්‍රාමීය සනීපාරක්ෂක පහසුකම් ඇතිකිරීම.
- ධරණීය පරිභෝජනය හා එහි ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් බව ඇතිකිරීම.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික උපාය මාර්ගය තුළ හඳුනාගත් පරිදි දේශීය පළාත් හා ජාතික මට්ටම සඳහා සමෝධානික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ඇතිකිරීම.
- පවත්නා පාරිසරික රෙගුලාසි ශක්තිමත් කිරීම හා අවශ්‍ය වන පරිදි නව ප්‍රතිපත්ති හා රෙගුලාසි කෙටුම්පත් කිරීම.
- නව මාදිලියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපක්‍රම ඇතිකිරීම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම. එවැනි ක්‍රියාකාරකම් සඳහා දිරි ගැන්වීම ප්‍රතිපාදන ලබාදීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පෞද්ගලික අංශයේ මුල්පිරීම් ප්‍රවර්ධනය කිරීම.
- පාංශු සංරක්ෂණය වැඩිදියුණු කිරීම භූමි හායනය කළමනාකරණය කිරීමට කාබනික කෘෂිකර්මය හා යහපත් වෙළඳ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම.
- ජෛව සම්පත් කොල්ලකෑමෙන් ජෛව විද්‍යාත්මක සම්පත් ආරක්ෂා කිරීමට ජෛව සම්පත් පිළිබඳව සොයා බැලීමේ සහ නීතිමය පියවර ගැනීම.
- භූමිය පදනම්කරගත් ක්‍රියාකාරකම් වලින් වෙරළාශ්‍රිත සහ මුහුදුබඩ සම්පත් ආරක්ෂා කිරීමට පියවර ගැනීම.
- දේශගුණික විපර්යාස වලින් ඇතිවන බලපෑම් වලට අනුවර්තන උපාය මාර්ග ඇති කිරීම.
- පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය යටතේ කාබන් කර්මාන්තය සඳහා ජාතික උපාය මාර්ග සැකසීම.

**සාමය, ගැටුම් සමථයකට පත්කිරීම හා සමගි සන්ධානය**

ධරණීය සංවර්ධනය කරා අප යන ගමනේදී අභ්‍යන්තර ගැටුමට පිළිගත හැකි අන්දමේ විසඳුමක් ලබාගැනීම ඉතා වැදගත් වේ. එබැවින් සමස්ත ප්‍රජාව සඳහා මිත්‍රශීලි අයුරින් පිළිගතහැකි විසඳුමකට එළඹීමේදී පහත පියවර පිළිබඳ සැළකිල්ලට ගැනීමට අවශ්‍ය වේ.

- ජාතික ඒකමතිකභාවය සහ සමගි සන්ධානය යොදාගැනීමේදී සහ වර්ධනය හා ධරණීය සංවර්ධනය වැඩි දියුණු කිරීමේදී මනා පාලනය හා ප්‍රජා සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ.
- මහජන සහභාගිත්වය වැඩිදියුණු කිරීමෙන් ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා විනිවිදභාවයක් ඇතිකර ගැනීම මගින් යහපත් පාලනය ප්‍රවර්ධනය කළයුතු ය.
- ජාතික ඒකමතිකභාවය ගොඩනැංවීමෙහි ලා විවිධ පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරය පැහැදිළිවම අවබෝධ කරගත යුතු අතර එම ක්‍රියාවලියෙන් කිසිදු පාර්ශ්වකරුවෙකු මග නොහැර යොදාගත යුතුය.
- කිසිදු අදහසක් බැහැර කරනවාට වඩා ප්‍රතිපත්ති ඇතුළත් කර ගනිමින් වඩාත් විනිවිදභාවයකින් යුක්තව සාම ක්‍රියාවලිය ඉදිරියට ගෙනයෑම.

**ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ ප්‍රධාන ප්‍රතිඵල**

ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව මගින් ප්‍රධාන ලේඛන 2ක් සකස් කරගන්නා ලදී. ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව ක්‍රියාත්මකවීමේ සැලැස්ම සහ ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රකාශනය. ප්‍රධාන ප්‍රතිඵල වලට ඌනපූරක වන්නා වූ සමුළුවේ II වර්ගයේ

ප්‍රතිඵල වශයෙන් ලෝක ධරණීය සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මකකිරීම ශක්තිමත් කිරීමට සහයෝගිත්ව නව පිවිසුම් කට්ටලයක්ද සකස් කරගන්නා ලදී. සමුළුවේ මෙම තීරණ සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත මිශ්‍ර බලපෑම් ඇති කරයි. ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට සම්බන්ධ ගැටලු පමණක් මම මෙහිදී සංක්ෂිප්තව ඉදිරිපත් කරමි.

## ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම මගින් සියලුම කලාපීය ප්‍රමුඛතා හා කාර්යයන් එහි තීරණ වලට ඇතුළත් කිරීමට ප්‍රයත්න දරණ ලදී. මේ මත පදනම්ව සමුළුව රියෝ ප්‍රතිපත්ති, සහස්‍ර ප්‍රකාශනයේ අරමුණු සහ 1992 සිට සම්මත කරගත් එක්සත් ජාතීන්ගේ අනෙකුත් ගිවිසුම් - විශේෂයෙන්ම දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලාකෘති සම්මුතිය, ජෛව විද්‍යාත්මක විවිධත්වය පිළිබඳ සම්මුතිය, වන සම්පත් මූලධර්ම පිළිබඳ ප්‍රකාශනය ධරණීය සංවර්ධනය සඳහා මූල්‍ය සපයාගැනීම පිළිබඳ මොන්ටරේරි ගිවිසුම, වෙළඳාම හා පරිසරය පිළිබඳ දෝහා ප්‍රකාශනය සහ සහස්‍ර සංවර්ධන අරමුණු ආදිය සඳහා දී ඇති ප්‍රතිඥාව නැවත තහවුරු කළේය.

රියෝ මිහිතල සමුළුවේදී සම්මත කරගත් පොදු මූලධර්මය එහෙත් වෙනස් ආකාරයේ වගකීම් වලට දී ඇති ප්‍රතිඥාව සමුළුව මගින් නැවත තහවුරු කෙරිණි. ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව ධරණීය සංවර්ධනයේ පුළුල් අරමුණු හා අත්‍යවශ්‍ය අංග වන්නේ ආර්ථික සංවර්ධනයේ සමෝධානික බව; සමාජ සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව; දිළිඳු බව මුලිනුපුටා දැමීම; ධරණීය නොවන නිෂ්පාදන හා පරිභෝජන රටා වෙනස් කිරීම; ස්වාභාවික සම්පත් පදනම ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සහ ආර්ථික සහ සමාජ සංවර්ධනය ආදියයි.

ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම මගින් පහත දේ පැහැදිලිවම යෝජනා කෙරේ.

- මෙම සමුළුවෙන් ලැබෙන ප්‍රතිඵල විශේෂයෙන්ම කාන්තාවන්ට තරුණයන්ට, ළමයින්ට සහ පහසුවෙන් පීඩාවට ලක්වන කණ්ඩායම් සඳහා ප්‍රතිලාභ සැලසිය යුතුය.
- ධරණීය සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම අදාළ ක්‍රියාකාරීන්ගේ උතුරු, දකුණු, ආණ්ඩු වල, ආණ්ඩු සහ ප්‍රධාන කණ්ඩායම් වල සහයෝගීත්වය අවශ්‍ය වේ.
- මෙම ක්‍රියාත්මක කිරීම් ජාතික හා අන්තර්ජාතික මට්ටමේ යහපත් පාලනය මත මනා පාරිසරික සමාජ හා ආර්ථික ප්‍රතිපත්ති මත, මිනිස් අවශ්‍යතා වලට ප්‍රතිචාර දක්වන ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, නීති ක්‍රම දූෂණය පිටු දැකීමේ පියවර, ස්ත්‍රී - පුරුෂ සමභාවය සහ ආයෝජන සඳහා පරිසරයට ශක්තිය ලබාදීම ආදිය මත පදනම් විය යුතුය.

ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ තීරණ මගින්, සංවර්ධනය වෙමින් පවතින රටවල ධරණීය සංවර්ධනයට අදාළ ගැටලු විශාල පරාසයක් ආවරණය කෙරේ. මීට, දිළිඳුබව මුලිනුපුටා දැමීම, පරිභෝජන හා නිෂ්පාදන රටා, ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම, ජෛව විවිධත්වය, සෞඛ්‍යය, පානීය ජල සැපයුම, සනීපාරක්ෂාව, ශක්තිය, ගෝලීයකරණය, වෙළඳ ගැටලු, කෘෂිකර්මය, යහපත් පාලනය, ආයතනික මූලාකෘතිය හා මූල්‍ය ගැටලු මීට ඇතුළත් වේ. දිළිඳු බව මුලිනුපුටා දැමීම, ජල සැපයුම හා සනීපාරක්ෂාව ආදිය පිළිබඳ කාලීන වැඩසටහන් වලට කලාපීය සංවර්ධනය මත ධනාත්මක බලපෑම් තිබිය හැකිය.

මොන්ටරේරිහිදී පවත්වන ලද, සංවර්ධනය සඳහා මූල්‍ය සපයා ගැනීම පිළිබඳ අන්තර්ජාතික සමුළුව, දෝහා ප්‍රකාශනය හා සහස්‍ර සංවර්ධන අරමුණු ආදියේත් ප්‍රතිඵල සඳහා සහයෝගය දීමට සමුළුව පොරොන්දු විය. කලාපීය සංවර්ධනය හා සම්බන්ධ වැදගත් තීරණ වලට, දිනකට ඩොලර් 1 කට වඩා අඩු ආදායමක් ලබන ලෝකයේ ජන සංඛ්‍යාව සහ ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති ජන සංඛ්‍යාව 2015 වන විට අඩකින් පමණ අඩු කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදිත වල සියලුම ආකාරයේ අපනයන සහනාධාර නැවැත්වීම, ප්‍රධාන කණ්ඩායම් හා පාර්ශ්වකරුවන් ශක්තිමත් කිරීම, රසායන ද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු පාරිසරික ගැටලු වලට පරිසර පද්ධති ප්‍රවේශය සහ වෙළඳ හා පාරිසරික ගැටලු ආදිය ඇතුළත් වේ.

ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ ප්‍රතිඵල වලින් ප්‍රතිලාභ ලබාගැනීමට නම්, ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ අවශ්‍යතා සවිස්තරාත්මකව ක්‍රියාත්මක සැලැස්මක් බවට පරිවර්තනය කළ යුතු ය. ධරණීය සංවර්ධනය සහ පරිසර කළමනාකරණය සඳහා සහාය ලබාදීමට පොරොන්දු වන ආධාර ලබාදෙන ප්‍රජාවට මෙම ක්‍රියාත්මක සැලැස්ම ඉදිරිපත් කළ හැකි ය.

**ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක සැලැස්මක් බවට පත්කරලීමෙහි ලා විද්වතුන්ගේ හා වෘත්තිකයන්ගේ කාර්යභාරය.**

ඔබ දන්නා පරිදි ධරණීය සංවර්ධන සංකල්පය පාරිසරික ගැටලු හා පමණක් සබැඳෙන්නේ නොමැත. පසුගිය දශක දෙක තුළ එය සමාජීය, ආර්ථික, තාක්ෂණික, කළමනාකරණ සහ ආයතනික කරුණු ආදිය දක්වා පැතිරී ඇත. ජොහැන්නස්බර්ග්හිදී පැවැත්වූ ලෝක සමුළුව මගින් අන්තර් යැපීම සහ ආර්ථික සංවර්ධනයේ, සමාජ සංවර්ධනයේ සහ පාරිසරික ආරක්ෂාව යන අංශවල අන්‍යෝන්‍ය වශයෙන් බලපැවැත්වීම පිළිබඳව අවධාරණය කෙරිණි. එමනිසා දිළිඳු බව තුරන් කිරීම, ධරණීය නොවන නිෂ්පාදන හා පරිභෝජන රටා වෙනස්කිරීම, සමාජ සංවර්ධනය ආදිය සඳහා මූලික වශයෙන් අවධානය යොමු වී ඇති අතර, ඒවා ධරණීය සංවර්ධනයෙහි ලා අත්‍යවශ්‍ය කරුණු වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාතික සමගි සන්ධානයට ප්‍රධානත්වය ලැබේ. ධරණීය සංවර්ධනය සම්බන්ධයෙන් වඩාත් සවිස්තරාත්මක අයුරකින් අවධානය යොමු කිරීමට ජාතික සමගි සන්ධානය වැදගත් යැයි සැළකේ.

ඉටුකිරීමට ඇති වැඩ කොටස විශේෂයෙන්ම ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා ඇති වැඩ කෙරෙහි සැළකිල්ල යොමු කිරීමත් පරීක්ෂා කිරීමත් අවශ්‍ය වන්නේ මේ සන්දර්භය තුළය. නව ප්‍රතිපත්ති සකස් කිරීමෙන් හා ක්‍රමවත් කිරීමෙන් අපට ඉදිරියට යා හැකි ප්‍රධාන මාර්ගය වන්නේ ධරණීය සංවර්ධනයයි. විමධ්‍යගත කිරීම, කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා තීරණ ගැනීමෙහි ලා වැඩි වශයෙන් සම්බන්ධ වීමට පාර්ශ්වකරුවන් සඳහා බලය පැවරීම ආදී ප්‍රතිපත්ති දිගු කාලයක් මුළුල්ලේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ පෙන්වා ඇති නමුත් එවැනි ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා දේශපාලනික හා පරිපාලනමය පොරොන්දුවක් ලබාගැනීමට අසමත් විය. ප්‍රතිඵල ලබාගැනීම සඳහා පරිපාලන පටිපාටි වල අන්තර්ගතයට දැඩි වෙනස්කම් සිදු කිරීමකින් තොරා මනා පරිසරයක් ඇති කිරීමට හා සැලසුම් ක්‍රියාත්මක කිරීමට එවැනි පරිපාලනමය පටිපාටි වල පවත්නා මූලාකෘතිය තුළ විසඳුම් සෙවීම සඳහා පවතින ගැටලු අපට හඳුනාගත හැකිදැයි යන්න සැකසහිතය.

කෙසේ වෙතත් පාරිසරික අමාත්‍යාංශයේ ඵලදායී සහභාගීත්වය මත විවිධ දැනුම් ඇති විද්වතුන් හා වෘත්තිකයන් ඔවුන්ගේ අදාළ ආයතන මගින් සම්බන්ධ කරගනිමින් මෙකී අභියෝග වලට මුහුණ පෑමට ක්‍රියාකාරී ක්‍රමයක් සොයාගත යුතු යැයි මම හඟිමි. එකී කටයුතු වලදී, විශ්ව විද්‍යාල වලටද, සිය කාර්යමණ්ඩලය හා ශිෂ්‍යයන් එකී කටයුතු වල යෙදවීමට, ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රවේශයක් සඳහා සිය දෑත දිගු කිරීමෙන් නායකත්වය ලබාදිය හැකිය.

අතීතයේදී මනා ලෙස ව්‍යුහගත කරන ලද සංවිධානාත්මක මූලාකෘතියක් තුළ ශාස්ත්‍රඥයන් රාජ්‍ය අනුග්‍රහය ලැබෙන සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ කර ගැනීමේ සම්ප්‍රදායන් අපට තිබිණිදැයි මම නොදනිමි. එක්සත් ජනපදය වැනි ඇතැම් රටවල එවැනි සහයෝගිතා වලට, රජයේ ප්‍රතිලාභ සඳහා පමණක් නොව ශාස්ත්‍රඥයන් හා වෘත්තිකයන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කටයුත්තට යොදා ගැනීමේ උපාය මාර්ගයක් වශයෙන් නිල වශයෙන් අනුග්‍රහය ලබාදී ඇති අතර ශක්තිමත් කොට ඇත. දශක 5 කට පමණ පෙර මිණිපේ ජනපද යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන්ගේ ප්‍රගතිය ලේඛනගත කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ අරමුණින් පේරාදෙණිය කාර්ය මණ්ඩලය සමාජ - ආර්ථික සමීක්ෂණයක් පැවැත්වීම ආදී නිදර්ශන ශ්‍රී ලංකාවෙන් ද සපයාගත හැකිය. වර්තමාන උගතුන් විසින් සමාජ ආර්ථික විශ්ලේෂණයක් මගින් සංවර්ධනයේ වඩාත් පරිණත අයුරකින් එම ජනපද යෝජනා ක්‍රම වල තත්ත්වය පිළිඹිබු කරන සාරවත් ප්‍රභවයක් ලෙස මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල භාවිත කෙරේ. මෙම සමීක්ෂණයට සහභාගී වූ විශ්ව විද්‍යාල ගුරුවරුන් හා උපාධි අපේක්ෂකයන් විසින් පවත්වන ලද එවැනි වැඩ කටයුතු මගින් සමීක්ෂණයට සහභාගී වූ බොහෝ දෙනෙකු ඔවුන්ගේ පළපුරුද්ද මගින් එවැනි කටයුතු ඇරඹීමටත් විශේෂ අංශවලට ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය ව්‍යාප්ත කරලීමටත් පොළඹවනු ලැබීය. ක්ෂේත්‍ර පරියේෂණ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතියේ සමාජීය හා ආයතනික අවයව හඳුනාගැනීමෙන් සහ කෝනෙල් විශ්ව විද්‍යාලයේ තාක්ෂණික සහාය වැඩසටහනක් මගින් සපයන ශාස්ත්‍රීය සහාය ඇතුළු කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනයේ ඉගෙනීමේ අත්දැකීමක් වශයෙන් 70 දශකයේ අග භාගයේ හා 80 දශකයේ මුල් භාගයේදී ගල්ඔය ජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය තුළදී එබඳු සහයෝගීතාවක් ඇතිවිය. වන සම්පත් අංශයට අදාළ වන වෘත්තිකයන් බිහි කිරීම සඳහා ඒ සම්බන්ධ පාඨමාලාවක් ආරම්භ කිරීමට පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය මගින් ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට සහාය ලබාදුන් අතර පරිසර විද්‍යාව ඇතුළු පුළුල් පරාසයක් ආවරණය කරන මෙම පාඨමාලාව අද දක්වා අඛණ්ඩව පවත්වනු ලැබේ.

අධ්‍යාපන පරිපාටිය නැවත හැසිරවීමටත් විශ්වවිද්‍යාල සහ රාජ්‍ය ආයෝජන සඳහා පැහැදිලිවම දක්වා ඇති ප්‍රතිපත්ති හා වැඩසටහන් සමග ඍජු ලෙස සම්බන්ධවීම සඳහා ඉගැන්වීමේ රටා ආදී වශයෙන් ආයතන සඳහා නව දර්ශන

සැකසීමට, රජයේ සහ නියෝජ්‍යායතන හෝ සිවිල් සමාජ කණ්ඩායම් සඳහා උගතුන් හා වෘත්තිකයන් අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් ඇති කළ යුතු බව මම හඟිමි. මෙසේ සංවර්ධන ව්‍යාපෘති වල අදාළ අංශ වල පවතින ඵලදායී රැකියා සඳහා විශ්ව විද්‍යාල වලින් පිටවන සිසුන් අන්තර්ග්‍රහණය කිරීමට ක්‍රම සම්පාදන අධිකාරී මනා තත්ත්වයක පැවතිය යුතුය. පශ්චාත් උපාධි කටයුතු වල නිරතවී සිටින සිසුන් විසින් ඉටු කෙරෙන ඉලක්කගත පර්යේෂණ කටයුතු මඟින් මූලික අවධානයක් ලැබෙන්නා ප්‍රතිපත්තිමය ගැටලු වලට සිය අවධානය යොමු කිරීමට පශ්චාත් උපාධි ආයතන වලට පවා හැකිය. එසේම, අදාළ අමාත්‍යාංශය හා විශ්ව විද්‍යාල ඇතුළු අදාළ ආයතන හා සමඟ සහයෝගයෙන් යුතු ව එවැනි ඉගැන්වීමේ කටයුතු හා ඵලදායී ලෙස සම්බන්ධීකරණය කිරීමට හා ඉදිරියට ගෙන යාමට හැකිය. මෙවැනි කටයුතු මඟින් එළැඹෙන අනාගතයේදී අධ්‍යාපන ක්‍රමයේ දැනට පවත්නා අසමානතාව අවම කරනු ඇත. එවැනි වෘත්තීය ආයතන හා විශ්ව විද්‍යාල වලට අනර්ඝ මධ්‍යස්ථාන නිර්මාණය කිරීමට මූලික ප්‍රදේශ වල විශේෂීකරණ සඳහා විශේෂ ප්‍රදේශ වලට ඔවුන්ගේ වැඩකටයුතු යොමු කරන්නේ නම් මම ස්තුති පූර්වකව පිළිගනිමි.

ධරණීය සංවර්ධනය හා පරිසරය සම්බන්ධයෙන් උගතුන්ට හා වෘත්තිකයන් සමග පවත්නා දැඩි සහයෝගිත්වයට සහාය පළකරනු වස් ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා අදාළ වන පහත කරුණු රාජ්‍ය සේවයේ මගේ අත්දැකීම් වලින් ගෙනහැර දක්වමි.

1. ක්ෂේත්‍ර වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම.
2. පාරිසරික බලපෑම් තක්සේරුව.
3. ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ආයතන නිර්මාණය කිරීමට සමාජ සංවර්ධන වැඩසටහන්.
4. සහභාගිත්ව කළමනාකරණය සඳහා ආයතනික සංවර්ධනය.
5. සංවර්ධන ව්‍යාපෘති බහුවිධ ක්‍රමයට විශ්ලේෂණය කිරීම හා විනිශ්චය කිරීම.
6. මූලික ධරණීය සංවර්ධන ප්‍රතිපත්ති.
7. පාරිසරික ආරක්ෂාව හා සංවර්ධනය යන අංශ වල නියැළී සිටින විවිධ වෘත්තිකය කණ්ඩායම් සඳහා විශේෂ පාඨමාලා සංවර්ධනය.
8. විෂය නිර්දේශ සංවර්ධනය.
9. 21 වන දේශීය න්‍යාය පත්‍රයක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
10. සේවාස්ථ පුහුණුව මගින් නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය.
11. මහජන අධ්‍යාපනය මගින් දැනුවත් බව ඇති කිරීම.
12. යොදගත හැකි පර්යේෂණ.

විශ්වවිද්‍යාල වෘත්තිකයන් අදාළ ශිෂ්‍යයන් හා සමග එවැනි සහයෝගිතා වල යෙදවීමෙන් එවැනි වැඩකටයුතු වල ඇති අත්‍යන්ත ස්වයං - තෘප්තිකර ස්වභාවය නිසා සිසුන් අතර නව ආකාරයේ සහයෝගීතාවක් වර්ධනය වෙනු ඇත. අදාළ විෂයයන් සඳහා ඵලදායී දායකත්ව ලබාදීම සඳහා වැඩි වැඩියෙන් පර්යේෂණ වගකීම් දැරීමට ද සිසුන් පෙළඹවීමට ද හැකිය. බහුවිධ පුහුණු වැඩකටයුතු වලට සම්බන්ධ වීමටත්, සම්ප්‍රදායික රාජ්‍ය නියෝජ්‍යායතන වල හමුවන පරිදි නියම ජීවන තත්ත්වයන් හා අවස්ථාවලට පත්වීමට අසීරු ක්ෂේත්‍ර මට්ටමේ ගැටලු සඳහා අන්තර් පුහුණු පිළිබඳ අගය අවබෝධ කරගැනීමටත් මේවා සිසුන් සිසුන් සඳහා අවස්ථා සපයයි.

මේ සියල්ලන්ටම වඩා ඵලදායී විසඳුම් සැපයිය යුතු වැදගත් ප්‍රතිපත්තිමය ගැටලු වලට අවධානය යොමු කිරීම සඳහා සැලසුම්කරුවන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් හා එක්ව විද්වතුන්ගේ හා වෘත්තිකයන්ගේ නිර්මාණාත්මක චින්තනය පෙන්වන්නා වූ බුද්ධිමය සම්ප්‍රදායක ආරම්භයක් ඇති කිරීමේ ක්‍රියාවලියක් බවට මෙය පත්කිරීමට අපට හැකියාවක් තිබිය යුතු ය. අද අප සාකච්ඡා කරන මෙම ප්‍රතිපත්තිමය ප්‍රවේශ වලින් බොහොමයකම ආරම්භය සිදුව ඇත්තේ 1960 දශකය තුළදී සිය රටේ මහජන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමෙහිලා එක්සත් ජනපද විශ්ව විද්‍යාල බුද්ධිමතුන් සම්බන්ධ කර ගනිමිනි. ඒවාට මහජන සහභාගීත්වය ආණ්ඩුවල අඩු මැදිහත්වීම, මනා පාලනය සහ ප්‍රජා කණ්ඩායම් වල ඵලදායී සහභාගීත්වය උදෙසා ආයතන ගොඩනැගීම ආදිය ඇතුළත් වේ. වියට්නාම් යුද්ධය වැනි රටේ දැවෙන ප්‍රශ්න පිළිබඳව මහජන මතය ඇති කරළීමෙහි ලා එක්සත් ජනපද විශ්ව විද්‍යාල වල ඇතැම් ප්‍රසිද්ධ බුද්ධිමතුන් නව අයුරකින් කටයුතු කර ඇත.

අවසාන වශයෙන් රට වෙනුවෙන් ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේදී සම්මත කරගත් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ධරණීය සංවර්ධන ගැටලුවලට අවධානය යොමු කිරීමටත් ප්‍රතිලාභ ලබාගැනීමටත් පරිවර්තනය කිරීම ඉතා වැදගත් බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. මෙකී කාර්යයේදී විද්වතුන්ගේ සහ වෘත්තිකයන්ගේ කාර්යභාරය ඉතා වැදගත් වේ. රටේ යහපත උදෙසා මෙම අභියෝගය භාර ගැනීමට ඔබ සූදානම් වනු ඇතැයි මට විශ්වාසය. මෙම අටවන වාර්ෂික වනසම්පත් හා පාරිසරික සමුළුව සාර්ථක වේවා යි මම පතමි.

# මිහිතලය කෙසේ සුරකිමුද ධරණීය සංවර්ධනය පිළිබඳ

**ජොහැන්නස්බර්ග් ප්‍රකාශනය**

## අපගේ සම්භවයේ සිට අනාගතය දක්වා

1. වර්ෂ 2002 සැප්තැම්බර් මස 2 සිට 4 දක්වා දකුණු අප්‍රිකාවේ ජෝහැන්නස්බර්ග් නුවර දී තිරසාර සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවට රැස් වූ ලෝක ජනතාවගේ නියෝජිතයන් වන අපි තිරසාර සංවර්ධනය කෙරෙහි අපගේ කැපවීම නැවත තහවුරු කරමු.

2. හැමට මානව ගෞරවය පිළිබඳව ඇති අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් කාරුණික, සාධාරණ සහ රැකවරණ සහිත ගෝලීය සමාජයක් ගොඩනැංවීමට අපි කැපවෙමු.

3. මේ සමුළුව ආරම්භයේදී, අනාගතය තමන්ට අයත් බව ලෝකයේ ළමයි සරල වූ එහෙත් පැහැදිලි හඬකින් අපට කියා සිටි අතර ඒ අනුව, දරිද්‍රතාව, පාරිසරික හායනය සහ තිරසාර නොවන සංවර්ධන රටා ද තුළින් හටගන්නා අවමානයෙන් සහ අශෝභනත්වයෙන් තොර ලොවක් අපගේ ක්‍රියා කලාප තුළින් ඔවුන්ට උරුම කර දෙන බවට සහතික වන ලෙස අප හැමට අභියෝග කළහ.

4. අපගේ සාමූහික අනාගතය නියෝජනය කරන මේ ළමයිනට ප්‍රතිචාර දැක්වීමේ එක් අංශයක් වශයෙන්, ලෝකයේ සෑම ප්‍රදේශයකින් ම පැමිණ සිටින, විවිධ ජීවිත අත්දැකීම් පිළිබඳ දැනුමක් ඇති, අප හැම දෙනාම, අළුත් සහ වඩා දීප්තිමත් අපේක්ෂා පූර්ණ ලොවක් නිර්මාණය කිරීම අපට අවශ්‍යය යන ගැඹුරු හැඟීමෙන් එක්සත් වී පෙළඹී සිටිමු.

5. ඒ අනුව, ප්‍රාදේශීය, ජාතික, කලාපීය සහ ගෝලීය මට්ටම්වලින් ප්‍රවර්තනීය සංවර්ධනය - ආර්ථික සංවර්ධනය, සමාජීය සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂාව පිළිබඳ ස්වාධීන හා අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කරන කුලුණු අභිවර්ධනය කිරීමත් තර කිරීමත් සඳහා සාමූහික වගකීම අපි භාරගනිමු.

6. වැඩිතර ජීව ප්‍රජාවට සහ අපගේ ළමයිනට අප එකිනෙකා සතු වගකීම, ක්‍රියාත්මක කිරීමේ සැලසුම මගින් සහ මෙකී ප්‍රකාශනය මගින්, මනුෂ්‍යත්වයේ තොටිල්ල වන මේ මහාද්වීපයේ සිට අපි ප්‍රකාශ කරමු.

7. මනුෂ්‍ය ප්‍රජාව සන්ධි ස්ථානයකට පැමිණ සිටින බැව් පිළිගනිමින්, දුප්පත් කම තුරන් කිරීම මානව සංවර්ධනයත් සාක්ෂාත් කරගත යුතු ප්‍රායෝගික සහ දෘශ්‍යමාන සැලැස්මක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවට සක්‍රිය ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා අධිෂ්ඨානශීලී ප්‍රයත්නයක අපි පොදු අදිටනකින් එක්සත් වී සිටිමු.

## ස්ටොක්හෝම් සිට රියෝ ද ජැනෙයිරෝ දක්වා සහ රියෝ ද ජැනෙයිරෝ සිට ජොහැන්නස්බර්ග් දක්වා.

8. වසර තිහකට පෙර, ස්ටොක්හෝම් හිදී පාරිසරික පරිහානිය සම්බන්ධයෙන් ඉක්මන් ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය පිළිබඳ අපි එකඟත්වයකට පැමිණිමු. වසර 10 කට පෙර රියෝ ද ජැනෙයිරෝහිදී පැවැති පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවෙහිදී, ධරණීය සංවර්ධනය සඳහා පරිසර ආරක්ෂාව, සමාජ හා ආර්ථික සංවර්ධනය මූලික වන බව, රියෝ ප්‍රතිපත්ති පදනම් කරගනිමින් අපි එකඟවීමු. එවැනි සංවර්ධනයක් ලබාගනු වස්, විශ්ව වැඩසටහන, 21 වන න්‍යාය පත්‍රය

සහ රියෝ ප්‍රකාශනය අප විසින් සම්මත කරගනු ලැබූ අතර, එමගින් අපගේ කැපවීම නැවත තහවුරු කළෙමු. රියෝ සමුළුව, ධරණීය සංවර්ධනය සඳහා නව න්‍යාය පත්‍රයක් සකස් කරන්නා වූ වැදගත් සැතපුම් කණුවක් විය.

9. රියෝ සහ ජොහැන්නස්බර්ග් සමුළු අතරතුරේදී, ලෝකයේ ජාතීහු, එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ සංවර්ධනය සඳහා මූල්‍ය පිළිබඳ මොන්ටෙරේ සමුළුව මෙන්ම දෝහා අමාත්‍යංශයික සමුළුව ඇතුළු ප්‍රධාන පෙළේ සමුළු කිහිපයකදීම එක්රැස් වූහ. මෙම සමුළු මගින් මනුෂ්‍යත්වයේ අනාගතය සඳහා සවිස්තරාත්මක පෙරදැක්මක් පැහැදිළි කරන ලදී.

10. ජොහැන්නස්බර්ග් සමුළුවේදී, ධරණීය සංවර්ධනය පිළිබඳ දැක්ම ගරුකරන හා ක්‍රියාත්මක කරන ලොවක් සඳහා පොදු මාවතක් සොයන්නාවූ ජනතාව හා අදහස් එකට එක් කරලීමෙහි ලා අපි බොහෝ දුරට සාර්ථකත්වය ලැබීමු. අපගේ පෘථිවි තලය මත වෙසෙන සියලුම මිනිසුන්ගේ සහභාගිත්වය සහ ලෝකයේ ඒකමතික භාවය ලබාගැනීමෙහි ලා සැළකිය යුතු අන්දමේ ප්‍රගතියක් ලබා ඇති බවද ජොහැන්නස්බර්ග් හිදී සහතික කෙරිණි.

## අප මුහුණපාන අභියෝග

11. දිළිඳු බව මුලිනුපුටා දැමීම, පරිභෝජන හා නිෂ්පාදන රටා වෙනස් කිරීම, සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා ස්වභාවික සම්පත් පදනම ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ධරණීය සංවර්ධනයේ පුළුල් අරමුණු ආවරණය කරන බවද, ඒවා ධරණීය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධක බවද අපි හඳුනා ගනිමු.

12. මානව සමාජය දිළිඳු සහ ධනවත් යනුවෙන් බෙදා වෙන් කරන ගැඹුරු සාවද්‍ය රේඛාව සහ සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින ලෝක අතර හැමදාමත් වර්ධනය වන පරතරය ලෝකයේ සෞභාග්‍යය ආරක්‍ෂාව සහ චිරස්ථායීතාවයට තදබල තර්ජනයක් එල්ල කරයි.

13. ලොව පරිසරය අඛණ්ඩව පීඩා විඳියි. ජෛව විවිධත්වය දිගින් දිගටම අහිමි වන අතර මත්ස්‍ය පරපුරද දිගින් දිගටම ක්ෂය වෙයි. කාන්තාරීකරණය බොහෝ සරු ඉඩම් ගිලගන්නා අතර දේශගුනික විපර්යාස වල අහිතකර ප්‍රතිඵල දැනටමත් පැහැදිළිව දක්නට ලැබේ. ස්වාභාවික ආපදා නිරන්තරයෙන්ම හටගන්නා අතර බොහෝ විනාශයන්ට මුල්වෙයි. සංවර්ධනය වෙමින් පවතින රටවල් පහසුවෙන්ම පීඩාවට ලක්වන අතර, වායු, ජල සහ සාගර දූෂණය දිගින් දිගටම අගනා ජීවිත දස ලක්ෂ ගණනක් කොල්ලකයි.

14. ගෝලීයකරණය මෙම අභියෝග වලට එක් වූ තවත් අංගයකි. වෙළඳපොළ ශීඝ්‍රයෙන් ඒකරාශිවීම, ප්‍රාග්ධන සංචරණය, ලෝ වටා ආයෝජන වල සැළකිය යුතු මට්ටමෙන් ඉහළයාම ආදිය ධරණීය සංවර්ධනය අඛණ්ඩ ලෙස පවත්වාගෙන යෑම සඳහා නව අභියෝග සහ අවස්ථා විවර කරයි. එහෙත් ගෝලීයකරණයේ වාසි සහ පිරිවැය අසමාන ලෙස බෙදී යන අතර, මෙම අභියෝගය පිළිගැනීමෙහි දී සංවර්ධනය වෙමින් පවතින රටවල් විශේෂ අපහසුතා වලට මුහුණපායි.

15. ලොව පවත්නා මෙම අසමානතා ආරක්ෂා කිරීමේ අවදානම අප වෙත ඇති අතර, ලොව වෙසෙන දිළිඳු ජනතාවගේ ජීවිත මූලික වශයෙන් වෙනසකට බඳුන් නොකළහොත් සිය නියෝජිතයන් සහ අප ඇපකැප වී සිටින ප්‍රජාතාන්ත්‍රික ක්‍රම පිළිබඳව ඔවුන් තබා ඇති විශ්වාසය බිඳ වැටිය හැකි අතර, ඔවුන්ගේ නියෝජිතයන් හුදෙක් නද දෙන පිත්තල හෝ ගිගිරි හඬ නගන අත්තාලම් මිස අනෙකක් නොවන බව ඔවුන් දකිනු ඇත.

## ධරණීය සංවර්ධනය සඳහා අපේ කැපවීම

16. අපගේ සාමුහික ශක්තිය වන අපගේ සරුසාර විවිධත්වය, වෙනස්කම් සඳහා ඵලදායී සහයෝගීතාව සඳහා මෙන්ම ධරණීය සංවර්ධනයේ පොදු අරමුණ ඉටු කර ගැනීම සඳහා ද උපයෝගී කරගනු ඇතැයි යන්න සහතික කිරීමට අපි අදිටන් කර ඇත්තෙමු.

17. මානව සාමුහික බව ගොඩනැංවීමේ වැදගත්කම හඳුනාගනිමින් අපි ලෝකයේ ශිෂ්ටාචාර හා ජනතාව අතර සංවාද හා සහයෝගිතාව ඉහළ නැංවීමට කටයුතු කරන අතර ඔවුන්ගේ ජාතිය, නොහැකියාවන්, ආගම, භාෂාව, සංස්කෘතිය හා සම්ප්‍රදාය පිළිබඳ තැකීමක් නොකරමු.

18. මානව උදාරත්වය නොබෙදීම පිළිබඳ ජොහැන්නස්බර්ග් සමුළුවේ අවධානය අප විසින් පිළිගන්නා අතර, පිරිසිදු ජලය, සනීපාරක්ෂාව, ප්‍රමාණවත් නිවාස පහසුකම්, ශක්තිය, සෞඛ්‍ය ආරක්ෂාව, ආහාර ආරක්ෂණය හා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම ආදී මූලික අවශ්‍යතා ලබා ගැනීම ශීඝ්‍රයෙන් වැඩි කිරීම ඉලක්ක කාලසටහන් හා සහයෝගීතාව පිළිබඳ තීරණ මගින් සම්මත කර ගැනේ. එසේම එම

අවස්ථාවේදීම, මූල්‍ය සම්පත් ලබාගැනීම සඳහා එකිනෙකාට උදවු කිරීමටත්, විවෘත වෙළඳ පොළවල වාසි ලබාගැනීමටත්, ශක්‍යතා වර්ධනය සහතික කිරීමටත්, සංවර්ධනය ව්‍යාප්ත කරලීම සඳහා නූතන තාක්ෂණය භාවිත කිරීමටත්, තාක්ෂණය ලබා ගැනීම, මානව සම්පත් සංවර්ධනය හා ඌන සංවර්ධනය සඳහටම පිටු දැකීමට අධ්‍යාපනය හා පුහුණුව ආදිය පවතින සහතික කිරීමටත් අපි එක්ව වැඩ කරන්නෙමු.

19. අපගේ ජනතාවගේ ධරණීය සංවර්ධන කටයුතු වලට දැඩි තර්ජනයක් එල්ල කර ඇති ලොවපුරා පවතින තත්ත්වයන්ට එරෙහිව අපගේ විශේෂ අවධානය යොමු කිරීමටත්, ඊට මූලික අවධානය යොමුකිරීමටත් අප දුන් පොරොන්දුව අපි නැවත තහවුරු කරන්නෙමු. මෙම තත්ත්වයන්ට, දිගුකල් සිට පවතින සාගින්න, මන්ද පෝෂණය, විදේශ රැකියාව, යුධ ගැටුම්, නීති වරෝධී මත්ද්‍රව්‍ය ගැටලු සංවිධානාත්මක අපරාධ, දූෂණය, ස්වාභාවික විපත්, නීති විරෝධී අවි වෙළඳාම, නීති විරෝධී පුද්ගල ගනුදෙනු, ත්‍රස්තවාදය, වාර්ගික, ආගමික අසහනය අනෙකුත් අමනාපකම්, අනෙකුත් රටවල ජනයා කෙරෙහි ඇති හිතිකාව, ආවේණික, පැතිරී යන සහ දිගු කල්පවතින රෝග, විශේෂයෙන්ම එඩ්ස්, මැලේරියාව හා ක්ෂය රෝගය වැනි දේ අයත් වේ.

20. කාන්තා බල ගැන්වීම හා විමුක්තිය සහ ස්ත්‍රී - පුරුෂ සමභාවය, 21 වන න්‍යාය පත්‍රය සහ සහස්‍ර සංවර්ධන අරමුණු සහ ජොහැන්නස්බර්ග් සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආදිය මගින් ආවරණය කරනු ලැබ ඇති සියලුම ක්‍රියාකාරකම් තුළ සමෝධානික කරනු ලබන බවට ඇපකැපවෙමු.

21 ලෝක සමාජය තුළ විධික්‍රම පවතින බව අපි පිළිගනිමු. එමෙන්ම මානව වර්ගයා අභිමුවෙහි ඇති, දරිද්‍රතාවය මුලිනුපුටා දැමීම සහ ධරණීය සංවර්ධනය පිළිබඳ අභියෝග වෙත අවධානය යොමු කිරීම සඳහා අවශ්‍ය සම්පත් වලට ද ලෝක සමාජය උරුමකම් කියයි. අපි මෙම පවත්නා සම්පත් මානව වර්ගයාගේ යහපත උදෙසා පරිහරණය කිරීම සහතික කිරීමට අවශ්‍ය අමතර පියවර ගන්නෙමු.

22. මේ සම්බන්ධයෙන් අපගේ සංවර්ධන අරමුණු සහ ඉලක්ක වලට දායක වීම සඳහා, එසේ කටයුතු කර නොමැති සංවර්ධිත රටවල් වලට රාජ්‍ය සංවර්ධන සහයෝගය අන්තර්ජාතික වශයෙන් එකඟ වූ මට්ටම් වලට එළඹීම උදෙසා නිශ්චිත ප්‍රයත්න දැරීමට අපි බලකර සිටිමු.

23. කලාපීය සහයෝගීතාව, අන්තර්ජාතික සහයෝගීතාව සහ ධරණීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහිලා අප්‍රිකාවේ සංවර්ධනය සහා නව සහයෝගීතාව ආදී ශක්තිමත් කලාපීය කණ්ඩායම් හා ගිවිසුම් බිහිවීම අපි පිළිගනිමු. ඊට සහාය පළකරමු.

24. සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන් සහ ඌන සංවර්ධිත රටවල් වල සංවර්ධන අවශ්‍යතා කෙරෙහි අපගේ විශේෂ අවධානය දිගින් දිගටම යොමුකරන්නෙමු.

25. ධරණීය සංවර්ධනයෙහි ලා දේශීය ජනතාවගේ අත්‍යවශ්‍ය කාර්යභාරය අපි නැවත තහවුරු කරමු.

26. ධරණීය සංවර්ධනය උදෙසා දිගු කාලීන ආකල්පයක් හා ප්‍රතිපත්ති සම්පාදනය, තීරණ ගැනීම හා සියලුම මට්ටම් වලින් ක්‍රියාත්මක කිරීම ආදියෙහි ලා පුළුල් සහභාගිත්වයක් අවශ්‍ය බව අපි පිළිගනිමු. සමාජයේ හවුල්කරුවන් වශයෙන් අපි නිදහස හා මේ හැමදේකට වැදගත් කාර්යභාරයන් ගරු කරමින් ප්‍රධාන කණ්ඩායම හා සමඟ ස්ථාවර සහයෝගීතාවක් උදෙසා අඛණ්ඩව කටයුතු කරමු.

27. පෞද්ගලික අංශයේ විශාල හා කුඩා සමාගම් යන දෙපාර්ශ්වයටම ඔවුන්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, සාධාරණ හා ධරණීය ප්‍රජා සහ සමාජ වල පරිණාමයට දායකවීම උදෙසා වගකීමක් පවතින බවට අපි එකඟවෙමු.

28. වැඩකටයුතු වල මූලික ප්‍රතිපත්ති සහ අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ප්‍රකාශනය සැළකිල්ලට ගනිමින්, ආදායම් උත්පාදනය කරන රැකියා අවස්ථා වර්ධනය කිරීමට සහාය පළකිරීමට ද අපි එකඟවෙමු.

29. පෞද්ගලික අංශයේ සංස්ථා සඳහා සාමූහික වගකීම වලංගුභාවයට පත්කිරීමේ අවශ්‍යතාවක් ඇති බවට අපි එකඟවෙමු. මෙය විනිවිද භාවයකින් යුත් හා දැඩි ක්‍රමවත් බවකින් යුත් පරිසරයක් තුළදී සිදුවිය යුතුය.

30. ක්‍රියාත්මක කිරීමේ ජොහැන්නස්බර්ග් සැලැස්ම සහ සහස්‍ර සංවර්ධණ අරමුණු දැක්වෙන 21 වන න්‍යාය පත්‍රය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම මට්ටම් වලින් පාලනය ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම ද අපි භාර ගනිමු.

## බහුපාර්ශ්විකත්වය යනු අනාගතයයි.

31. ධරණීය සංවර්ධනය පිළිබඳ අපගේ අරමුණු ඉටුකර ගැනීමට, අපට වඩාත් ඵලදායි ප්‍රජාතාන්ත්‍රික හා වගකිවයුතු අන්තර්ජාතික හා බහුපාර්ශ්වික ආයතන අවශ්‍ය වේ.

32. එක්සත් ජාතීන්ගේ ප්‍රකාශ පත්‍රයේ ප්‍රතිපත්ති හා අරමුණු වලට, බහුපාර්ශ්විකත්වය ශක්තිමත් කිරීම මෙන්ම අන්තර්ජාතික නීති වලටද අප දී ඇති ප්‍රතිඥාව අපි නැවත තහවුරු කරමු. ධරණීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට මනා ලෙස පිහිටුවා ඇති බොහෝ ලෝක හා නියෝජිත සංවිධානය වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය නායකත්වය දෙමින් ඉටු කරන කාර්යභාරයට අපි සහාය පළකරමු.

33. ධරණීය සංවර්ධන අභිමතාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා කලින් කලට ප්‍රගතිය ඇගයීමටද අපි බැඳී සිටිමු.

## එය සිදුවීමට ඉඩ හරිමු !

34. මෙය, ඓතිහාසික ජොහැන්නස්බර්ග් සමුළුවට සහභාගි වූ සියලුම ප්‍රධාන කණ්ඩායම් සහ ආණ්ඩු ඇතුළත් වූ අන්තර්ගත ක්‍රියාවලියක් විය යුතුය යන එකඟතාවයෙහි අපි සිටිමු.

35. පොදු අදිටනකින් එකට බැඳී අපේ ලෝකය ආරක්ෂා කිරීමටත්, මානව සංවර්ධනය ඉහළ නැංවීමටත්, විශ්ව සෞභාග්‍යය හා සාමය ළඟාකර ගැනීමටත් එකට එක්ව ක්‍රියා කිරීමට අපි ඇපකැප වී සිටිමු.

36. අපි ක්‍රියාත්මක කිරීමේ ජොහැන්නස්බර්ග් සැලැස්මට සහ එහි අඩංගු කාලීනව බැඳුණු, සමාජ ආර්ථික සහ පාරිසරික ඉලක්ක ඉක්මන් කිරීමට අපි කැපවී සිටිමු.

37. ධරණීය සංවර්ධනය පිළිබඳ අපගේ සාමූහික බලාපොරොත්තුව ඉටුවන බව සහතික කිරීමට අප අදිටන් කරගෙන සිටින බව මෙම පෘථිවිතලයට උරුමකම් කියන පරම්පරාවලට සහ ලෝකයේ මිනිසුන්ට මනුෂ්‍ය වර්ගයාගේ තොටිල්ල වන අප්‍රිකානු මහාද්වීපයේ සිට අපි පොරොන්දු වෙමු.

38. ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව සඳහා අනර්ඝ අන්දමින් කටයුතු සූදානම් කිරීමත්, උසස් ආගන්තුක සත්කාරයත් වෙනුවෙන් දකුණු අප්‍රිකානු රජයටත් එහි ජනතාවටත් අපේ ගැඹුරු කෘතඥතාව පළකරමු.

# දකුණු අප්‍රිකාව

# ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව

**2002 සැප්තැම්බර් 2 - 4**

## දේශපාලනික ප්‍රකාශනය

**"ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව"**

**ආරම්භයේ සිට අනාගතය දක්වා ............**

1. 2002 සැප්තැම්බර් 2 සිට 4 දක්වා දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවරදී ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේදී එක්රැස් වූ ලෝක නායකයන් වන අපි, සැමටම මානව අභිමානයකින් යුතුව ජීවත්වීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමෙහි ලා කාරුණික හා කුළුපග ලෝක සමාජයක් ගොඩ නැංවීම සඳහා අපගේ ප්‍රතිඥාව ප්‍රකාශ කර සිටිමු.

2. ධරණීය සංවර්ධනය ළඟාකර ගැනීමට අප දුන් ප්‍රතිඥාව අපි නැවත තහවුරු කරමු.

3. ලෝක ජනතාවගේ නියෝජිතයන් වශයෙන් අපි, දේශීය, ජාතික, කලාපීය හා ලෝක මට්ටම් වලින්, පරිසරය සුරැකීම, සමාජ හා ආර්ථික සංවර්ධනය යන එකිනෙක වෙන්කළ නොහැකි කුලුනු ත්‍රිත්වය වැඩි දියුණු කිරීමේත් ශක්තිමත් කිරීමේත් සාමූහික වගකීම අපි භාරගන්නෙමු.

4. බහුතර ජීව ප්‍රජාවට සහ අනාගත පරම්පරා වලට එකිනෙකා කෙරෙහි ඇති අපගේ වගකීම මනුෂ්‍ය වර්ගයාගේ තොටිල්ල වන දකුණු අප්‍රිකානු මහාද්වීපයේ සිට අපි ප්‍රකාශ කර සිටින්නෙමු.

5. දශක ගණනාවක් තිස්සේ කාර්මික ක්‍රියාකාරකම් මගින් පරිසරය වෙනස් කරන්නේ කෙසේද යන්නට සාක්ෂි සපයන දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නගරයේදී එක්රැස් වූ අපි, අප දැක ඇති මහා සමාජ හා ආර්ථික බෙදීම් පිළිබඳව ආවර්ජනය කරන්නෙමු.

6. මෙය අපගේ ලෝක පැවැත්මේ කැඩපතකි. අප **කිසිවක් නොකළහොත් ලෝක දේශපාලන සන්ධානයක් ඇත.** ලොව වෙසෙන දිළිඳු ජනතාවගේ ජීවිත මූලික වශයෙන් වෙනසකට බඳුන් නොකළහොත් සිය නියෝජිතයන් සහ අප ඇපකැප වී සිටින ප්‍රජාතාන්ත්‍රික ක්‍රම පිළිබඳව ඔවුන් තබා ඇති විශ්වාසය බිඳවැටිය හැකි අතර, ඔවුන්ගේ නියෝජිතයන් හුදෙක් නද දෙන පිත්තල හෝ ගිගිරි හඬ නගන අත්තාලම මිස අනෙකක් නොවන බව ඔවුන් දකිනු ඇත.

7. මානව සමාජය දුප්පත් හා පොහොසත් වශයෙන් බෙදා වෙන්කරන ගැඹුරු සාවද්‍ය රේඛා යා කිරීමට පූර්ණ ප්‍රමුඛතාවය දෙන්නාවූ ලෝක ධරණීය සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපි පොරොන්දු වෙමු.

**ධරණීය සංවර්ධනය පිළිබඳව රියෝ මිහිතල සමුළුවේ සිට ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව දක්වා......**

8. වසර 10 කට පෙර රියෝ මිහිතල සමුළුවේදී, පරිසරය ආරක්ෂා කිරීම, සමාජ හා ආර්ථික සංවර්ධනය යන ත්‍රිත්වය ධරණීය සංවර්ධනයෙහි ලා එකිනෙක වෙන්කළ නොහැකි කුලුනු බවට අපි එකඟත්වය පළ කළෙමු. එකී සංවර්ධනය ළඟා කර ගැනීම උදෙසා 21 වන න්‍යාය පත්‍රය යනුවෙන් ලෝක වැඩසටහනක් අපි සම්මත කරගතිමු.

9. රියෝ සහ ජොහැන්නස්බර්ග් සමුළු අතරවාරයේදී ලෝක ජනතාව එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ ප්‍රධාන සමුළු කිහිපයකදී එක්රැස් වූහ. මෙම සමුළු වල ප්‍රතිඵල මගින් ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් සමුළුවට වැදගත් යෙදවුම් සපයා ඇත.

10. රියෝ මිහිතල සමුළුවේ සිට, 21 වන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම උදෙසා අපි නව සම්මුති හඳුන්වා දී ඇත්තෙමු.

11. සංවර්ධන ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව කිසියම් පුද්ගලයෙකුට හෝ කිසියම් ජාතියකට අහිමි නොවිය යුතු බව අපි පිළිගනිමු.

12. සහස්‍ර ප්‍රකාශනයේ සහ 1992 සිට පවත්වන ලද එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සමුළු වලදී තීරණය කරගත් අදාළ අන්තර්ජාතික ගිවිසුම් ආදියෙහි ඇතුළත් සංවර්ධන අභිමතාර්ථ ඇතුළු අන්තර්ජාතිකව එකඟත්වයට පැමිණි සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීමට අපි ඇපකැප වෙමු.

13. "මිහිතල ප්‍රකාශනයේ" ඉදිරිපත් කර ඇති අභියෝග වල අදාළත්වය ද අපි සැළකිල්ලට ගන්නෙමු.

14. ජොහැන්නස්බර්ග්හිදී එකඟත්වයට පැමිණි ධරණීය සංවර්ධනය පිළිබඳ හදිසි අභියෝග වලට අවධානය යොමුකිරීමට අපි සාමුහික ලෙස ඇපකැප වී සිටින්නෙමු.

**- අප හමුවේ ඇති අභියෝග -**

15. අප යුගයේ පවතින වඩාත්ම දැඩි අභියෝග වන්නේ දිළිඳුබව, සංවර්ධනය වෙමින් පැවතීම, පාරිසරික පරිහානිය සහ රටවල් තුළ මෙන්ම රටවල් අතර පවත්නා සමාජ ආර්ථික අසමානතා ආදියයි.

16. දිළිඳුබව මුලිනුපුටා දැමීම, නිෂ්පාදන හා පරිභෝජන පිළිබඳ ධරණීය නොවන රටා වෙනස් කිරීම, ජීවිතයේ පැවැත්ම උදෙසා ස්වාභාවික සම්පත් පදනම ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම, සමාජ ආර්ථික සංවර්ධනය ආදිය ධරණීය සංවර්ධනයෙහි ලා අත්‍යවශ්‍ය සාධක වන අතර ඒවා ධරණීය සංවර්ධනයේ පුළුල් අරමුණුද වේ.

17. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින ලෝක අතර හැමදාමත් වර්ධනය වන පරතරය ලෝක සෞභාග්‍යයට, ආරක්ෂාවට හා චිරස්ථායිතාවයට බලවත් තර්ජනයක් එල්ල කරයි.

18. මෙම පෘථිවි තලය මත වෙසෙන මානවයන් වශයෙන් අප, අපව පාලනය කරන්නේ කෙසේද යන්න වෙනස් කිරීමට අවශ්‍ය බව අපි සාමුහිකව හඟිමු.

19. රියෝ මිහිතල සමුළුවේදී අප විසින් ස්ථාපනය කරගනු ලැබූ අභිමතාර්ථ ඉටු වී නොමැති බව අපි පිළිගනිමු.

20. ධරණීය සංවර්ධනය ළඟා කරගැනීම පිළිබඳ ප්‍රගතිය අප බලාපොරොත්තු වූවාට වඩා මන්දගාමී වී ඇති බවද අපි තදින්ම සැළකිළිමත් වෙමු.

21. නව ශත වර්ෂයේ අභියෝග වලට අප සාමුහික ලෙස මුහුණ පා ඇති බැවින්, අපගේ ප්‍රගතිය සමාලෝචනය කිරීමටත්, අපගේ ඉලක්කය එය ක්‍රියාත්මක කිරීම දක්වා යොමු කිරීමටත් ජොහැන්නස්බර්ග් සමුළුව වේදිකාවක් සපයා ඇත.

**- ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව -**

22. ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව යනු, ආණ්ඩු අතර සාකච්ඡා, විවිධ පාර්ශවය කරුවන්ගේ සංවාද සහ සහයෝගිතා නිවේදන ආදිය අඩංගුවන පැහැදිළි සහ සවිස්තරාත්මක පලයකි. ජොහැන්නස්බර්ග් සමුළුව මගින් ධරණීය සංවර්ධනය පිළිබඳ පැහැදිළි සහ සමෝධානික ප්‍රතිඥාවක් දී ඇත.

23. ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව සම්මත කර ගැනීමේදී, රියෝ ප්‍රතිපත්ති පිළිගැනීමට අප දී ඇති පොරොන්දුවක් අපගේ ලෝක ගිවිසුමේ කේන්ද්‍රීය කොටසක් අඩංගු වන 21 වන න්‍යාය පත්‍රය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමත් අපි නැවත තහවුරු කරන්නෙමු.

24. ධරණීය සංවර්ධනය පූර්ණ වශයෙන් ළඟාකර ගැනීම උදෙසා ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය, මානව අයිතිවාසිකම් වලට ගරු කිරීම, නිදහස, සාමය හා ආරක්ෂාව අත්‍යවශ්‍ය බව අපි හඳුනා ගනිමු.

මෙම අරමුණු එකිනෙකට බෙදා වෙන්කළ නොහැකි අතර අන්‍යෝන්‍ය වශයෙන් බලපැවැත්වේ.

25. අප අතර විවිධත්වයක් පැවතියද, වෙනසක් සඳහා අවබෝධාත්මක සහයෝගිත්වයක් තිබිය හැකි බව ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රතිඥා මගින් නැවත තහවුරු කර ඇත.

26. දේශීය ජනතාවගේ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම මෙන්ම, සංස්කෘතික විවිධත්වය සහ විවිධ ආචාරධර්ම ක්‍රම වලටද අපි ගරු කරන්නෙමු.

27. ජෛව විවිධත්වයේ පැවැත්ම සඳහාත් දේශීය දැනුම් සම්භාරය ආරක්ෂා කිරීම සඳහාත් එම දේශීය ජනතාව සහ දේශීය ප්‍රජා වැදගත් වන බව අපි නැවත තහවුරු කරමු. එසේම ඔවුන් ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීමට සහභාගි විය යුතු අතර ඉන් ප්‍රතිලාභද ලබාගත යුතුය.

28. අපි පොදු ප්‍රතිපත්තියක, එහෙත් වෙනස් වගකීමක අඛණ්ඩ අදාළත්වය පිළිබඳ නැවත තහවුරු කරමු.

29. ජීවිතය අභිමානයෙන් යුතුව ගෙවීමට අදාළ වන මූලික අවශ්‍යතා, පිරිසිදු ජලය සහ සනිපාරක්ෂක පහසුකම් ලබා ගැනීම, ශක්තිය, සෞඛ්‍යාරක්ෂාව, ආහාර ආරක්ෂණය හා ජෛව විවිධත්වය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව අපි පිළිගන්නෙමු. එසේම, තාක්ෂණය, අධ්‍යාපනය හා පුහුණුව සහ රැකියා උත්පාදනය ආදියෙහි කේන්ද්‍රීය වැදගත්කම පිළිබඳවද අපි ප්‍රකාශ කර සිටින්නෙමු.

30. ලෝක සමාජ තුළ විධික්‍රම පවතින බව අපි පිළිගනිමු. එමෙන්ම මානව වර්ගයා අභිමුවෙහි ඇති දරිද්‍රතාවය මුලිනුපුටා දැමීම සහ ධරණීය සංවර්ධනය පිළිබඳ අභියෝග වෙත අවධානය යොමු කිරීම සඳහා අවශ්‍ය සම්පත් වලටද උරුමකම් කියයි.

31. දිළිඳුබව හා ඌන සංවර්ධනය නිම කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් සහ තාක්ෂණය පැවරීම සඳහා මෙන්ම ශක්‍යතා වර්ධනය සඳහා ඇති අවශ්‍යතාව ද අපි පිළිගනිමු.

32. අප විසින් එකඟතාව පළකරන ලද කාලීනව බැඳුණු, සමාජ ආර්ථික සහ පාරිසරික ඉලක්ක ඉටු කර ගැනීම උදෙසා කටයුතු කිරීමට අපි ඇපකැප වන්නෙමු.

33. මේ සම්බන්ධයෙන්, අපගේ සංවර්ධන අරමුණු සහ ඉලක්ක වලට දායකවීමට රාජ්‍ය සංවර්ධන සහයෝගය සඳහා වන අන්තර්ජාතිකව එකඟ වූ ඉලක්ක කරා ලඟාවීමට කඩිනමින් නිශ්චිත ප්‍රයත්න දැරීමට අපි එකඟ වන්නෙමු.

34. සංවර්ධනය වෙමින් පවතින රටවල් වල ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා සම්පත් ලබාගැනීමෙහි ලා සෘජු විදේශ ආයෝජනයේ වැදගත් කාර්යභාරය අපි පිළිගනිමු.

35. කලාපීය සහයෝගීතාව, අන්තර්ජාතික සහයෝගීතාව සහ ධරණීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට, අප්‍රිකාවේ සංවර්ධනය සඳහා නව සහයෝගීතාව ආදී ශක්තිමත් කලාපීය කණ්ඩායම් හා ගිවිසුම් බිහිවීම අපි පිළිගනිමු ඊට සහාය පළ කරමු.

36. සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන් සහ ඌන සංවර්ධිත රටවල් වල සංවර්ධන අවශ්‍යතා කෙරෙහි අපගේ විශේෂ අවධානය දිගින් දිගටම යොමු කරන්නෙමු.

37. විශේෂයෙන්ම ඌන සංවර්ධිත රටවල් මධ්‍යම ප්‍රමාණයේ ආදායම් ලබන රටවල් මෙන්ම, සමස්තයක් වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් වල ණය බර අඩු කිරීම ධරණීය සංවර්ධනයට මහත් බාධකයක් බව අපි පිළිගනිමු.

38. සියලුම මිනිසුන් සඳහා ආහාර ආරක්ෂණය ලබාගැනීම දිළිඳුබව මුලිනුපුටා දැමීම සහ මානව අභිමානය ඉහළ නැංවීම සඳහා දරන පරිශ්‍රමයේ ප්‍රධාන අංගයක් බව අපි එකඟවෙමු. එබැවින් දිළිඳු රටවල් වල කෘෂිකාර්මික පද්ධති වල ධරණීය සංවර්ධනය සඳහා අවශ්‍ය වන තත්ත්ව නිර්මානය කිරීමට ප්‍රමාණවත් යමක් නොකිරීම පිළිබඳව අපි සැළකිල්ල යොමු කරමු.

39. ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීම සඳහා සාධාරණ, සවිස්තරාත්මක, නීතිමය පදනමක් ඇති, ඉදිරිය ගැන කිව හැකි, බහු පාර්ශ්වීය වෙළඳ ක්‍රමයක් අත්‍යවශ්‍ය බව අපි එකඟ වෙමු.

40. ජීවිතයට ජලය අත්‍යවශ්‍ය බව අපි දනිමු. යහපත් සෞඛ්‍යය, බෝග වගාව, ජල විදුලිය

සැපයීම සහ පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන මූලික සම්පත වේයයි. එබැවින් ධරණීය සංවර්ධනය පිළිබඳ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම, නාගරීකරණයේ ශීඝ්‍ර වර්ධන අනුපාත සහ ග්‍රාමීය දිළිඳු ජනතාවගේ අවශ්‍යතා ප්‍රධාන වේ.

41. මානව වර්ගයාට ස්වභාව ධර්මයා හා එක්ව නීරෝගීමත් ඵලදායි ජීවිත ගත කිරීමට හිමිකම් ඇති බව ප්‍රකාශ කරන්නා වූ රියෝ මූලධර්මය අපි නැවත තහවුරු කරමු. එබැවින් දිළිඳුබව, ඌන සංවර්ධනය, නිවාස පහසුකම්, අහිතකර පාරිසරික තත්ත්ව, බෙහෙත් ද්‍රව්‍ය, එන්නත් ආදිය නොමැතිවීම දුර්වල සෞඛ්‍ය යටිතල පහසුකම් ආදිය හේතුකොටගෙන කෝටි ගණන් ජනතාව වැළැක්විය හැකි රෝග වලින් පීඩා විඳින බවත්. ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියාව හා ළමාවියේදී ඇතිවන වෙනත් රෝග හේතු කොටගෙන අකල් මරණ වලට ගොදුරු වන බවත් අපි සැළකිල්ලට ගනිමු.

42. විවිධ ශක්ති භාවිත හේතුවෙන් කාන්තාරීකරණය, ආම්ලීකරණය, වායු දුෂණය සහ දේශගුණික විපර්යාස ආදී අහිතකර පාරිසරික ප්‍රතිඵල ඇතිවන බව අපි පිළිගනිමු. එබැවින් අපි මෙවැනි කරුණු හා සම්බන්ධව පවත්නා අන්තර්ජාතික ගිවිසුම් සියල්ල ක්‍රියාත්මක කිරීමට අප කැපවෙන අතර, දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් කටයුතු කිරීමට ලෝක දිගු-කාලීන ප්‍රතිඥාවක් ඇති කර ගැනීමට අඛණ්ඩව සොයා බලමු. මේ සම්බන්ධයෙන් අපි කුඩා දූපත් රාජ්‍ය වල විශේෂ කාර්යයන් හඳුනා ගනිමු.

43. සංවර්ධනය වෙමින් පවතින රටවලට බලපාන ශක්ති ඌනතාවය කෙරෙහි අවධානය යොමු කිරීමට අපි ඇපකැප වෙමු.

44. කාන්තාරීකරණ ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කරමින්ද, ජෛව විවිධත්ව ආරක්ෂා කිරීම, පෘථිවිය මත ජීවය රඳා පවත්වාගන්නා වූ ස්වාභාවික ක්‍රියාවලිය පිළිබඳව විශේෂයෙන් අවධාරණය කරමින්ද අපේ පෘථිවි තලයේ පරිසර පද්ධතියේ සමෝධානික බව ආරක්ෂා කිරීමටත්, ප්‍රතිනිර්මාණය කිරීමටත් එකඟ වෙමු, ජාතික හා ලෝක මට්ටම් වලින් වත්මන් ජෛව විවිධත්ව සළකිය යුතු අනුපාතයකින් අඩුවීම සියලු දෙනා සඳහාම ධරණීය ජීවන වෘත්ති ලබා ගැනීමට ප්‍රමුඛතාවයි.

45. අන්තර්ජාතික සහයෝගීතාව ශක්තිමත් කිරීමෙන් මනා තාක්ෂණ ක්‍රම විසුරුවා හැරීමෙන් සහ අනතුරු ඇඟවීම් ක්‍රම තවදුරටත් සංවර්ධනය කිරීමෙන් ස්වාභාවික ආපදා මගින් ඇතිවන ආර්ථික සාමාජීය හා පාරිසරික බලපෑම් අවම කිරීමට අපි පොරොන්දු වේ.

46. ධරණීය සංවර්ධනයෙහිලා ප්‍රතිපත්ති සම්පාදනයෙහිද, තීරණ ගැනීමේද හා සියලුම මට්ටම් වලින් ක්‍රියාත්මක වීමේද, දිගු කාලීන දර්ශනයක් හා පුළුල් - පදනමකින් යුත් සහභාගිත්වයන් අවශ්‍ය වේ. ආණ්ඩු වශයෙන්, පෞද්ගලික අංශය, කම්කරු කණ්ඩායම්, සිවිල් සමාජය සහ සියලුම ප්‍රධාන කණ්ඩායම් හා සමඟ අචල සහයෝගීත්වයෙන් යුතුව. එකී පාර්ශවකරුවන්ගේ නිදහසට හා වැදගත් කාර්යභාරයට ගරු කරමින් අපි අඛණ්ඩ ලෙස කටයුතු කරමු.

47. ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාවේ කොටසක් සකසන්නාවූ, සියලුම අදාළ පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින්, නව සහයෝගිතා ගිවිසුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශ අපි පිළිගනිමු.

48. සිය නීත්‍යානුකූල ක්‍රියාකාරකම් වල නිරතවෙන අතරතුරේදීම, සාධාරණ හා ධරණීය ප්‍රජා සහ සමාජ වල පරිණාමය උදෙසා දායකවීමට වගකීමක් ඇති ප්‍රධාන පෙළේ පෞද්ගලික අංශ සංස්ථා වල බිහිවීම සමඟ ගෝලීයකරණ ක්‍රියාවලිය එකට එක්ව පවතින බව අපි පිළිගනිමු.

49. එබැවින් පෞද්ගලික අංශය එහි සාමූහික වගකීම සහ සමාජ දායකත්වය ශක්තිමත් කිරීමට විනිවිදභාවයකින් යුත් හා ස්ථිර නියාමන පරිසරයක් තුළ ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවක් පවතින බවට අපි එකඟ වෙමු.

50. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ මහා සමුළුව, පෞද්ගලික අංශයේ සාමූහික වගකීම සහ සමාජ දායකත්වය යන කටයුත්තෙහි යෙදිය යුතුය.

51. ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව සහ සහස්‍ර සංවර්ධන අරමුණු වන 21 වන න්‍යාය පත්‍රය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් මට්ටමේ පාලනය ශක්තිමත් කිරීමට හා වැඩි දියුණු කිරීමට අපි පොරොන්දු වෙමු.

52. මානව සමාජය තුළ කාන්තාවට හිමි කේන්ද්‍රීය ස්ථානයත් ධරණීය සංවර්ධනය ඉහළ නැංවීමෙහි ලා ඔවුන්ගේ මූලික කාර්යභාරයත් අපි පිළිගනිමු. ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව හා සහස්‍ර සංවර්ධන අරමුණු එනම් 21 වන න්‍යාය

පත්‍රය තුළ අන්තර්ගත සියලුම කටයුතු සමඟ කාන්තා විමුක්තිය හා ස්ත්‍රී - පුරුෂ සමභාවය සමෝධානික විය යුතුය.

53. මානව සාමූහිකත්වයේ වැදගත්කම හඳුනාගනිමින්, අපි ලෝකයේ ජනතාව හා ශිෂ්ටාචාර අතර සංවාද හා සහයෝගිතාව ඉහළ නැංවීමට කටයුතු කරන අතර ඔවුන්ගේ ජාතිය, නොහැකියාවන්, ආගම, භාෂාව, සංස්කෘතිය හා සම්ප්‍රදාය පිළිබඳ තැකීමක් නොකරමු.

54. මානව විවිධත්වය අපි ගරු කරමු. එමෙන්ම එය සැමරීම සඳහා හේතුවක් බවද හඳුනා ගනිමු.

55. ජාතිභේදය, ස්ත්‍රී, පුරුෂ භේදය සහ වෙනස්කම් සිදුකිරීමේ අනෙකුත් ආකාර වලට මෙන්ම හිංසාපීඩා වලට විරුද්ධ වීමේ අපගේ ප්‍රතිඥාව අපි නැවත තහවුරු කරන්නෙමු.

56. ආයුධ සන්නද්ධ ගැටුම් සහ යුද්ධ ධරණීය සංවර්ධනයට ඇති බාධක බව අපි තහවුරු කරන්නෙමු.

57. ත්‍රස්ත්‍රවාදය, සංවිධානාත්මක අපරාධ හා දූෂණය තනි තනිවත්, සාමූහික ලෙසත් මර්දනය කිරීමට අපි එකඟ වෙමු.

58. විදේශීය අත්පත්කරගැනීමට අපගේ විරුද්ධත්වය නැවත තහවුරු කරන අතර ස්වෛරීභාවයට හා සිය ස්වභාවික සම්පත් පාලනය කිරීමට සියලු ජනතාවට ඇති අයිතිවාසිකම ස්ථිරවම පිළිගනිමු.

59. දේශපාලන අරමුණු මුදුන්පත් කරගැනීම උදෙසා, ආහාර අවශ්‍යතාව ඇති කිසිදු ජනතාවකට ආහාර ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට අපි විරුද්ධ වෙමු.

60. එක්සත් ජාතීන්ගේ ආර්ථික දණ්ඩන කළමනාකරණය සම්බන්ධයෙන් සහස්‍ර ප්‍රකාශනයේ අන්තර්ගත වී ඇති මත අපි තවදුරටත් නැවත තහවුරු කරමු.

**- බහු පාර්ශ්විකත්වය අනාගතයයි ....... -**

61. ධරණීය සංවර්ධනය පිළිබඳ අපගේ අරමුණු ඉටුකර ගැනීමට, වැඩිදියුණු කළ හා වගකිව යුතු අන්තර්ජාතික හා බහුපාර්ශ්වික ආයතන හා සමඟ ලෝක පාලනයේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රමයක් අපහට අවශ්‍ය වේ.

62. එක්සත් ජාතීන්ගේ ප්‍රකාශ පත්‍රයේ ප්‍රතිපත්ති හා අරමුණු වලට, බහුපාර්ශ්විකත්වය ශක්තිමත් කිරීම මෙන්ම අන්තර්ජාතික නීති වලටද අප දී ඇති ප්‍රතිඥාව අපි නැවත තහවුරු කරමු. මනාලෙස පිහිටුවා ඇති බොහෝ ලෝක හා නියෝජිත සංවිධානය වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය නායකත්වය දෙමින් ඉටු කරන කාර්යයට අපි සහාය පළ කරමු.

63. ධරණීය සංවර්ධන අභිමානාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා කලින් කලට ප්‍රගතිය ඇගයීමට ද අපි බැඳී සිටිමු.

64. ධරණීය සංවර්ධනය පිළිබඳ, සහස්‍ර සංවර්ධන අරමුණු මත 21 වන න්‍යාය පත්‍රය හා ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ක්‍රමවත් මෙහෙයවීමක අවශ්‍යතාව අපි අවධාරණය කරමු.

**- එය සිදු වීමට ඉඩ හරිමු ! -**

65. ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාවට අනුව, ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ ප්‍රතිඵල ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීමට එය ඇගයීමට හා මෙහෙයවීමට අවශ්‍ය පසු - විපරම් යාන්ත්‍රණයක් ආරම්භ කිරීමට, ලෝකයේ ප්‍රමුඛතම බහුපාර්ශ්වික සංවිධානය වන එක්සත් ජාතීන්ගේ මහ සමුළුවෙන් ඉල්ලා සිටිමු.

66. මෙය ඓතිහාසික ජොහැන්නස්බර්ග් සමුළුවට සහභාගි වූ සියලුම ප්‍රධාන කණ්ඩායම් සහභාගි වූ අන්තර්ගත ක්‍රියාවලියක් විය යුතුය යන එකඟතාවයෙහි අපි සිටින්නෙමු.

67. අපේ පෘථිවි තලය ආරක්ෂා කිරීමටත් මානව සංවර්ධනය ඉහළ නැංවීමටත් සහ විශ්ව සෞභාග්‍ය හා සාමය ළඟාකර ගැනීමටත් අවශ්‍ය වන පරිදි සියලුම මට්ටම් වලින් ක්‍රියා කිරීමට අපි කැපවී සිටිමු.

68. ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් ප්‍රතිඥාව අපි සම්පූර්ණයෙන් ස්ථිර කරන අතර එහි අඩංගු දෑ ක්‍රියාත්මක කිරීමටද නියම කර ගනිමු.

69. ධරණීය සංවර්ධනය පිළිබඳ අපගේ සාමූහික බලාපොරොත්තුව ඉටුවන බව සහතික කිරීමට අප අදිටන් කරගෙන සිටින බව ලෝකයේ ජනතාවට, මානව වර්ගයාගේ තොටිල්ල වන අප්‍රිකානු මහාද්වීපයේ සිට අපි ප්‍රකාශ කර සිටින්නෙමු.

# 2002 ජොහැන්නස්බර්ග් සමුළු සමය වනවිට විමසුමට ලක් වූ පරිසර තත්ත්වයන් කිහිපයක්

## ජලය

### ගැටලුව

ඇතැම් පෙදෙස් වල පිරිසිදු ජලය පිළිබඳ ගැටලුවක් නොමැති අතර, ජල හිඟය එසේ නොමැති නම් ජල දූෂණය හේතු කොටගෙන තවත් පෙදෙස් වල එය දුර්ලභ සම්පතක් බවට පත්ව තිබේ.

ලෝක ජනගහණයෙන් බිලියන 1.1කට, එනම් 18% කට පමණ පරිසිදු පානීය ජලය ලබාගැනීමට නොහැකි වී ඇති අතර බිලියන 2.4 කට පමණ ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැත. සංවර්ධනය වෙමින් පවතින රටවල ජනගහණයෙන් විශාල පිරිසක් පිරිසිදු පානීය ජලය නොලැබීම. ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් හා යහපත් සෞඛ්‍යාරක්ෂාව නොමැතිවීම නිසා ඇතිවන රෝග වලින් සෑම වසරකම මරණයට පත්වන අතර, ඔවුන්ගෙන් බොහෝ පිරිසක් ළමයි වෙති. එසේම, එම රටවල ජනගහණයෙන් වැඩි කොටසක් දූෂිත ජලය හෝ ආහාර පරිභෝජනය සහ ජලයේ බෝවන රෝගකාරක ජීවීන් හේතු කොටගෙන සෘජු ලෙස හෝ වක්‍ර ලෙස ඇතිවන රෝග වලින් පීඩා විඳිති. පිරිසිදු පානීය ජලය හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සැපයීම මගින් ඇතැම් රෝග පැතිරයාම හා මරණ සංඛ්‍යාව 7.5% කින් පමණ පහත හෙළිය හැකිය.

ජල පද්ධති සඳහා ආයෝජනය නොකිරීම සහ ඒවා නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා පිරිසිදු පානීය ජලය සපයා ගැනීමට අසීරු වී ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල පානීය ජල සැපයුම් පද්ධති වල ජලයෙන් අඩක්ම කාන්දු වීම, නීති විරෝධී ලෙස නළ සම්බන්ධකොට ජලය ලබාගැනීම සහ ජල පද්ධති නිකරුණේ විනාශ කිරීම නිසා අපතේ යයි. සමහර රටවල, මෙවැනි ජල පද්ධති වල සම්බන්ධතාවය ලබාගෙන ඇති ධනවත් මිනිසුන්ට ජලය සහන මිලකට ලැබෙන අතර, එවැනි ජල පද්ධති හා සම්බන්ධ නොවුණු දිළිඳු ජනතාවට අධික මිලකට ජලය විකුණන පෞද්ගලික වෙළෙන්දන් කෙරෙහි හෝ අනාරක්ෂිත මාර්ග කෙරෙහි හෝ බලාපොරොත්තු තැබීමට සිදු වී ඇත.

ස්ත්‍රී - පුරුෂ භාවය ද ජලය පිළිබඳ ගැටලුවට බලපා ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල බොහෝ විට ජලය රැගෙන ඒමේ කටයුතු කිරීමට සිදුවී ඇත්තේ කාන්තාවන්ටය. සාමාන්‍යයෙන් ඔවුන්ට කිලෝග්‍රෑම් 20 ක පමණ බරක් දරාගෙන සෑම දිනකම කිලෝමීටර 6 ක පමණ දුරක් ඇවිදීමට සිදුවේ. සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම හේතු කොටගෙන බොහෝ විට පීඩාවට පත්වන්නේ කාන්තාවන් සහ ගැහැණු ළමුන්ය.

ලෝකයේ මිරිදිය ජලයෙන් වැඩි ප්‍රමාණයක් එනම් 70% ක් පමණ භාවිත කෙරෙන්නේ කෘෂිකර්මය සඳහාය. කෙසේ වෙතත් බොහෝ වාරිමාර්ග ක්‍රම අකාර්යක්ෂම තත්ත්වයක පවතින අතර, 60% ක පමණ ජල ප්‍රමාණයක් වාෂ්පීභවනය හෝ ගංගා වලට හෝ මතුපිට ජල මට්ටම් වලට නැවත ගලායෑම නිසා ජලය අපතේ යනු පමණක් නොව එමගින් දකුණු ආසියාවේ ඇතැම් ප්‍රදේශ වල ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇති එලදායී කෘෂි ඉඩම් දියබත් වීම සහ මැලේරියාව පැතිරීම වැඩි වන ලෙස ජලය පොළොව මතුපිට රඳා පැවතීම ඇතුළු පාරිසරික හා සෞඛ්‍ය අවදානම් ද ඇතිකෙරේ.

මිනිසුන් විසින් ජලය ලබා ගැනීම, ඇතැම් ප්‍රදේශ වල සැලකිය යුතු පාරිසරික බලපෑම් ඇති කිරීමටද සමත් වී ඇත. එක්සත් ජනපදයේ චීනයේ සහ ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශ වල මතුපිට ජලය නැවත පිරීමට වඩා වේගයෙන් පරිභෝජනය කෙරෙන

අතර, මතුපිට ජල මට්ටම ක්‍රමයෙන් පහත වැටෙමින් තිබේ. බටහිර එක්සත් ජනපදයේ කොළරාඩෝ, චීනයේ කහ වැනි ගංගා බොහෝ විට මුහුදට වැටීමට පෙරම වියළී යයි.

මිනිසාගේ පැවත්මට හා සංවර්ධනයට අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් ජල සැපයුම ඇතැම් අවස්ථා වලදී ගැටුම් හා ආරාවුල් වලටද මුල්වී ඇති නමුදු, ජල සම්පත බෙදාහදාගන්නා ජනතාව අතර සහයෝගීත්වය වර්ධනය ඉවත් කිරීමටද ඉවහල් වේ. පිරිසිදු ජල සැපයුම සඳහා ඉල්ලුම වැඩි වී ඇති බැවින් ජල සම්පත් කළමනාකරණය සඳහා පැවැත්වෙන සාකච්ඡා වඩාත් සුලභ කරුණක් බවට පත්ව ඇත.

**මූලික සංඛ්‍යා ලේඛන**

- ලෝකයේ 70% පමණ ප්‍රදේශයක් ජලයෙන් ආවාරණය වී තිබුණද, ඉන් මිරිදිය පවතින්නේ 2.5% ක් පමණ වූ ප්‍රදේශයක පමණි. ඉතුරු 97.5% ම කරදිය ජලය වේ. මෙම මිරිදිය ජලයෙන් 70% කට ආසන්න ප්‍රමාණයක් සදාකාලික අයිස් වශයෙන් මිදී පවතින අතර, ඉතුරු ප්‍රමාණයෙන් වැඩි කොටසක් ද පසෙහි තෙතමනය වශයෙන් පවතී. එසේත් නොමැති නම් ගැඹුරු භූගත මට්ටම් වල පවතී. මිනිසාගේ පරිභෝජනය සඳහා ලබාගත හැක්කේ, මිරිදිය ජල සම්පතෙන් 1% කටත් වඩා අඩු ප්‍රමාණයකි.

- විශේෂයෙන්ම උතුරු අප්‍රිකාවේ සහ බටහිර ආසියාවේ ජලය දුර්ලභ සම්පතක් බවට පත්ව ඇති ප්‍රදේශ බොහෝ සංඛ්‍යාවක් පවතී. ඉදිරි දශක දෙක තුළදී සංවර්ධනය වෙමින් පවතින රටවල දිනෙන් දින වැඩිවන ජනගහණය සඳහා අවශ්‍ය ආහාර ද්‍රව්‍ය වගා කිරීමට තවත් 17% ක පමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇතැයි ද, මුළු ජල පරිභෝජනය 40% කින් පමණ වැඩිවනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ජල හිඟයක් පවතින රටවලින් 1/3 කටම, මෙම ශත වර්ෂය තුළදී උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදු විය හැකි අතර, 2025 වන විට ලෝකයේ ජනගහණයෙන් 2/3 කට පමණ දැඩි ජල හිඟයක් මධ්‍යයේ ජීවත් වීමට සිදුවිය හැකිය.

- ප්‍රයෝජනයට ගත හැකි ජලය ලෝකය තුළ බෙදී පවතින්නේ ඉතාමත් විෂම ආකාරයකටය. ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් 40% ක් පමණ ශුෂ්ක හා අර්ධ ශුෂ්ක කලාපීය බිම් වන අතර, ඊට ලැබෙන්නේ ලොව මිරිදිය ජල ප්‍රමාණයෙන් 2% ක් තරම් වූ අඩු ප්‍රතිශතයකි.

- වාරි ක්‍රම මගින් ජලය සැපයෙන කෘෂිකාර්මික කටයුතු සඳහා ලබාගන්නා ජලයෙන් 70% ක් පමණ අවශ්‍ය වන අතර වියලි කලාපය සඳහා මෙම ප්‍රතිශතය 90% ක් පමණ වේ. 1960 සිට වාරිමාර්ග ක්‍රම සඳහා ජලය ලබා ගැනීම 60% කට වඩා වැඩි ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇත.

- වර්තමාන ආයෝජන අනුපාතයන් හමුවේ. ආරක්ෂිත පානීය ජලය ලබා ගැනීම සඳහා විශ්ව ප්‍රවේශය, වසර 2050 ට පෙර අප්‍රිකාව තුළද, 2025 ට පෙර ආසියාව තුළද, 2040 වන විට ලතින් ඇමෙරිකාව හා කැරිබියන් දූපත් වලද ඇතිවේ යැයි අපේක්ෂා කළ නොහැකිය. සමස්තයක් වශයෙන් ලෝක ජනගහණයෙන් 82.5% ක් ජීවත් වන මෙම කලාප තුන සඳහා 1990 දශකය තුළ පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ අවස්ථා ලද ජන සංඛ්‍යාව 72% සිට 78% දක්වා වැඩි වී ඇති අතර, සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රවේශයක් ලද සංඛ්‍යාව 42% සිට 52% දක්වා වැඩි වී ඇත.

- සංවර්ධනය වෙමින් පවතින රටවල 90% - 95% ත් අතර ප්‍රමාණයක් මිනිස් මළ ද්‍රව්‍යයත්, කර්මාන්ත වලින් පිටකරන අපද්‍රව්‍ය වලින් 70% ක පමණ ප්‍රමාණයකුත් අනාරක්ෂිත ලෙස ජලයේ එක්රැස් වන අතර එමගින් ප්‍රයෝජනයට ගත හැකි ජලය දූෂණයට ලක් වේ.

- 2000 වසරේදී නාගරික ජනගහණයෙන් 94% කට පමණ පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ අවස්ථාව ලැබී ඇති අතර ග්‍රාමීය ජනගහණයෙන් එම අවස්ථාව උදා වී ඇත්තේ 71% කට පමණි. සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ද මෙම පරතරය ඉතා වැඩිය. නාගරික ජනගහණයෙන් 85% කට පමණ ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ලැබුණද, ග්‍රාමීය ජනගහණයෙන් මනා සනීපාරක්ෂක පහසුකම් ලැබී ඇත්තේ 36% කට පමණි.

- 1990 දශකය තුළ, සංවර්ධනය වෙමින් පවතින රටවල මිලියන 835 ක පමණ ජනගහණයක් ආරක්ෂාකාරී පානීය ජලය ලබාගැනීමේ අවස්ථා උදාකරගෙන ඇති අතර, මිලියන 784 ක් පමණ සනීපාරක්ෂක පහසුකම් ලබාගෙන ඇත. නාගරික ප්‍රදේශ කරා සංක්‍රමණය වන ජන පිරිස් වැඩිවීමත් සමගම, පිරිසිදු පානීය ජලය ලබාගැනීමට නොහැකි වූ නාගරික ජන සංඛ්‍යාව මිලියන 61 කින් පමණ වැඩි වී ඇත.

## කළ යුත්තේ කුමක්ද?

2015 වන විට ලොව පුරා සිටින, පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි වී ඇති ජන සංඛ්‍යාව අඩක් දක්වා අඩු කිරීමෙන් සනීපාරක්ෂක පහසුකම් නොමැති ජන සංඛ්‍යාව අඩකින් පමණ අඩු කිරීමෙන් සහස්‍ර සංවර්ධන අරමුණ කරා ළඟාවීමට නම්, පහත කරුණු සපුරාගත යුතු වනු ඇතැයි. ආණ්ඩු අමාත්‍යවරු හා ජල විශේෂඥයෝ පිරිසිදු ජලය පිළිබඳ අන්තර්ජාතික සමුළුවේදී (ජර්මනියේ බොන් නගරය 2001 දෙසැම්බර්) තක්සේරු කළහ.

- බිලියන 1.6 ක අතිරේක පුද්ගලයන් පිරිසකට, ප්‍රමාණවත් පානීය ජල පහසුකම් සහ සේවාවන් ලබාදීමට අවශ්‍ය වනු ඇත.

- පුද්ගලයන් බිලියන 2.2 කට වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක ක්‍රම සහ සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ දැනුවත් බවක් අවශ්‍ය වනු ඇත.

- ජලය හා සම්බන්ධ සියලුම පහසුකම් සඳහා ඩොලර් බිලියන 180 ක් දක්වා පමණ වූ විශ්ව ආයෝජනයක් අවශ්‍ය වේ. වර්තමාන ආයෝජන මට්ටම ඩොලර් 70 ත් - 80 ත් අතර වේ. කෙසේ වෙතත්, ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට නම්, වසරකට ඩොලර් බිලියන 23 කට ආසන්න ප්‍රමාණයක් අවශ්‍ය වන අතර, එය වර්තමාන ආයෝජනයට (ඩොලර් බිලියන 16) වඩා සැළකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී.

පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ සහස්‍ර අරමුණ සපුරා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සඳහාත්, වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක ක්‍රම ලබා ගැනීම සඳහාත්, එවැනි අරමුණක් ඇති කරගැනීම සඳහාත් ජොහැන්නස්බර්ග් සමුළුවට ඉදිරිපත් කළයුතු යෝජනා පවතී.

ජලය හා සනීපාරක්ෂක යටිතල පහසුකම් සේවා සඳහා, තාක්ෂණය සහ දැනුම බෙදාහැරීම සඳහාත්, ශක්‍යතා වර්ධනය සඳහාත් අන්තර් ජාතික හා දේශීය මූල්‍ය සම්පත් සියලුම මට්ටම් වලින් සූදානම් කිරීමට ජොහැන්නස්බර්ග් සමුළුව සඳහා ඉදිරිපත් කෙරෙන යෝජනා පිළිබඳව සලකා බලමින් තිබේ. එවැනි යටිතල පහසුකම් හා සේවාවන් දිළිඳු ජනතාවගේ අවශ්‍යතා සපුරාලන බවත් ස්ත්‍රී - පුරුෂ සංවේදී බවත් සහතික කෙරේ. ජල සම්පත කාර්යක්ෂම ලෙස භාවිත කිරීම වැඩි දියුණු කිරීමටත් සහ මිනිසුන්ගේ වාසස්ථාන කර්මාන්ත සහ කෘෂිකාර්මික අවශ්‍යතා හා සමග පරිසර පද්ධතියේ සමෝධානික බව ආරක්ෂා කිරීමේ හෝ ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතා සමතුලිතව පවත්වාගෙන යන්නා වූ යාන්ත්‍රණ යොදා ගැනීමටත් තවත් යෝජනා පවතී.

මීට අමතරව ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාව සහ ලොවපුරා දේශපාලනික සහාය සහ ක්‍රියා මාර්ග ලබාගැනීමේ ආරම්භ කර ඇති නව අන්තර්ජාතික ව්‍යාපාරයක් වන "WASH" (සැමට ජලය සනීපාරක්ෂාව හා සෞඛ්‍යාරක්ෂාව) පිළිබඳව ද මහජන අවබෝධය තියුණු කරන්නා වූ, 2003 වසරේ පිරිසිදු ජලය සඳහා අන්තර්ජාතික වර්ෂය වශයෙන් නම් කර ඇත.

**ජලය**

- ජලය ජීවිතයට අත්‍යාවශ්‍ය සම්පතකි. ඊට ආදේශකයක් නැත.

- පෘථිවියෙන් සියයට 70 ක් වැසී ඇත්තේ ජලයෙනි. ඉන් සියයට 97.5 ක් ලවණ ජලයයි. ඉතිරි සියයට 2.5 කඨින ජලයයි. ඉන් හතරෙන් තුනක් අයිස්පර ස්වරූපයෙන් පවතී.

  බිලියන 1.1 ක් (කෝටි 110 ක්) දෙනාට, දළ වශයෙන් ලෝක ජනගහණයෙන් හයෙන් එකකට පවිත්‍ර ජලය නොලැබේ. බිලියන 2.4 ක් (කෝටි 240 ක්) දෙනාට, එනම් ලෝක ජනගහණයෙන් සියයට 40 කට ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නැත.

- දිනෙන් දිනම ලොව පුරා ජලය හිඟ වෙමින් පවතී. අප්‍රිකාවේ සහ බටහිර සහ දකුණු ආසියාවේ තත්ත්වය වඩා උග්‍රය. වසර 2025 වන විට ලෝක ජනගහණයෙන් තුනෙන් දෙකක් පමණ - බිලියන 5.5 ක් (කෝටි 550 ක්) පමණ - ජල හිඟයෙන් පීඩා විඳිනු ඇත.

- අනාරක්ෂිත ජලය සහ අසතුටුදායක සනීපාරක්ෂාව නිසා ඇති වන ලෙඩ රෝග වලින් සෑම දිනකම ළමයි 6,000 ක් පමණ මරුට බිලි වෙති. සෑම වසරකම මෙබඳු රෝග වලට ගොදුරු වන ජන සංඛ්‍යාව මිලියන 250 ක් (කෝටි 25 ක්) ඉක්මවයි.

- සංවර්ධනය වන රටවල සියලු රෝගාබාධ වලින් සියයට 80 කට හේතුව අනාරක්ෂිත ජලය සහ සනීපාරක්ෂාවයි.

- පසුගිය ශත වර්ෂයේදී ජල පරිභෝජනය හය ගුණයකින් වැඩි විය - එය ජනගහණ වර්ධන අනුපාතය මෙන් දෙගුණයකට වැඩිය.

- ජල හිඟයෙන් වඩාත් පීඩා විඳින්නේ ස්ත්‍රීහු හා ගැහැණු ළමයි වෙති. බොහෝ ගම්බද ප්‍රදේශ වල ස්ත්‍රීන්ට හා ගැහැණු ළමයින්ට ජලය සොයා සැතපුම් ගණන් ඇවිද යාමට සිදුවේ.

- මුළු මිරිදිය ජල ස්කන්ධයෙන් සියයට 70 ක් පමණ කෘෂිකර්මය සඳහා භාවිත කෙරේ. අකාර්යක්ෂම වාරික්‍රම නිසා - විශේෂයෙන් සංවර්ධනය වන රටවල ඉන් සියයට 60 ක් වාෂ්පවී යයි. නැතහොත් ගංගා වෙත හෝ භූගත ජලනිධි වෙත හෝ ආපසු ගලා යයි.

- 1960 න් පසු වාරි ජල පරිහරණය සියයට 60 කින් ඉහල ගොස් තිබේ.

- කාන්දුවීම් නීති විරෝධී ජල සම්බන්ධතා සහ නාස්තිය නිසා අපතේ යන ජල ප්‍රමාණය සංවර්ධනය වන රටවල පානය සඳහා භාවිත ජලයෙන් සියයට 50 කි.

- ප්‍රයෝජනයට ගත නොහැකි අයුරින් ජලය අපවිත්‍ර වීම වැඩි වන වේගයකින් සිදු වෙමින් පවතී. මිරිදිය පරිසර පද්ධති අතිශයින් දූෂ්‍ය වී ඇත. ලෝකයේ තෙත් බිම් වලින් අඩක් නැතිව ගොසිනි. ලොව හඳුනා ගත් මිරිදිය ජීවීන් දස දහසෙන් සියයට 20 ක් වඳ වී ගොස් ඇත.

- එක්සත් ජනපදය, චීනය සහ ඉන්දියාව වැනි රටවල භූගත ජල පරිභෝජනය ප්‍රතිපූර්ණ වේගය ඉක්මවා ගොස් ඇත - භූගත ජල මට්ටම වේගයෙන් පහත වැටෙමින් තිබේ. බටහිර ඇමෙරිකාවේ කොලරාඩෝ ගංගාව සහ චීනයේ කහ ගඟ වැනි ගංගා මුහුදට ලඟා වීමට පෙර බොහෝ විට සිඳී යයි.

- 1990 දශකයේදී සංවර්ධනය වන රටවල මිලියන 835 ක් (අසූ තුන් කෝටි පනස් ලක්ෂයක්) ජනයා ආරක්ෂිත පානීය ජල පහසුව ලැබූහ. මිලියන 784 ක් (78 කෝටි හතලිස් ලක්ෂයක්) දෙනාට සනීපාරක්ෂක පහසුකම් ලැබිණ.

- සංවර්ධනය වන රටවල ජල සැපයුම හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම පිණිස වසරකට වැය කළ යුතු මුදල ඩොලර් බිලියන 20 කි (කෝටි 2,000 කි)

- එහෙත් මේ රටවල දැනට වැය කෙරෙන්නේ වසරකට ඩොලර් බිලියන 10 ක් (කෝටි 1,000) පමණි.

- උග්‍ර වන ජල හිඟය හමුවේ ජල කළමනාකරණය වැඩි දියුණු කළ යුතු බවට පොදු එකඟත්වයක් ඇත. එය කළ යුත්තේ කෙසේද යන්න ගැන විවාදයක් පවතී. එක් මතයකට අනුව පිරිසිදු පානීය ජලය මානව අයිතියකි. එය සපුරා ලීමට රජය බැඳී සිටී. අනෙක් මතය අනුව ජලය ආර්ථික භාණ්ඩයකි. එබැවින් ජල සැපයුම වෙළෙඳ පොල යන්ත්‍රණය මගින් පාලනය කළ යුතුය. පෞද්ගලීකකරණය එහි අත්‍යාවශ්‍ය අංගයකි.

# "කෘෂිකාර්මික ඵලදායීතාව"

**ගැටලුව :-**

සෑම පුද්ගලයෙකු සඳහාම, අවශ්‍ය ආහාර ප්‍රමාණයටත් වඩා වැඩි ආහාර ප්‍රමාණයක් ලෝකයේ පවතී. එහෙත්, තමා විසින් අස්වද්දනු ලබන වගාවන් මගින් ආහාරය හා ආදායම් ලබාගන්නාවූද, එම වගාවන් විනාශ වූ කල, වෙනත් මාර්ග වලින් සිය ආහාරය සපයා ගැනීමට මුදල් නැත්තාවූ ද ජනතාව බිලියනයකටත් වඩා වැඩිය. ඇත්තෙන්ම බිලියන 1.2 ක් පමණ වූ දිළිඳු ජනගහණයෙන් 70% ක් පමණ ජීවත් වන ග්‍රාමීය ප්‍රදේශ බොහොමයක කෘෂිකාර්මික ඵලදායීතාව තීව්‍ර ලෙස පහත වැටෙමින් තිබේ. ලෝකයේ කෘෂිකාර්මික බිම් වලින් 2/3 කට පමණ එක්තරා ප්‍රමාණයකට බලපෑම් කර ඇති භූමි හායනය මීට හේතු වී ඇත.

කෘෂිකාර්මික ඵලදායීතාව පහත වැටීම නිසා බොහෝ අවස්ථා වලදී මිනිසුන් වනාන්තර, තණබිම්, සහ කෙත් බිම් අත්පත් කරගන්නා අතර, එමගින් පාරිසරික පරිහානිය හා දිළිඳු බව තව දුරටත් උග්‍ර වේ. දිළිඳු බව සහ පාරිසරික හානිය අවම කිරීමේ ධරණීය සංවර්ධන අරමුණ ඉටුකර ගැනීම සඳහා කෘෂිකාර්මික ඵලදායීතාව නැංවීම අත්‍යවශ්‍ය බව පිළිගනිමින්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් කොෆී අනාන් මහතා, ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ලබාගත හැකි සහ ලබාගත යුතු මූලික කරුණු 5 න් එකක් වශයෙන් භූමි හායනය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරන මෙන් ජොහැන්නස්බර්ග් සමුළුවෙන් ඉල්ලා ඇත.

දේශගුණ විපර්යාස, නියං සහ ගං වතුර හමුවේ ඇතිවන ප්‍රශ්න වලට අමතරව, ධරණීය නොවන අයුරින් භූමි සම්පත පරිහරණය කිරීමට සහ දිළිඳු බවට හේතුවන කරුණු ගණනාවකි. අන්ත දිළිඳු ජනතාවට ඉඩම්වල සහ තණ බිම්, ගංගා වනාන්තර ආදී ස්වාභාවික සම්පත් සම්බන්ධයෙන් භුක්තිමය ස්ථාවරත්වයක් නොමැති වීම ඉන් කීපයකි.

සංවර්ධනය වෙමින් පවතින රටවල ගොවිපොළ සම්බන්ධ ගැටලු ජාතික මට්ටමෙන් තව දුරටත් උග්‍ර වී තිබේ. නව ලාභදායී ආනයන සඳහා දොරටු විවෘත කරදී ඇති වෙළඳ නිදහස සඳහා පවතින ඉල්ලුම හේතු කොටගෙන සංවර්ධනය වෙමින් පවතින රට වලට ඔවුන්ගේ තීරු බදු අඩු කිරීමට හේතු වී ඇත. තවද අධික තීරුබදු සහ සංවර්ධිත රට වල ගොවීන්ට ලබාදෙන සහනාධාර නිසා ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන වලට, සංවර්ධිත රට වල වෙළඳ පොලේ ඇති කෘෂි නිෂ්පාදන හා තරග කිරීමට නොහැකි වී ඇත.

කෘෂිකර්ම හා ආහාර ආරක්ෂණය තිරසාර ලෙස පවත්වාගෙන යාමට පැලෑටි ජාන සම්පත් අත්‍යවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට (FAO) අනුව, මානව ඉතිහාසය පුරා, පැලෑටි විශේෂ 7000 ක් පමණ ආහාර සඳහා භාවිත කොට ඇත. එහෙත් අද අපට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය වලින් 90% ක් පමණ සපයන්නේ වගා කරන ලද බෝග විශේෂ 120 කට නොවැඩි ප්‍රමාණයකි. මීට අමතරව, 20 වන ශත වර්ෂය තුළ මෙම වගා කරන ලද බෝග විශේෂයන්ගේ ජෛවීය විවිධත්වය බොහෝ දුරට අහිමි වී ඇත.

පැලෑටි ජාන සම්පත් ආරක්ෂා කිරීම - ඒවා ධරණීය ලෙස භාවිත කිරීම සහ වාණිජ්‍යකරණය මගින් උත්පාදනය වන මූල්‍ය වාසි ඇතුළු, ඒවා භාවිත කිරීමෙන් ලැබෙන වාසි සාධාරණ හා සමාන ලෙස බෙදීයාම පිළිබඳ අවධානය යොමුකිරීම සඳහා, 2001 නොවැම්බර් මාසයේදී ආහාර හා කෘෂිකර්මය සඳහා පැලෑටි ජාන සම්පත් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම සම්මත කරගන්නා ලදී. මෙම අන්තර්ජාතික ගිවිසුම මගින්, ගොවියන්ගේ අයිතිවාසිකම් සපයනු ලබන අතර, ලෝක ආහාර ආරක්ෂණය සඳහා වැදගත් වන්නා වූ ප්‍රධාන බෝග 64 ක හා සත්ත්ව ආහාර වල ජානමය සම්පත් හුවමාරු කර ගැනීමට බහුපාර්ශ්වීය ක්‍රමයක් පිහිටවනු ලැබේ.

## මූලික සංඛ්‍යා ලේඛන

- ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් 11% ක් පමණ බෝග නිෂ්පාදනය සඳහා යොදා ගැනේ. ලතින් ඇමෙරිකාවේ, උප සහරාන් අප්‍රිකාවේ සහ නැගෙනහිර ආසියාවේ ඇතැම් රටවල කෘෂිකාර්මික බිම් ව්‍යාප්ත කරලීම සඳහා තවමත් සුළු ඉඩකඩක් පැවතියද, දකුණු ආසියාවේ, මධ්‍යධරනී මුහුදේ නැගෙනහිර වෙරළේ පිහිටි රටවල් වල සහ උතුරු අප්‍රිකාවේ මේ සඳහා අමතර ඉඩම් නැති තරමිය.

- පුද්ගලයෙකු සඳහා පවතින වගා කළ හැකි බිම් ප්‍රමාණය අඩු වෙමින් පවතී. සංවර්ධනය වෙමින් පවතින රටවල එක් පුද්ගලයෙකු සතු වගාකළ හැකි බිම් ප්‍රමාණය 1961/63 දී හෙක්ටයාර 0.32 ක් වූ අතර 1997/99 වන විට එය හෙක්ටයාර 0.21 දක්වා අඩු වී ඇත. 2030 වසරේදී එය හෙක්ටයාර 0.16 ක් දක්වා අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ලොව පුරා සිදුවන භූමි හායනයට 40% ක් පමණ හේතු වී ඇත්තේ කෘෂිකර්මය සඳහා බිම් සකස් කිරීම නිසා ඇතිවන පාංශු ඛාදනයයි.

- සංවර්ධනය වෙමින් පවතින රටවල වැඩි වශයෙන්ම ජලය භාවිත වන්නේ කෘෂිකර්මය සඳහාය. ලෝකයේ මිරිදිය ජලයෙන් 70% ක්ම පමණ කෘෂිකර්මය සඳහා යොදාගැනේ. අප්‍රිකාවේ මැද පෙරදිග රටවල් වල හා දකුණු ආසියාවේ පවතින ජලයෙන් 90% කට වැඩි ප්‍රතිශතයක් යොදා ගැනෙන්නේ කෘෂිකර්මය සඳහාය. ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානයේ රටවල් වල වැඩි වශයෙන්ම ජලය භාවිත කෙරෙනුයේ කර්මාන්ත සඳහාය.

- සංවර්ධනය වෙමින් පවතින රටවල වාරිමාර්ග සපයන ලද ඉඩම් වලින් 20% - 30% ක් පමණ ජලය පිරීම හෝ ලවණ මිශ්‍රවීම හෝ හේතු කොටගෙන විනාශ වී ඇති අතර, වාරිමාර්ග සපයන ලද ඉඩම් වලින් හෙක්ටයාර මිලියන 12 ක් පමණ නිෂ්පාදන වලින් තොරවීමට පුළුවන.

- ඇස්තමේන්තු කර ඇති පරිදි, මිලියන 250 ක පමණ ජනගහණයක් සෘජුවම කාන්තාරකරණයේ බලපෑමට හසුව ඇති අතර මිලියන 1 කට පමණ එකී අවදානම පවතී.

- කෘෂිකර්මය සඳහා පවතින රාජ්‍ය සම්පත් ද අඩු වෙමින් පවතී. 1990 දශකයේ තොරතුරු වලට අනුව කෘෂිකර්මය සඳහා රාජ්‍ය සංවර්ධන සහාය 50% කින් පමණ අඩුවී ඇත.

## කළ යුත්තේ කුමක්ද?

සාගින්නෙන් පෙලෙන ජන සංඛ්‍යාව අවම කොට ඔවුන්ට වඩාත් ඵලදායී ලෙස කටයුතු කිරීමට ඉඩ සැලසීමෙන් ඇතිවන ආර්ථික වාසි වසරකට ඩොලර් බිලියන 120 ක් පමණ වන බව ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ඇස්තමේන්තු පෙන්වා දෙයි. එම ඇස්තමේන්තු වලටම අනුව, ලෝකයේ සාගින්නෙන් පෙළෙන ජන සංඛ්‍යාව අඩකින් පමණ අඩු කිරීමට, කෘෂිකර්මය සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා වාර්ෂිකව අවශ්‍ය වන්නේ ඩොලර් බිලියන 24 ක අතිරේක රාජ්‍ය ආයෝජනයක් පමණි. සමෝධානික ඉඩම් කලමනාකරණය සහ ජල භාවිතය, වෙරළබඩ හා වනාන්තර පරිසර පද්ධති කළමනාකරණය සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ආයෝජනයන් යෙදවීමට අදහස් කෙරේ.

1992 මිහිතල සමුළුවේ ප්‍රතිඵලයක් වශයෙන්, කාන්තාරකරණයට විරෙහි වීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතිය මගින් කාන්තාරකරණයට විරෙහි ක්‍රියා මාර්ග බිහි කිරීමට අවශ්‍ය මූලාකෘතියක් සැපයේ. එහෙත් එය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අරමුදල් ලැබී නැත. එම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍යාධාර සැපයීමට විශ්ව පාරිසරික පහසුකම් ආයතනයට ඉඩ සැලසීමේ යෝජනාවක් කෙරෙහි ජොහැන්නස්බර්ග් සමුළුවේ සැළකිල්ල යොමු වෙමින් පවතී.

# ගෝලීය කරණය (දියතුරාව) හා ධරණීය සංවර්ධනය

**සුනිල් සරත් පෙරේරා**
අතිරේක ලේකම්, පරිසර හා සවාභාවික සම්පත් අමාත්‍යාංශය.

ජොහැන්නස්බර්ග් සමුළුවට රැස්වූ ලෝක නායකයෝ 1992 මිහිතල සමුළුවේදී සාකච්ඡාවට බඳුන්වූ ලෝක තත්ත්වයට වඩා පැහැදිලිවම වෙනස්වූ ලෝක තත්ත්වයක සිට අධ්‍යාපන, වෙළඳාම සහ ප්‍රාග්ධන වෙළඳපොල සීමාවන් ඉවත්කිරීම, ලොව පුරා විවිධ වූ රාජ්‍යයන් සැපයූ පහසුකම් හා ගනු ලැබූ තීරණ පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කළහ.

මෙහිදී සමාලෝචනයට පාත්‍රවූ වැදගත් කරුණු අතර ආර්ථික කටයුතු පෞද්ගලීකරණය හා කොන්දේසි ඉවත් කිරීමද ඒහා බැඳුනු ගෝලීය කරන (දියතුරු) ක්‍රියාවලියද වෙයි.

1990 දශකය බොහෝ රටවලට ගෝලීයකරණයේ (දියතුරාවේ) සහ නව තොරතුරු තාක්ෂණයේ මෙන්ම සන්නිවේදන තාක්ෂණයේද ව්‍යාප්තිය අනුව වාසි සලසා ගැනීමට හැකිවූ සමෘද්ධිමත් කාලපරිච්ඡේදයක් විය.

පසුගිය දශකය පමණ කාලය තුළ ලෝක ආර්ථික රටාවන්ගේ මෙන්ම චින්තනයේද වෙසෙස් වෙනසක් ඇති වී තිබේ.

මෙම වෙනස ඇති කිරීම සඳහා "ධරණීය සංවර්ධන සංකල්පය" මෙන්ම 21 සියවස සඳහා වන එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයද ප්‍රබල ලෙස බලපානු ලැබීය.

"ධරණීය සංවර්ධනය" පිළිබඳ විශ්ව ප්‍රකාශනය වශයෙන් සැලකෙන බ්‍රසීලයේ රියෝ නුවරදී ප්‍රකාශයට පත් පරිසරය හා සංවර්ධන පිළිබඳ රියෝ ප්‍රකාශයේ මූලධර්ම විශ්ව ව්‍යාප්ත නව සංවර්ධන ආකෘතියක් සකස් කර ගැනීමට ඉවහල් විය. සංවර්ධනය හා පරිසරය පිළිබඳ රියෝ රීතිය වශයෙන්ද මෙය හඳුන්වාදිය හැකිය.

ධරිණීය සංවර්ධනය පිළිබඳ නව දර්ශනයකට මඟ හෙළි කළේ 1972 ජුනි මස ස්ටොක්හෝම් සමුළුව බව පැහැදිලි වෙයි. ස්ටොක්හෝම් සමුළු නිර්දේශ අනුව නෝර්වේ අගමැතිනි බ්‍රෝහාර්ලට් බෘන්ට්ලන්ට්ගේ සභාපතිත්වයෙන් පත් කෙරුණු ධරණීය සංවර්ධනය සඳහා වන විශේෂ කොමිසමේ වාර්තාව 1987 වසරේදී නිකුත් කෙරුණි.

"අපේ පොදු අනාගතය" (Our Common Future) නමින් ප්‍රකාශයට පත් එම වාර්තාව අනතුරුව අන්තර්ජාතික වශයෙන් ඇති වූ වැදගත් තීරණ කෙරෙහි ප්‍රබල ලෙස බලපානු ලැබීය.

රියෝ සමුළුව වනවිට සම්ප්‍රදායික හා ගතානුගතික චින්තනයෙන් මිදී නව දෘෂ්ටි කෝණයකින් පරිසරය හා සංවර්ධනය දෙස බැලීමට මුළුමහත් ලෝක ප්‍රජාව යොමු කළේ ස්ටොක්හෝම් සමුළුව බව මේ අනුව තවදුරටත් පැහැදිලි වෙයි. ධරණීය සංවර්ධන සංකල්පයේ මුල් බිජුවට වැපිරීමට ස්ටොක්හෝම් සමුළුව හේතු වූ බව ඉතිහාසය පෙන්නුම් කරයි.

අනාගත පරම්පරාවලට ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරා ගැනීමට අවස්ථාව සලසමින් නව සංවර්ධන ක්‍රියා මාර්ගයකට යොමු කිරීම ධරණීය සංවර්ධන සංකල්පයේ මෙන්ම ඊට අනුගත 21 සියවස සඳහා වන ජගත් න්‍යාය පත්‍රයේද වෙසෙස් අරමුණවේ. **ධරණීය සංවර්ධන සංකල්පයේ අරමුණු මේ අයුරින්ද විග්‍රහ කළ හැකිය එනම්: ප්‍රතිජනනය කළ හැකි සම්පත් නවැත පුනර්ජනනය කළ හැකි මට්ටමෙන් භාවිතයට ගැනීම හා ප්‍රතිජනනය කළ නොහැකි සම්පත් භාවිතය සැලසුම් සහගතව අඩු කිරීමත් වශයෙනි.** මෙහිදී ප්‍රතිචක්‍රීය කරණය හා ප්‍රතිභාවිතය කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමුවේ. වත්මන් පරිභෝජන රටාවේ වෙනස්කම් ඇති කිරීම පිළිබඳවද ඇතැමුන් අදහස් දක්වති.

**1992 බ්‍රසීලයේ රියෝ නුවර පැවැති මිහිතල සමුළුව නව චින්තන ධාරාවක උල්පත මතු වූ අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.**

ලෝක සංග්‍රාමයකින් පසුව හෝ ප්‍රංශ විප්ලවය මෙන්ම කාර්මික විප්ලවය බඳු අවස්ථාවන්ගෙන් අනතුරුව ලෝක සමාජ ආර්ථික රටාවන්ගේ මහා විපර්යාසයන් ඇති වූ බව ඓතිහාසික සාධකවලින් පෙනී යයි. රියෝ සමුළුව හා 21 න්‍යාය පත්‍රය එවන් නිහඬ විප්ලවයක් ඇති කළ අවස්ථාවක් වශයෙන් සැලකිල්ලට ගත හැකිය.

සම්මත ඉංග්‍රීසි ශබ්ද කෝෂවලට මෙන්ම විශ්වකෝෂවලටද තවමත් පිවිස නැති අපූර්ව වචන සමුදායක් මේවන විට භාවිතයට පත්ව ඇත.

නව්‍ය සංකල්ප රාශියක් මෙම අලුත් වචන තුළ ගැබ් වෙයි. ධරණීය සංවර්ධනය (SUSTAINABLE DEVELOPMENT) පෘථිවිය උණුසුම්වීම (GLOBAL WARMING) ජෛව විවිධත්වය (Biodiversity) ගෝලීයකරණය (GLOBALIZATION) ධරණීය ආර්ථික විද්‍යාව (SUSTAINOMICS) දුඹුරුවන් පරිසර ගැටලු (BROWN ISSUES) හරිත විගණනය (GREEN AUDITING) නූතන ව්‍යවහාරයේ බහුලව භාවිතයට ගැනෙන වදන් කීපයකි.

21 වන සියවසේ න්‍යාය පත්‍රය මෙන්ම ඒ හා සම්බන්ධිත විවිධ සන්ධාන සම්මුති සමගද භාවිතයට පත් ඇතැම් වචනවල අර්ථය හා සංකල්ප රූපද තවදුරටත් පෝෂණය වෙමින් පවතී. මේ අනුව සම්මත පාරිභාෂිත වචනවලට වඩා වෙනස් ස්වරූපයක් හා ධ්වනි චිත්‍රයක් ඇතැම් සිංහල වචන වලින් මතු වෙයි. කෙසේ වුවද, ඉංග්‍රීසි වචනවලට පදානුරූප අර්ථ දැක්වීම හා වචන යෙදීම කළ යුත්තේ සුපරීක්ෂාකාරීවමය. නියත රූපය දෙන වචන භාවිතයට පත් නූනොත් නවලෝක ප්‍රවනතාවන්ගෙන් වෙන් වී අප වෙනත් මඟකට යොමුව මංමුලාවීමටද ඉඩ කඩ ඇත.

ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් සමුළුව 2002 සැප්තැම්බරයේ පැවැත්විණ. මෙම සමුළුව රියෝ මිහිතල සමුළුව පවත්වා වසර දහයක් ගෙවියන අවස්ථාවේ පැවැත්විණි. රියෝ සමුළුවේ නිර්දේශිත ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමේදී දක්නට ලැබෙන ප්‍රගතිය මෙන්ම ඌනතාව මෙහිදී සමාලෝචනයට ලක් කෙරිණි. මෙම ශත වර්ෂය සඳහා වන 21 න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යෑමේදී ගත යුතු පියවර ගැනද මෙහිදී ගැඹුරින් සලකා බලා ඇත.

ගෝලීයකරණයේ (දියතුරාවේ) හොඳ නොහොඳ මෙන්ම ඵලවිපාකද ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්නස්බර්ග් සමුළුවේදී ගැඹුරින් සාකච්ඡාවට ගැනුණි.

"ගෝලීයකරණය" යන සිංහල වචනය බොහෝ දෙනා වහරනු ලබන්නේ ග්ලෝබලයිසේෂන් (Globalization) යන ඉංග්‍රීසි වචනයෙහි අර්ථය ප්‍රකාශ කිරීම පිණිසය.

එසේ වුවද "ගෝලීයකරණය" යන වදනින් ප්‍රකාශ වන්නේ ගොමකුරුමීනියෙක් ගොම ගුලි කිරීමේ ක්‍රියාව හෝ කුඩා ළමයෙක් පැපොල් බටයකින් කරණ සබන් පෙන බුබුලු නංවන ක්‍රියාව බවටද බස් වෙසරදෙකුට තර්කයක් ගොඩනැගීමේ අවස්ථාව සැලසෙයි.

මුළුමහත් මිහිතලය පුරා ඉතා වේගයෙන් පැතිරී යන ග්ලෝබලයි සෙෂන් (GLOBALIZATION) යනුවෙන් අර්ථ නිරූපනය කෙරෙන මානව ක්‍රියාවලිය හැඳින්වීමට ගෝලීයකරණයට වඩා සුදුසු වදනක් අපේ සාහිත්‍යික සංස්කෘතිය තුළින් මතුවෙයි. පැරණි සාහිත්‍යයේ එන අලගියවන්න මුකවෙටිතුමා ලියු කෘතියක් වන සුභාෂිතයේ එන "දියතුරු" යන වදන මුළු දියතපුරා (මුළු ලෝකය පුරා) පැතිරී යන අර්ථය ගෙන දෙයි.

පබඳ කිවින් බැඳි කව්
රසෙහි විසතුරු
සබඳ විඳු දනෝ පළකෙරෙති
දියතුරු
නොමඳ රසින් දිවයුරු
පොබයයි තඹුරු
සුවඳ දිගත විහිදයි හමන
මඳ මරු

කුමාරතුංග පඬිවරයා සුභාෂිතයට සපයන විවරණයේ දියතුරු යන්න දියත "අතුරා......" යන ලෝකය පුරා අතුරන ලද තේරුම මතු කරයි.

සුභාෂිතයට විද්‍යාත්මක සංස්කරණයක් සපයන මහාචාර්ය සුචරිත ගම්ලත් ඊ. ඒ. වික්‍රමසිංහ, කේ. පී. අමරසේකර යන වියත්හු මෙම සුභාෂිත කාව්‍ය විවරණය කිරීමේදී දියතුරු වදන මේ අයුරින් අර්ථ දක්වති.

දියතුරු: දිය + අතුරු - දියතුරු (ලෝකය තුළ) පූර්ව ස්වර ලෝප සන්ධියි. දිය නම් ලොවයි, අතුරුනම් එය ඇතුළතය.

මේ අනුව ග්ලෝබලයිසේෂන් යන වචනයේ යථා රූපී අර්ථය "දිය තුරාව" යන වදනින් මතු කරගත හැකිය "දියතුරාව" නාම පදය වන අතර "දියතුරයි" ක්‍රිය පදය ලෙසද සැලකිල්ලට ගැනීම මෙහිදී වැදගත් වෙයි.

ගෝලීයකරණය විවිධ වෘත්තිකයන් විවිධ ආකාරයට විග්‍රහ කිරීමත් හෝ අර්ථ නිරූපනය කිරීමත් දක්නට ලැබේ.

දියතුරාවේ (ගෝලීයකරණයේ) බලපෑම නිසා ගෝලීකෘත මානව ප්‍රජාවක් බිහි වෙමින් පවතී.

සමහරු "දියතුරාව" ගෝලීයකරණය හඳුන්වන්නේ විවිධ ජාතීන් අතර අන්තර් සබඳතා වැඩිදියුණු කිරීමට හේතුවන විශ්වව්‍යාප්ත ප්‍රයත්නයක් වශයෙනි.

ජොහැන්නස්බර්ග් සමුළුවට පෙර සුදානම් වීමේ සමුළු ගණනාවක් පැවැත්විණි. මෙහිදී සාකච්ඡාවට භාජනය වූ කරුණ වූයේ දියුණු හා දියුණු වෙමින් පවත්නා රටවල් අතර සමාජ ආර්ථික අසමතුලිතතාවය වර්ධනය කිරීමට ගෝලීයකරණ පිටු බලයක් වූ අයුරුයි.

"දියතුරාව" (ගෝලීයකරණය) ධරණීය සංවර්ධනය සඳහා වන උපාය මාර්ගයක් වශයෙන් තවදුරටත් පවත්වාගෙන යා යුතුද යන්න ගැන ප්‍රශ්න කෙරිණි.

දියතුරු ක්‍රියාවලිය (ගෝලීයකරණය) පිළිබඳව විවාදාත්මක කරුණු මතුවන්නේ මෙමගින් සිදුවන දියතුරු සබඳතා (ගෝලීය අන්තර් සබඳතා) වැඩිදියුණු කිරීම පිළිබඳව නොවේ.

දියතුරු ක්‍රියාවලිය (ගෝලීයකරණය) පිළිබඳ මතභේදය පවතින්නේ මුළු ලෝකයම එකම පද්ධතියක් සේ සලකා ක්‍රියා කිරීමේදී මතුවන සංස්කෘතිමය ගැටලු හා අසමතුලිතතාවය පිළිබඳවය.

ගෝලීයකරණයේ වාසි හා සසඳා බලන විට එයින් ලැබෙන අවාසි වැඩි බරක් උසුලන බව පෙනී යයි.

ගෝලීකෘත දර්ශනය මුවාවෙන් මතුවන සමාජ ආර්ථික විෂමතාවන් හා වුලජන කොටස් හා ජාතීන්ට සිදුවන සමාජ අසාධාරණකම් පිළිබඳව පෙර අපර දෙදිගම සමාජ ආර්ථික විශේෂඥයෝ ප්‍රශ්න කරති.

දියතුරු (ගෝලීයකරණ) දර්ශනය ක්‍රියාවට නැගීමත් සමගම වෙළඳාම මූල්‍යමය කටයුතු - ආයෝජන ප්‍රතිපත්ති බුද්ධිමය දේපළ අයිතීන් මුදල් මාරුකිරීමේ හැකියාව ආදී විවිධ ක්ෂෙත්‍රවලට බලපාන ගෝලීය ආර්ථික රටාවක් ප්‍රතිනිර්මාණය වී ඇත.

විද්‍යාවේ හා තාක්ෂණයේ ප්‍රාතිහාර්ය පෙන්නුම් කරන පරිගණකයයි. අන්තර්ජාලය - සෙලියුලර් දුරකථනය, ෆැක්ස් යන්ත්‍රය - චන්ද්‍රිකා සන්නිවේදනය ඇතුළු අනේකවිධ මෙවලම් ගෝලීයකරණය කාර්යක්ෂම කරයි.

මෙම ආර්ථිකමය සංසිද්ධිය ශ්‍රී ලාංකික ආර්ථික විශේෂඥයෙකු වන ආචාර්ය ජයන්ත කැලේගම මෙසේ විවරණය කරයි.

"ලෝකයේ සියලු රටවල් අතර වර්ධනය වන අන්‍යොන්‍ය පරායත්ථතාව සහ වර්ධනය වන පරිමාවෙන් සහ විවිධත්වයෙන් යුතුව දේශ සීමා හරහා සිදුවන භාණ්ඩ සේවා වෙළඳම ප්‍රාග්ධන ප්‍රවාහය, තාක්ෂණ ව්‍යාප්තිය හා තොරතුරු ප්‍රවාහය මගින් සියලු රටවල ජාතික ආර්ථිකයන් තනි ලෝක වෙළඳපොලක් තුළ බද්ධවීමේ ක්‍රියාදාමය ගෝලීයකරණයෙන් අදහස් වෙයි.

ගෝලීයකරණය ඇතැම් විචාරකයන් විසින් Americaniation ලෙසද හඳුන්වනු ලැබේ.

පසුගිය දශකය තුළ දියතුරු ක්‍රියාවලිය (ගෝලීයකරණය) ශක්තිමත් කිරීමට කටයුතු කළ ආයතන රැසකි.

දෙවන ලෝක යුද්ධ සමයෙන් පසුව බිහි වූ බ්‍රෙටන්වුඩ්ස් (BRETTON WOODS) ආයතන වශයෙන් ගැනෙන ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ආයතනය, 21 න්‍යාය පත්‍රයේ පරිච්ඡේදගත කරුණුවලට ගැලපෙන පරිදි ගෝලීයකරණ ක්‍රියාවලිය ශක්තිමත් කළහ.

ලෝක වෙළඳ සංවිධානය ගෝලීයකරණයට සෘජුවම බලපාන අයුරින් තම කටයුතු වේගවත් කළ අතර ලෝක බුද්ධිමය දේපළ පිළිබඳ සංවිධානය (WIPO) වැනි අන්තර් ජාතික ආයතන ගෝලීයකරණ ප්‍රවනතාවට අනුබල වන පරිදි කටයුතු කර ඇති බවක්ද පැහැදිළි වෙයි.

පසුගිය සැප්තැම්බරයේ ජොහැන්නස්බර්ග් සමුළුව පවත්වන විට ලෝකය 1992 මිහිතල සමුළුව පැවැති තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයකට පත්ව පැවතුනි.

ලෝක නායකයෝ මෙම තත්ත්වයේ සිට ගෝලීයකරණයේ හොඳ නොහොඳ හා ඵල විපාක ගැන සාකච්ඡා කළහ.

ප්‍රාග්ධන වෙළඳපොළ සීමාවන් ඉවත් කිරීම ආර්ථික කටයුතු වඩාත් පෞද්ගලිකරණය වීම හා විවිධ බැඳීම් හා කොන්දේසි ඉවත් කිරීම වැනි එකිනෙකට අනුබද්ධ ක්‍රියාකාරකම් රාශියක් නිසා ලෝක ආර්ථික රටාවේ කැපී පෙනෙන වෙනස්කම් මේ වනවිට දක්නට ලැබෙයි.

ගෝලීයකරණ වෙනසට සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර වර්ධනය පිටු බලයක් වී ඇත.

සන්නිවේදනයේ විප්ලවකාරී වෙනස්කම් දියතුරු ආර්ථිකයේ නව ක්‍රියාවලිය හා බද්ධ වී ඇති බවක්ද පැහැදිළි වෙයි.

පරිගණකය හා චන්ද්‍රිකා තාක්ෂණය ගෝලීයකරණයේ යාන්ත්‍රික ස්වභාවය පිළිබිඹු කරයි.

දේශපාලනමය හා සංස්කෘතික ගෝලීයකරණය කෙරෙහිද අනුභාව පෑ ප්‍රබලතම යාන්ත්‍රණය සන්නිවේදනය බව පැහැදිලිය.

අනූව දශකය සියලු රටවලට හා ව්‍යාපාරවලට නව තොරතුරු තාක්ෂණයේ හා සන්නිවේදන ව්‍යාප්තියේ වාසි අත්කර දුන් සමෘද්ධිමත්ම කාල පරිච්ඡේදයයි. මෙය ගෝලීයකරණ ප්‍රවනතාවේ ක්ෂණික ආකර්ෂණීය බලපෑම සේ සැලකිය හැක.

ලෝක ආර්ථිකයේ නියමුවෙකු ලෙස කටයුතු කරණ එක්සත් ජනපදය මෙන්ම සෙසු කාර්මික රටවල්ද මෙම සමෘද්ධියේ වාර්තාගත ප්‍රතිලාභ අත්කර ගත්හ.

ඉහතකී තත්ත්වය සැලකිල්ලට ගැනීමේදී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හෙන්රි කිංසිගර් (1999 දී) විසින් ප්‍රකාශ කළ කරුණු උපුටා දැක්වීම වැදගත් වෙයි.

"ගෝලීයකරණය යනුවෙන් හඳුන්වනු ලබන දෙය සැබවින්ම එක්සත් ජනපදය සතු ආධිපත්‍ය

කාර්යභාරයට තවත් නමකි." (merica-nization)

දියතුරාව (ගෝලීයකරණය) සුඛිත මුදිත ලෝකයක් තැනීමට උපකාරවේද? නොඑසේනම් දුප්පත් රටවල් හා පොහොසත් රටවල් අතර අන්තරය වඩාත් පුළුල් කෙරෙන ක්‍රියාදාමයක්වේද යන්න ජොහැන්නස්බර්ග් සමුළුවට පූර්වගාමීව පැවති සමුළුවලදී පවා විවාදයට ලක් වූ කරුණකි.

තාක්ෂණය අතින් දියුණුවට පත් රටවල් සංවර්ධනය වෙමින් පවත්නා රටවල දුප්පත්කම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන බවක් පළ වෙයි.

ගෝලීයකරණය දේශීය සංස්කෘතිය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිකරන බවත් මෙමගින් සාරධර්මවලටද අභියෝග එල්ලවන බවටත් දැඩි විවේචන මතු වෙයි.

**ජෛව විවිධත්ව ගිවිසුමට අනුව ජෛව විවිධත්වය සුරැකීම සඳහා සංස්කෘතික විවිධත්වයේ ඇති වැදගත්කම වඩාත් පැහැදිළි වෙයි.**

ගෝලීයකරණ ආකෘතිය තුළ වර්ධනය වන විශ්ව සංස්කෘතිය විවේචනයට ලක් වෙයි. ගෝලීය කරණයට දාර්ශනික පදනමක් සොයන තාර්කිකයෝ ගෝලීයකරණය අනුව සංස්කෘතියට වන අහිතකර බලපෑම් පිළිබඳ ප්‍රශ්න කිරීම්වලදී නිරුත්තර වෙති.

පශ්චාත් නව්‍යවාදය වැනි ගැඹුරු දාර්ශනික විචාර වාදයන්ද ගෝලීයකරණ පරිවර්තනයන් හේතුකොට මතුවූ බව කිව හැකිය.

පරිගණක මෙවලම් භාවිතය නිසා ලෝකය පුරා ඥාන නිෂ්පාදනයෙහි සීඝ්‍ර වෙනසක් ඇතිවුණි.

ඥානය පරිභෝගික භාණ්ඩයක් බවට පත් වී ඇති ආකාරයද විමසුමට පාත්‍රවිය යුත්තකි.

කෙසේ වුවද ගෝලීයකරණයේ විඥානමය පරිවර්තනය ජොහැන්නස්බර්ග් සමුළුව පැවති අවස්ථාව වනවිටත් ගැඹුරින් විමර්ශනයට පාත්‍ර නොවුණි.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආණ්ඩුවලට ගෝලීයකරණ ක්‍රියාවලියේදී සංවර්ධිත රටවලට මෙන් අධික වියහියදම් දැරීම කළ නොහැක්කකි. මෙය ගෝලීය කරණ දියතුරුකරණ අභියෝග ජය ගැනීමේදී එම රටවල් මුහුණපාන අභියෝගයකි. දියතුරාව (ගෝලීයකරණය) හා ධරණීය සංවර්ධන ප්‍රගතිය මැනීමේදී දේශානුරූපී කළමනාකරණ ක්‍රමවේදයක් දියුණුවන රටවල් හඳුනා ගත යුතු වෙයි. මෙහිදී ආර්ථික කරුණු මෙන්ම සංස්කෘතික කරුණුද එකසේ සැලකිල්ලට ගත යුතුය.

දියතුරාව - ගෝලීයකරණය කෝටි සංඛ්‍යාත ජනකායක් අතරමං කර ඇතැයි ලෝක බැංකුවම වරෙක පිළිගෙන ඇත.

එක්සත් ජාතීන්ගේ අධ්‍යයනයන්ගෙන් දියතුරු ක්‍රියාවලිය තුළ (ගෝලීයකරණය තුළ) ලෝකයේ ඇති වී තිබෙන සමාජ ආර්ථික අසමතුලිතතාවය මනාව පිළිබිඹු කරයි.

එක්සත් ජාතීන්ගේ එක් අධ්‍යයනයක තොරතුරු අනුව ලෝකයේ මුළු දළ ජාතික නිෂ්පාදිතයෙන් උතුරේ ධනවත් රටවල වෙසෙන ලෝක ජනගහනයෙන් සියයට 20 ක් වන පිරිසකට හිමි කොටස 82.7 කි. ආදායම් මට්ටමේ පහළම සිටි සියයට 20 ට හිමි කොටස සියයට 1 ක් පමණි.

මේ අනුව පළමු ලෝකය අත්කර ගත් සංවර්ධන මට්ටම තුන්වෙනි ලෝකය ගෙන ඒමට ගෝලීයකරණය අසමත් වූ බවත් පැහැදිලි කෙරෙයි.

ලෝකයේ ධනවත් රටවල් හා දිළිඳු රටවල් අතර පවත්නා ආදායම් පරතරයද මෙහිදී විමසුමට ලක් විය යුතුය. 1820 දී 3:1 වූ ලොව ධනවත්ම සහ දිළිඳු රටවල් අතර ආදායම් පරතරය වසර 2000 වන විට 74:1 වී ඇත.

නූතන ගෝලීයකරණයේ කිසියම් තැනක බරපතල වරදක් ඇති බව ලෝක බැංකු සභාපති ජේම්ස් වුල්ෆන්සන්ම අවධාරණය කරයි.

මේ අතර ගෝලීයකරණයේ විසල් මෙහෙවර ඉටුකරණ ආයතන ලෙස සැලකෙන ලෝක බැංකුව අන්තර් ජාතික මූල්‍ය අරමුදල සහ ලෝක වෙළඳ සංවිධානය වැනි ආයතන දුර්වල කිරීම හෝ තහනම් කිරීමේ අවශ්‍යතාව ගැන පවා ඇතැම්හු තර්ක කරති.

ධරණීය සංවර්ධනයේ නාමයෙන් සිදුකරණ ගෝලීයකරණය මනා ලෙස කළමනාකරණය වන බවට වග බලා ගැනීමේ අවශ්‍යතාව ජොහැන්නස්බර්ග් සමුළුව වනවිට වඩාත් හුවා දැක්වුණු කරුණ විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් වරයාම 21 වන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සිය වාර්තාවේම මේ බව පෙන්වා දී ඇත.

සියලු රටවල ධරණීය සංවර්ධන හා ආර්ථික වර්ධන වේගය වැඩිදියුණු කිරීමේදී මෙන්ම එහි ඵල ප්‍රයෝජන බෙදා හදා ගැනීමේදී ගෝලීයකරණය මනා ලෙස කළමනාකරණය කළ යුතු බවට සහතික වීමක් අවශ්‍ය යැයි එක්සත් ජාතීන්ගේ සංවිධාන මහ ලේකම්වරයා සිය වාර්තාවේ උද්ධෘත කොට දක්වයි.

ගෝලීයකරණය මනාව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවට අනුගත යෝජනා රාශියක් ජොහැන්නස් බර්ග් සමුළුවේදී ගැඹුරින්ම සාකච්ඡා කෙරිණි.

ගෝලීය ආර්ථිකයේ සිදුවන දැවැන්ත වර්ධනය මිහිපිට දිළින්දන්ට වාසිදායක වනු දැකීමේ අවශ්‍යතාව ජොහැන්නස්බර්ග් සමුළුවේදීද ප්‍රතිරාව නැගුණි.

2050 වනවිට ට්‍රිලියන 140 දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත ලොවපුරා භාණ්ඩ හා සේවා නිෂ්පාදන පරිමාව, ලොව සියලු ජාතීන්ට හා පුද්ගලයනට එකසේ නව අවස්ථා සලසන්නක් වනු දැක්ම ජොහැන්නස්බර්ග් සමුළුවේදී අපේක්ෂාව වෙයි.

# ගෝලීය ජෛව විවිධත්වය. 1992 - 2002

## "ඇමසන් වන පෙතෙන් ....... සවානා බිම් කඩට"

**ගාමිණී ගමගේ**
අධ්‍යක්ෂ (ජෛවවිවිධත්ව)

ඉතා සරළව මිහිමත ජිවින්ගේ වෙනස පදනම් කොට ගොඩ නැගුන ජිව විද්‍යාත්මක විවිධත්වය පසු කලෙක භාවිතය ඇතුලූ විවිධ මාන එකතුවී 1990 දශකයේ මුල් භාගය වන විට "ජෛව විවිධත්වය" යන සංකල්පය ලෙස ලොව ප්‍රචලිත විය. ශ්‍රී ලංකාව ඇතුලූ විශේෂයෙන් පෙරදිග ජාතීන් විසින් මෙම සංකල්පය තුළවූ හරය සියවසර ගණනාවක් තුළ දැන සිටි අතර ඒ හා සම්බන්ධ නොයෙකුත් දෑ ක්‍රියාත්මක කර තිබූ නමුත් 1992 දී නව සංකල්පයක් ආකාරයෙන් අන්තර් ජාතික සම්මුතියක් ලෙස මිහිතල සමුලුවේදී එලිදක්නා ලදී.

එතෙක්කල් ජෛව විවිධත්වයට අදාල ක්‍රියාවලින් රාශියක් ගෝලිය හා දේශිය වශයෙන් විවිධ අන්තර් ජාතික සම්මුතින් මගින් වෙන වෙනම සම්බන්ධීකරණය කර තිබූ අතර සමස්තයක් වශයෙන් එක් කෙන්ද්‍රස්ථානයක් තුළ සම්බන්ධීකරණය කිරීම හා අදාල කාර්‍යයන් සමෝධානිකව ක්‍රියාත්මක කිරීම මෙම සම්මුතිය මගින් සිදුවූ එක් ප්‍රධාන වැදගත් මෙහෙයක් විය.

1992 මිහිතල සමුලුවෙන් පසු ජෛව විවිධත්වය පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (1992), නීතිමය බැඳීමක් නොමැති වනාන්තර පිළිබඳ ප්‍රතිපත්ති සමුදාය (1992), සම්මුතිය යටතේ පිහිටුවාලූ ජෛව සුරක්ෂිතව සන්ධානය (1999), ඇතුලූ ගෝලිය මට්ටමින් ගැනෙන විවිධ සංරක්ෂන උපාය මාර්ග, ක්‍රියාකාරී සැලසුම් හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ ආදිය බොහෝ ගණනක් 90 දශකය තුළ විවිධ ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඇත.

90 දශකයට පෙර ජෛව විවිධත්වයෙන් පොහොසත් තුන්වැනි ලෝකයේ දිළිඳු රටවල් වලින් සංවර්ධන රටවල් රැගෙන ගිය ජාන සම්පත්වල අයිතිය, ලෝක වෙළඳාම තුළ නිවර්තන වැසි වනාන්තරවල අනාගත ඉරනම ආදී වැදගත් කරුණු රාශියක් තව දුරටත් තීරණය නොකළ තත්ත්වයක් තුළ ගෝලිය ජෛව විවිධත්ව හානිය මෙම ග්‍රහ ලෝකයේ ජිවය පැවත්ම සඳහා අවශ්‍ය අවම මට්ටම දක්වා අඩුකළ හැකිදැයි සැක සහිතය.

තාක්ෂණය, වඳවීගිය ඩයිනොසරයන් නැවත පන ගැන්වීමට හැකි මට්ටමකට පැමිණ ඇතත් ඒවා තෙවන ලොව රටවලට පැවරීමක් සිදුවී නොමැති තත්ත්වය තුළ ජගත් මට්ටමින් සම්මත කර ගත් සම්මුති සංධානවල අරමුණු ඉටු කිරීම අද අභියෝගයට ලක්වී ඇත.

ධරණීය සංවර්ධන සංකල්පය, 1992 රියෝ ද ජෙනෙයිරෝ නගරයේ සිට 2002 වන විට ජොහැන්නස්බර්ග් නගරයට සංක්‍රමනය වීම ජෛව විවිධත්ව සංරක්ෂණ මුහුනුවරින් එය ජෛව විවිධත්ව අතින් ඉතා පොහොසත් බ්‍රසීලයේ ඇමසන් වනාන්තරයේ සිට සාපේක්ෂව ජෛව විවිධත්වයෙන් හීන දකුණු අප්‍රිකාවේ සවානා බිම් කඩකට සේන්දු වූ ආකාරය විදහා දක්වයි. ඉහතකී සම්මුති, සන්ධාන හා අදාල ක්‍රියාදාමයන් නොතිබුනේ නම් මෙම සෙන්දුවීම සිදුවන්නේ ජෛව විවිධත්වයන් ඉතා හීන කාන්තාර බිමකට බව පිළිගැනේ. පසුගිය දසකයේ ජගත් මට්ටමින් ජෛව විවිධත්ව සංරක්ෂනය හා තිරසාර භාවිතය උදෙසා සිදුකරන ලද කාර්‍යභාරය ඉතා සැකෙවින් ඉදිරිපත් කිරීම මෙම වාර්තාවෙන් බලාපොරොත්තුවේ.

ජෛව විවිධත්වයෝ හදවත ලෙස ගැනෙන ලෝකයේ වැසි වනාන්තර කැබලිවීම හා විනාශවීම තව දුරටත් දරාගත හැකි මට්ටම අභිබවා ගොස් ඇත. 2010

වන විට වැසි වනාන්තර විනාශ කිරීම සම්පූර්ණයෙන්ම නවතා දැමීමට හෝ අවම මට්ටමක පවත්වා ගෙන යෑම සඳහා ජෛව විවිධත්ව සම්මුතිය තුළින් ඇතිකර ගැනීමට සැලසුම් කළ ඒකඟතාවය පාර්ශවකාරී රාජ්‍යයන් ගේ පූර්ණ අනුමැතිය නොමැති නිසා ක්‍රියාත්මක කිරීම අපහසුවී ඇත. මෙම කාරණය පිළිබඳ ශ්‍රී ලංකාව දක්වා ඇත්තේ ඉතා යහපත් ප්‍රතිචාරයකි. 90 දශකයේ මුල් භාගයේදීම ඇතිකර ගත් ජාතික ඒකඟතාවයන් මත ස්වභාවික වනාන්තර කපා, හෙළීම සම්පූර්ණ වශයෙන්ම නවතාදමා ඇති අතර මෙම දශකයේ සිට වනභායන වේගයද පෙර තිබූ මට්ටමට වඩා අඩුවී ඇතිබවද දක්නට ලැබේ.

ජෛව විවිධත්වයේ සිඝ්‍ර හානිය, මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා ගොඩනගා ගත් දරුණු ඉරනමක් ලෙස හා ස්වභාවික හේතුන් මත ඇතිවන එල්නිනෝ සංසිද්ධිය මගින් තවරනය වූ ගෝලීය දේශ ගැන විපර්යාස පසුගිය දශකය තුළ ජෛව විවිධත්වයට ඉතා හානිකර ලෙස බලපා ඇත. විශේෂ යෙන්ම ලොව පුරා (ඉන්දුනිසියාව, ඕස්ට්‍රේලියාව වැනි රටවල් ප්‍රමුඛ) ලැව්ගිනි පැතිරීම් මගින් වනාන්තර හා තෙත්බිම් ජෛව විවිධත්වයටද, මුහුදු ජල උෂ්නත්වය ඉහල යෑම නිසා කොරල්පර විරංජනය වීම නිසා සමුද්‍ර ජෛව විවිධත්වයට බරපතල හානි සිදුවී ඇත. ජෛව විවිධත්ව සම්මුතිය යටතේ ස්ථාපිත සමුද්‍ර ජෛව විවිධත්වය පිළිබඳ ජකාර්තා ප්‍රකාශනය හා සම්බන්ධිත ක්‍රියා මාර්ග තුළින් සමුද්‍ර ජෛව විවිධත්ව හානිය අඩු කිරීමට හා හානිවූ පරිසර පද්දති ප්‍රකෘතිමත් කිරීමට මනා පිටුවහලක් ලැබී ඇත.

ශ්‍රී ලංකාවේ කොරල්පර ගැන සලකාබලන විට ඒවායින් 50%කට අසන්න ප්‍රමාණයක් ඉහතකී සංසිද්ධියේ ප්‍රතිඵලයක් ලෙස විරංජනයවී ඇති නමුත් විරංජනයට භාජනය වූ කොරල් විශේෂ සජීවී අකාරයෙන් පැවතෙන සොයාබැලීම හා ඒවායින් කොරල්පර පුනර්ජනනය කිරීම පිළිබඳ පර්යේෂණ සිදුවෙමින් පැවතීම නිසා මෙම ජීවී විශේෂවල දිගුකාලින පැවත්ම සහතික කිරීම සඳහා බලාපොරොත්තු ඇති කරන සුලුය.

පසළොස්වන සියවසේ සිට විහිදී ගිය විවිධ ජාතින් විසින් වෙනත් ජාතින් හා රටවල් ආක්‍රමණය කිරීම තරමටම වැදගත් වූ මෑතකාලීන සංසිද්ධියකි විවිධ ආගන්තුක ජීවීන් විසින් වෙනත් ස්වභාවික පරිසර අක්‍රමණය කිරීම, ගමනාගමන හා ද්‍රව්‍ය හුවමාරුව දියුණු වීමත් සමගම ආක්‍රමනකාරී ආගන්තුක ජීවී ගැටළුව ගෝලීය ජෛව විවිධත්වයේ දෙවන විශාලම තර්ජනය බවට මෙම දශකය මුලදී වරම්ලබා ගෙන ඇත. ඕස්ට්‍රේලියාව, තායිලන්තය අදී රටවල් යොද නිදිකුම්බා නිසද, ඉන්දියාව ආදී රටවල් පාතෙනියම් නිසාද සියලුම නිවර්තන රටවල් සැල්විනියා, ජබන් ජබර ආදිය නිසාද පීඩාවට පත්වී ඇත. මෙම ආක්‍රමනකාරී ජීවීන් පාලනය කිරීම සඳහා මේවන විටත් බොහෝ රටවල් මහා ධනස්කන්දයක් වියදම් කරමින් සිටියි. දූපතක් වශයෙන් පිහිටීම වැනි සාධක නිසා ශ්‍රී ලංකාවද මෙම අර්බුදයට පහසුවෙන් මැදිහත්වූ අතර ඉහත කී සියලුම ආක්‍රමනකාරී පැලෑටි වලින්ද වෙනත් ආක්‍රමනකාරී සත්වයින්ගෙන්ද පිඩා විඳීමට පටන්ගෙන ඇත. ජෛව විවිධත්ව සම්මුතියෙන් '8h,' වගන්තියට අනුව මෙම ජීවීන් සමූලඝාතනය කිරීම හෝ පාලනය කිරීම පාර්ශවකාර රාජ්‍යවල යුතු කමක් ලෙස සලකන අතර ලොව පුරා ජෛව පාලනක්‍රම ඇතිකිරීමේ කාර්‍යයන්, ධාරිතා වර්ධනය හා සෘජු ක්‍රියාත්මක කිරීම (ආක්‍රමනකාරී ජීවීන් පාලනය පිණිස) සඳහා ජගත් පාරිසරික පහසුකම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම මෙම ගැටලුව මග හැරීම පිණිස සිදුකරන වටිනා මෙහෙවරක් බව පෙන්වා දිය හැකිය.

නීත්‍යානු කූල නොවන අකාරයට තම ජාන සම්පත් වෙනත් රටවලට රැගෙනයෑම, හා එහි නිපැයුම් සඳහා අයිතිවාසිකම් බලපත්‍ර ලබා ගැනීම ආදිය නිසා සිදුවන ජාන මංකොල්ලය විශේෂයෙන් ජෛව විවිධත්වයෙන් පොහොසත් තුන්වන ලෝකයේ රටවලට බලපාන ප්‍රධාන ප්‍රශ්නයක් වී ඇත. මෙම තත්ත්වය වැලැක්වීමට තම රටවල නීති රීති ප්‍රමාණවත් නොවීම, රට වැසියාගේ මේ සම්බන්ධව ඇති දැනුම අඩුකම හා ආකල්ප වර්ධනය නොවීම හා බහු ජාතික සමාගම්වල හා සමහර සංවර්ධිත රටවල විවිධ ක්‍රියාකලාපයන් තුළ තුන්වන ලෝකයේ රටවල් බැඳ තැබීම ආදී සාධක නිසා මෙම ජාන මංකොල්ලය නිසා තුන්වන ලෝකයේ රටවලට සිදුවන ආර්ථික අවාසිය ඩොලර් මිලියන ගණනකින්වත් ගණනය කල නොහැක.

මෙම තත්ත්වය මග හැරීම සඳහා දේශීය අණ පනත්වලට අදාල මාර්ගෝපදේශ (ජාන සම්පත්වලට ප්‍රවේශවීම පිළිබඳ "බොන්" මාර්ගෝපදේශ) සකස් කිරීම, අවශ්‍ය තාක්ෂනික පැවරුම හා ධාරිතාවර්ධනය ආදිය පිළිබඳ වැඩසටහන් මේවන විට ජෛව විවිධත්ව සම්මුතිය තුළින් ක්‍රියාත්මක උවද, ගෝලීය වශයෙන් මෙම තත්ත්වය මැඩ පවත්වා ගත නොහැකිවීම විශේෂ යෙන්ම මූල්‍යමය සාදක මත පදනම් වූ බහු ජාතික සමාගම්වල හා සමහර සංවර්ධිත රටවල ක්‍රියාකලාපය නිසා සිදුවන බව පෙන්වාදිය හැකිය.

නවීන ජෛව තාක්ෂණික මේවලම මිනිසාගේ වර්තමාන අවශ්‍යතා සැපිරීම සඳහා අවශ්‍ය එක් ප්‍රධාන අංගයක් බව දැනට පිළිගෙන ඇත. විශේෂයෙන්ම ආහාර නිෂ්පාදනය මත පදනම් වූ ආහාර සුරක්ෂිත තාවය, ඖෂධ නිෂ්පාදනය ආදිය සඳහා අද ජෛව තාක්ෂනය බහුල ලෙස භාවිතා කරයි. පාලනයකින් තොරව යොදා ගන්නා ජෛව තාක්ෂනයේ අහිතකර ප්‍රතිඵල සමහරක් දැනටමත් අත්කරගෙන ඇති නිසා

වසර 1999 දී ජෛව විවිධත්ව සම්මුතිය යටතේ ජෛව සුරක්ෂිතා සංධානය පිහිටුවා ගන්නා ලදී. ශ්‍රී ලංකාවද දැනටමත් මෙම සංධානයට අත්සන් කර ඇත.

1992 ප්‍රකාශිත රියෝ ප්‍රකාශනයේ 15 වන වගන්තිය අනුව යම් රාජ්‍යයකට තම රටේ පරිසර හානියන් වලක්වා ගැනීමට පූර්ව ආරක්ෂාකාරී මූල ධර්ම යොදාගැනීමේ අයිතිය ඇත. මෙම අයිතිය පදනම් කර පිහිටුවාලූ ජෛව සුරක්ෂිත සංධානය තවමත් පූර්න වශයෙන් ක්‍රියාත්මක නොවීම (සංධානය මේවන තෙක් අන්තර්ජාතික නීතියක් බවට පත්වී නොමැත.) තුළ තුන්වන ලෝකයේ රටවලට ජාන තාක්ෂනය මගින් නිපදවන ජාන වෙනස් කල ජීවීන් (විකරනය කළ ජීවීන්) ගේ හා එම ජීවීන් යොදා සිදුකරන නිපැයුම්වල අහිතකර තත්ත්ව පාලනය කරගත නොහැකි මට්ටමකට පත්ව ඇත. ජාන වෙනස්කල ජීවීන් යොදා කරන නිෂ්පාදන විශේෂයෙන් ආහාර පාන නිසා ඇතිවන ගැටලු නිරාකරනය පිණිස අවශ්‍ය තොරතුරු හා පර්යේෂන පහසුකම් තුන්වන ලෝකයේ රටවලට තවමත් ආගන්තුක බැවින්ද, විවිධ සමාජ අර්ථික කරුණු මත මෙම රටවල් ජාන තාක්ෂනික යෝදයින් ලෙස ගැනෙන සමහර සංවර්ධිත රටවල් සමග බැඳී පවතින බැවින්ද, මෙම ගැටලුව අවම කිරීම 90 දශකයේදී අපහසු කාරනයක් වී තිබුණි.

ශ්‍රී ලංකාවද දැනට මෙම සංධානයට අත්සන් කර ඇති අතර ජාතික ජෛව සුරක්ෂිතතාවට අවශ්‍ය මූලික රාමුව පිළියෙල කරමින් සිටියි.

ඉහත කරුණු සියල්ලම කැටිකොට ගත්කල රියෝද ජෙනෙයිරෝ සමුලුවේ (1992) සිට ජොහැන්නස්බර්ග් සමුලුව (2002) දක්වා පැමිණි ගමනේදී ගෝලීය ජෛව විවිධත්වය උදෙසා ජෛව විවිධත්ව සම්මුතිය හරහා සිදුකළ කාර්යයභාරය අවතක්සේරුවකට ලක්කල නොහැකි නමුත් පවතින ගෝලීය දේශපාලන, සමාජ, අර්ථික ප්‍රපංචයන් තුළ ජෛව විවිධත්වයට සිදුවන හානිය අවශ්‍ය අවම මට්ටම දක්වා අඩු කිරීම කළ නොහැකි තත්ත්වයක පවතියි. සම්මුතියෙන් තොරව රියෝ - ජොහැන්නස්බර්ග් ගමනක් රහිතව ගෝලීය ජෛව විවිධත්වයට සිදුවිය හැකිව තිබූ හානිය හා සසඳාබලන කළ වර්තමාන ප්‍රවනතාවය මිහිතලයේ පැවත්ම සඳහා අවම අඩිතාලම ලෙස ප්‍රකාශකල හැකිය. මේ නිසා ගෝලීය ජෛව විවිධත්වය ඇමසන් වනාන්තරයේ සිට සවානා බිම්කඩකට සම්ප්‍රාප්ත වූ දස වසක් ලෙස 1992 - 2002 හැඳින්විය හැකිය.